# නිවනේ නිවීම

## පළමු වෙළුම



කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

## ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරයේ

# පොදු පුණ්‍යානුමෝදනාව

"මහණෙනි, ආමිස දානයය, ධර්ම දානයය, යන මේ දන් දෙකෙකි. මේ දන් දෙක අතුරෙන් **මෙයම අග්‍රය - එනම්, ධර්ම දානය.**"

මේ අසිරිමත් බුදුවදන අගය කරන බොහෝ පාඨකයින් තම පරලෝ සැපත් මවුපියාදී ඥාතීන්ට කෘතගුණපූර්වකව පින් අනුමෝදන් කරවීමේ චිරාගත චාරිත්‍රයට අනුව ලොකු කුඩා පරිත්‍යාග පිරිනමන බැවින් දෙස් - විදෙස් වැසි ගිහි - පැවිදි දහම් පිපාසිත විශාල පිරිසකට අමිල දහම් අමාපැන් නොමිලයේ බෙදාදෙන **ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය** පුණ්‍යානුමෝදනා වශයෙන් එම ධර්ම දානමය කුශලය එකී පින්වතුන්ට හා ඥාතීන්ටත් මෙම 'අමාගඟ' නොසිඳී ගලායාමට නිරතුරුව කාලය, ධනය, ශ්‍රමය වැයකරන සැමටත් පරම ශාන්ත උතුම් අමාමහ නිවනින් සැනසීමට උපනිශ්‍රය සම්පතක්ම වේවායි පතන බව දන්වා සිටිමු.

මෙයට,

සසුන් ලැදි

ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය.

# නිවනේ නිවීම

## ( දෙසුම් පෙළකි )

පළමු වෙළුම - පස්වන මුද්‍රණය

(1,2,3 දෙසුම්)

ISBN 955-8832-04-9

කටුකුරුන්දේ ඤාණනන්ද හිමි

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය

'පහන් කණුව'

කන්දේගෙදර,

දේවාලේගම.

2007

ප්‍රකාශනය

ධර්මග්‍රන්ථ මුද්‍රණ භාරය

මහාභාරකාර දෙපාර්තමේන්තුව

ධම්මදානයකි

මුදලට විකිණීම සඳහා තහනම් වෙයි.

ප්‍රථම මුද්‍රණය - 1997 ජුලි
දෙවන මුද්‍රණය - 1999 මාර්තු
තෙවන මුද්‍රණය - 2000 ජුනි
සිවුවන මුද්‍රණය - 2003 ඔක්තෝබර
පස්වන මුද්‍රණය - 2007 ජනවාරි

## පොත ලබාගත හැකි ස්ථාන

. පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව' කන්දේගෙදර, දේවාලේගම.

. රෝයල් ඉන්ස්ටිටියුට්,
191, හැව්ලොක් පාර,
කොළඹ 5.

. ඩී. ටී. වේරගල මහතා
422, වැලිපාර, තලවතුගොඩ.

. අනුර රූපසිංහ මහතා
අංක 27, කොළඹ වීදිය, මහනුවර.

5. මහා භාරකාර දෙපාර්තමේන්තුව
2, බුලර්ස් පටුමග,
කොළඹ 07.

මුද්‍රණය
තොලිව් ප්‍රින්ටර්ස්
17/2, පැඟිරිවත්ත පාර, ගංගොඩවිල,
නුගේගොඩ.
ටෙලි : 011-4302312

මෙම දේශනාමාලාව පැවැත්වීමට ආරාධනාකොට

අප ධෛර්යවත් කළ

මීතිරිගල නිස්සරණ වන සේනාසනාධිපතිව වැඩවිසූ

අපවත් වී වදාළ

අතිපූජනීය, මහෝපාධ්‍යාය

**මාතර ශ්‍රී ඥානාරාමාභිධාන**

අප ගුරුදේවයන් වහන්සේගේ ශ්‍රී නාමයට

**'නිවනේ නිවීම'**

පූජෝපහාරයක්ම වේවා!

එතං සන්තං

එතං පණීතං

යදිදං

සබ්බ සංඛාර සමථො

සබ්බූපධිපටිනිස්සග්ගො

තණ්හක්ඛයො

විරාගො

නිරොධො

නිබ්බානං

"මෙය ශාන්තය

මෙය ප්‍රණීතය

එනම්

සියලු සංස්කාරයන්ගේ සංසිඳීම

සියලු උපධීන් අත්හැර දැමීම

තණ්හාව ක්ෂය කිරීම

නොඇල්ම නම්වූ විරාගය

නැවැත්ම නම් වූ නිරෝධය

නිවීම නම් වූ නිබ්බානය"

# පටුන


| | පිටු |
|---|---|
| හැඳින්වීම | vi |
| ප්‍රකාශක නිවේදනය | x |
| ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පළකැරෙන ග්‍රන්ථ මුද්‍රණයට දායකවීම | xi |
| අමාගඟ | xiii |
| ග්‍රන්ථ සංකේත නිරූපණය | xiv |
| 1 වන දේශනය | 1 |
| 2 වන දේශනය | 21 |
| 3 වන දේශනය | 43 |

# හැඳින්වීම

බුද්ධ දේශනාවෙහි දැක්වෙන ප්‍රතිපත්ති මාර්ගයේ අවසාන පරමාර්ථය වන 'නිවන' පිළිබඳව අතීතයේ පටන්ම විවිධ මතිමතාන්තර ප්‍රකාශයට පත් වී ඇත. ආර්ය අෂ්ටාංගික මාර්ගය 'සම්මා දිට්ඨි' නම් වූ 'හරි දැක්ම' පෙරටු කරගත් ප්‍රතිපදාවකි. එබැවින් ඒ මාර්ගයෙහි ගමන් කරන්නෙකුට ගමනෙහි ඉලක්කය ගැන නිරවුල් අවබෝධයක් ඇතිවිය යුතුමය. බුද්ධ වචනයට අනුකූලව එවැනි අවබෝධයකට මඟ හෙළි කිරීම මෙම දේශනා මාලාවේ පරමාර්ථය විය.

මීතිරිගල නිස්සරණ වන සෙනසුනෙහි ප්‍රධාන කර්මස්ථානාචාර්යයන් වහන්සේ වශයෙන් වැඩ විසූ, අපවත් වී වදාළ අතිපූජනීය මහෝපාධ්‍යාය මාතර ශ්‍රී ඥානාරාම මාහිමිපාණන් වහන්සේ විසින් අප වෙත කරන ලද සමාරාධනය මේ දේශනා පෙළට ආසන්න නිමිත්ත විය. අපගේ ගුරුදේවයන් වහන්සේ වූ උන්වහන්සේ, මෙයට වසර කීපයකට පෙර නිස්සරණ වන යෝගාවචර සඟ පිරිසට ඉදිරිපත්වූ එක්තරා ධර්ම ගැටළුවකදී 'නිවන' පිළිබඳව දේශනා පෙළක් පැවැත්වීම ප්‍රයෝජනවත් විය හැකි බවත්, ඒ දේශනා පටිගත කරගැනීමට කටයුතු යෙදිය හැකි බවත් පවසමින් අප වෙත කරන ලද දයාන්විත ආරාධනය පිළිගැනීමට මුලදී පසුබට වීමු. යළිත් එම ආරාධනාව කළ අවස්ථාවේදී, එසේ පසුබට වීමට එක් හේතුවක් වශයෙන් අප සඳහන් කළේ 'නිවන' සම්බන්ධයෙන් දැනට ප්‍රචලිතව ඇති ඇතැම් මතිමතාන්තර කෙරෙහි අප දක්වන වෙනස් ආකල්පය නිසා ඇතිවිය හැකි ප්‍රතිචාරයයි. එවිට උන්වහන්සේ වදාළේ: "ඒකට කමක් නැ...... මා ආරාධනා කළ බව දේශනාවේදීම කියන්න" යනුවෙනි.

ඒ සා උදාර පැවරීමකින් උත්සාහවත්ව ආරම්භ කැරුණු මෙම දේශනා මාලාව දෙවසරකට වැඩි කාලයක් තිස්සේ (1988.08.12-1991.01.30) දෙපෝයකට වරක් බැගින් අප ගුරුදේවයන් වහන්සේගේ අතිපූජනීය පාදමූලයේදී නිස්සරණ වනයේ අප සබ්‍රහ්මචාරී ගරුතර යෝගාවචර සඟ පිරිස හමුවේ පවත්වන්නට යෙදුණි. ගිලන්වූ ඇතැම් අවස්ථාවලදී පවා මාහිමිපාණන් වහන්සේ යහන්ගතව දෙසුමට සවන් දුන්හ. උන්වහන්සේ බැහැර සෙනසුනෙක වැඩ විසූ එක් අවස්ථාවෙක, මාහිමිපාණන් වහන්සේ මුල්පුනෙහි නොමැතිව දේශනා පැවැත්වීම සම්බන්ධයෙන් පැහැදුනු

ප්‍රශ්නයක් නිසා එක් දේශනා වාරයක් මග හැරුණි. ඒ බැව් සැළවූ විට, නොකඩවාම දේශනාමාලාව පැවැත්විය යුතු බවත්, තමන් වහන්සේට ඒ දෙසුම් පටිගත කළ පසුව වුවද ඇසිය හැකි බවත්, උන්වහන්සේ වදාළහ. අප ගුරු දේවයන් වහන්සේගේ ඒ උදාර මුදිතා ගුණයට හා ධර්මකාමී ශාසන දයාවට නමස්කාර වේවා!

දෙසුම් 33 කින් පරිමිත මෙම දේශනා මාලාව පැවැත්වීමේදී අප අනුගමනය කළ විවරණ මාර්ගය අනුව හේතුසාධක වශයෙන් පෙළ අටුවා ආදියෙන් කොතෙකුත් උධෘත පාඨ ගෙනහැර දැක්වීමට සිදුවිය. ඒ අනුව එක්තරා බුද්ධිගෝචර රටාවක් මෙහි දැකිය හැකි නමුදු අප පරමාර්ථය වූයේ සද්ධර්මයේ සජීව ප්‍රායෝගික පක්ෂය ඉස්මතු කර දීමමය. ඇතැම් විට හුදු බුද්ධිවාදයක අතරමං වී සිටින උගතුන් කිසියම් ධර්මප්‍රබෝධයක් තුළින් ප්‍රතිපදාව වෙතට යොමුකරවා ගැනීමට මේ විවරණ මාර්ගය උපකාරවත් විය හැකිය. කෙසේ හෝ වේවා, යමෙකුට ධර්මරසය විඳිමින්ම දෙසුමකට සවන්දිය හැකිවන අයුරින් විවිධ උපමා, උපමා කථා, නිදර්ශන ආදියෙන් දෙසුම් පෙළ පණපෙවීමට උත්සාහවත් වීමු. බුදු පියාණන් වහන්සේ වදාළ පරිදිම, "මෙහි ඇතැම් නුවණැති පුරුෂයෝ උපමාවෙකිනුදු දෙසුමෙක අරුත මැනැවින් වටහා ගනිත්".

අසන්නවුන්ගේ අවධානය නොපිරිහෙන අයුරින් මුතු ඇට පෙළක් තුලක අවුණන්නාක් මෙන් ධර්ම කාරණා සාධක සහිතව ගොනු කර දැක්වීම දේශනාවක් තුළ දී කළ හැකි පහසු කාර්යයක් නොවේ. එබැවින් එවැනි ගැටලුසු තැන්වලදී හේතුසාධක කීපයක් පමණක් දැක්වීමෙන් සෑහීමකට පත්වීමට සිදුවිය. එහිලා වඩාත් සවිස්තර විවරණ විග්‍රහ අප අතින් ලියැවී පළවූ ග්‍රන්ථ කීපයක ඇතුළත් වී ඇත.[1]

දෙසුම් පෙළ නිමකොට සත්වසරකට පසු "නිවනේ නිවීම" නමින් එළිදැක්වෙන මෙම ග්‍රන්ථයෙන් යම් ශාසනාර්ථයක් ඉටු වෙතොත් එයින් ජනිත කුශල සම්භාරය දෙසුම්පෙළට ඇරයුම් කොට වදාළ අප ගුරුදේවයන් වහන්සේ වූ මීතිරිගල නිස්සරණ වන සේනාසනාධිපතිව වැඩවිසූ අතිපූජනීය මහෝපාධ්‍යාය මාතර ශ්‍රී ඤාණාරාම මාහිමිපාණන් වහන්සේ අනුමෝදන්

---

1 * 1 Concept and Reality in Early Buddhist Thought - (1971)
* 2 Samyutta Nikaya - An Anthology Part II - (Wheel No. 183/185)
* 3 Ideal Solitude - Wheel No. 188
* 4 උත්තරීතර හුදෙකලාව - (දම්සක් අංක 172/173)
* 5 The Magic of the Mind - (1974)
6 Towards Calm and Insight-Printed for free distribution by J.Alwis
* Published by Buddhist Publication Society. P.O. Box 61, Kandy
බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය, තැ.පෙ. 61. මහනුවර

වන සේක්වා! ඒ දුලීභ ගුරු ඇසුර ලබාගැනීමට මහපැදූ ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ සමුත්පාදක අභිපූජනීය පණ්ඩිත කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශ මාහිමිපාණන් වහන්සේටත් අභිපූජනීය නාඋයනේ අරියධම්ම මාහිමිපාණන් වහන්සේටත් මෙම ධර්‍මදානමය කුශලය හිමිවේවා!

පටිගත වූ දෙසුම් 33 පිටපත් කිරීමේ භාරදූර කාර්‍ය මහත් පරිශ්‍රමයකින් ඉටුකළ හඳුරුදෙණියේ පියදස්සන හිමියන්ටද, සම්ස්කරණ ශුද්ධි ආදියෙන් පසුව එම අත්පිටපත මුද්‍රණය සඳහා සකස් කර දුන් පූජ්‍ය උඩඊරියගම ධම්මජීව, පූජ්‍ය මහයායේ ධම්ම සුනේත්‍ර යන හිමිවරුන්ටද දෙසුම් පටිගත කිරීම පිටපත් කිරීම් ආදී කටයුතුවලට සහායවූ හැමදෙනා වහන්සේලාටද මෙම ධර්‍මදානමය පින පරම ශාන්ත නිර්වාණාවබෝධය පිණිසම වේවා! එමෙන්ම, අවශ්‍ය අවස්ථාවලදී කැසට් පටි සපයාදීමෙන් හා ලිපි ද්‍රව්‍ය, ඡායා පිටපත් ලබාදීමෙන් අනුග්‍රහය දැක්වූ ඩඩ්ලි ප්‍රනාන්දු මහතා ප්‍රධාන සී. එච්. පී. මුණසිංහ සහ සමාගමේ කාර්‍යමණ්ඩලයටද අපගේ පුණ්‍යානුමෝදනාව හිමිවේ.

අමිලවූ ධර්‍මය මිල කිරීමකින් නොපිරිහෙළා ධර්‍මකාමීන් අතට පත්කිරීම අපගේ අභිලාෂය විය. එහෙත් විශාල ග්‍රන්ථයක් බවට පත්වන මෙම දෙසුම් පෙළ එක්වරම බොහෝදෙනෙකුන් අතට පත් කිරීමේ දුෂ්කරතාව වැටහුණෙන් දෙසුම් 3 බැගින් වෙළුම් 11 ක් වශයෙන් එළි දැක්වීමට අදහස් කළෙමු. මේ අනුව යටත් පිරිසෙයින් දෙසුම් කිහිපයක් හෝ කියවීමට වැඩිදෙනෙකුට අවසථාව සැලසෙන අතරම ධර්‍මදානමය පුණ්‍ය කර්‍මයට බොහෝදෙනාගේ සහභාගිත්වයද ලැබෙනු ඇතැයි හඟිමු. එබැවින්, ග්‍රන්ථය නවමත් ශුද්ධිපත්‍ර අවස්ථාවේ පවතින නමුදු මෙසේ පළමු වෙළුම නිකුත් කිරීමට තීරණය කළෙමු. යථා කාලයේදී සම්පූර්ණ ග්‍රන්ථය පුස්තකාල මුද්‍රණයක් වශයෙන් අංග සම්පූර්ණව මුද්‍රණය කෙරෙනු ඇත. කෙසේ වෙතත්, 'නිවනේ නිවීම' වෙළුම් එකොළොසම පිළිවෙළින් එකතු කරගන්නා පාඨකයින්ගේ පහසුව තකා අවසන් වෙළුම සමග උපමා ඉඟිවැලක් හා ගාථා ඉඟිවැලක් ද සහිත 'පදයතුරක්' (අනුක්‍රමණිකාවක්) නිකුත් කිරීමට බලාපොරොත්තු වෙමු. එම පදයතුර සකස් කිරීමේදී අපට සහාය වූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් උපාලි ජයනෙත්ති මහතාට ඒ පින නිවන් දොර ඇරෙන යතුරක්ම වේවායි පතමු.

ග්‍රන්ථ මුද්‍රණයෙහිලා මුද්‍රණාලය හා අවශ්‍ය සම්බන්ධීකරණය පිළිබඳ සම්පූර්ණ වගකීම භාරගෙන විශේෂ කැපවීමකින් ග්‍රන්ථය එළිදැක්වීමට කටයුතු කරන මහාභාරකාර කැන්පත් වූ. මාපා මහතාට මෙම ධර්‍මදානමය කුශලය ස්වකීය ධර්‍ම ප්‍රාර්ථනා ඉෂ්ට කරගැනීම පිණිස හේතුවාසනා වේවා! එසේම, වෙළුම් එකොළොසකින් නිමාවන ග්‍රන්ථයෙහි බරපැන, 'බර පැනයක්' නොවනු පිණිස 'ධර්‍මග්‍රන්ථ මුද්‍රණ භාරය' නමින් විශේෂ අරමුදලක් පිහිටුවීමෙන් පුරෝගාමීවූ පින්වත් ජී.ටී. බණ්ඩාර මහතාට එම

ආදර්ශවත් පරිත්‍යාගයෙන් ජනිත කුශලය පරම ශාන්තවූ 'නිවනේ නිවීම' පසක් කරගැනීමට උපනිශ්‍රය වේවායි! යි පතමු. මුද්‍රණ භාරයේ නිරණ්තුත්මක අවසාන අදියර සඳහා පූර්ණ සහයෝගය දෙන කරුණාරත්න සහ පුත්‍ර සමාගමේ කාර්‍ය මණ්ඩලයටද අපගේ පුණ්‍යානුමෝදනාව හිමි විය යුතුව ඇත.

මෙයට
සසුන් ලැදි,
**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

**පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය**
**'පහන් කණුව'**
**කණ්දෙගෙදර**
**දේවාලේගම**

**(25 41) 1997 ජුලි 1**

## නිවනේ නිවීම පළමු වෙළුම - පස්වන මුද්‍රණය

මෙම පස්වන මුද්‍රණයේ මුද්‍රණ කටයුතු මැනවින් නිමකළ "කොලිටි ප්‍රින්ටර්ස්" සමාගමේ සී.ජයසෝම මහතා ඇතුළු සැමටද අපගේ පුණ්‍යානුමෝදනාව හිමිවේ.

සම්පාදක
(2550) 2006 දෙසැම්බර්

# ප්‍රකාශක නිවේදනය

අතිපූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ "නිවනේ නිවීම" දේශනා මුද්‍රණය කොට, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයහට එම දහම් පොත් ලබාදීමේ මූලික අදහස අප තුළ ඇතිවී මුත්, මුද්‍රණය සඳහා වැය වන මුදල උපයා ගැන්ම ප්‍රශ්නයක් විය. එය විසඳීම පිණිස අප කිහිප දෙනෙක් යෝජනා කළේ වැයවන මුද්‍රණ වියදම පමණක් අය කර ගැන්මට ප්‍රමාණවත් වූ මිලකට එම දහම් පොත් විකිණීමයි. එහෙත්, අපගේ එම යෝජනාව ගරු ඤාණනන්ද ස්වාමීන් වහන්සේ එකහෙලා ප්‍රතික්ෂේප කරමින් "ධර්මය මිල කරන්න බැහැ, එය අවශ්‍ය අයහට නොමිලේ ලබා ගැන්මට හැකිවිය යුතුයි..." කීහ.

එබැවින් උන්වහන්සේ අදහස් කළ පරිදි මුලින්ම මුද්‍රණය කල "නිවනේ නිවීම" දේශනා මාලාව සඳහා වියදම් ලබා ගැන්මේ වැඩ පිළිවෙලක් වශයෙන් රෝයල් ඉන්ස්ටිටියුට් හි අධිපති ජී.ටී.බණ්ඩාර මහතා විසින් මහා භාරකාර දෙපාර්තමේන්තුවෙහි "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් අරමුදලක් අරඹනු ලැබීය. එවකට මහා භාරකාර ධූරය දැරූ යූ. මාපා මහතාගේ අදහසක් අනුව පිහිටුවන ලද එකී භාරයෙහි අරමුණ වූයේ මෙම පුණ්‍ය ක්‍රියාව ඉටුකර ගැනීම සඳහා දායක වීමට කැමති අය හට මුදලින් කෙරෙන තම පුණ්‍යාධාර එම භාරයට බැර කිරීමට අවස්ථාව සළසා දීමයි.

1997 වසරේදී ඇරඹුනු මෙම ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පූජ්‍ය ඤාණනන්ද හිමියන්ගේ දේශනා 33 කින් යුත් "නිවනේ නිවීම" වෙළුම් 11 කින් මුද්‍රණය කොට නොමිලේ බෙදා දීමට අමතරව පසළොස්වක පොහෝ දිනයන්හිදී පහන් කණුව සෙනසුන වෙත රැස්වෙන උපාසක උපාසිකාවන් සඳහා උන්වහන්සේ විසින් කෙරෙන ධර්ම දේශනා "පහන් කණුව ධර්ම දේශනා" නමින් මේ වන විට ග්‍රන්ථ 6ක් පළකොට තිබේ. එතැනින් නොනැවතී උන්වහන්සේගේ අනෙකුත් සිංහල සහ ඉංග්‍රීසි ග්‍රන්ථද එසේම ධර්ම දාන වශයෙන් පළකිරීමට හැකිවීම ඊට දායක වූ අප සැමගේ ඉමහත් සතුටට හේතුවිය.

අති පූජ්‍ය ඤාණනන්ද ස්වාමීන් වහන්සේගේ එම ධර්ම දේශනා අගයමින් එම සත්කාර්යය නොනවත්වා කරගෙන යෑම පිණිස දායක භවතුන්ගෙන් අප වෙත ලැබෙන පැසසුම් සහිත ප්‍රතිචාරය නිසාම ඒ අයගේ පහසුව පිණිස අප විසින් මෑතකදී "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් සම්පත් බැංකුවේ නුගේගොඩ ශාඛාවේ අංක 0003 6000 1415 දරණ ජංගම ගිණුම විවෘත කරන ලදී.

අති පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද හිමියන් විසින් පහදා දෙනු ලබන නිර්මල බුදු දහම ඔබ අතට පත් කිරීම අපගේ එකම අරමුණයි. ඊට ඔබගෙන් ලැබෙන දායකත්වය ඉමහත් කුශලයකි. අපට ඉමහත් ධෛර්යයකි.

මෙම වර්තමාන ග්‍රන්ථ මුද්‍රණය කොට බෙදා හැරීමේ සම්පූර්ණ කාර්යභාරය ජී.ටී. බණ්ඩාර මහතා විසින් රෝයල් ඉන්ස්ටිටියුට් හි පින්වත් නිලධාරීන්ගේ සහායද ඇතිව වෙහෙස මහන්සි නොබලා ඉටුකර දීම ගැන අපගේ බලවත් ප්‍රසාදය මෙහිලා විශේෂයෙන්ම සඳහන් කළයුතු වේ.

මෙයට,
සදහම් ලැදි
ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරකාර මණ්ඩලය

# ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පළකැරෙන ග්‍රන්ථ මුද්‍රණයට දායක වීම

අති පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් දේශිත නිර්මල බුදු දහම, "නිවනේ නිවීම" සහ "පහන් කණුව ධර්ම දේශනා" නමින් පළ වී ඇති දහම් පොත් තුළින් මේ වන විටත් ඔබ ඇතැම් විට කියවා තිබිය හැක.

එම ස්වාමීන් වහන්සේගේ ධර්ම දේශනා හැකි පමණ මුද්‍රණය කොට නොමිලේ බෙදා දීම ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරයේ අරමුණයි.

මෙතෙක් එම භාරය මගින් පළකොට ඇති ධර්ම ග්‍රන්ථ එකී ග්‍රන්ථ වල අවසාන පිටුවෙහි දක්වා ඇත.

මෙම මහඟු පුණ්‍ය ක්‍රියාව සඳහා දායක වීමට කැමති පින්වතුන්, පහත සඳහන් උපදෙස් පිළිපැදීම මැනවි.

1. චෙක්පත්/මුදල් ඇනවුම් මගින් එවන සියලු ආධාර "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් සම්පත් බැංකුවේ නුගේගොඩ ශාඛාවේ අංක 0003 6000 1415 දරණ ගිණුමට බැර කිරීම පිණිස පහත සඳහන් ලිපිනයට එවිය හැකිය.
2. දිවයිනේ පිහිටි ඕනෑම සම්පත් බැංකු ශාඛාවක් මගින් ඔබගේ ආධාර මුදල් ඉහත සඳහන් ගිණුමට බැර කල හැක.
3. කෙසේ වුවද, ඔබගේ පහසුව පිණිස සියලු පුණ්‍යාධාර කොළඹ 05, හැව්ලොක් පාරේ අංක 191 හි පිහිටි රෝයල් ඉන්ස්ටිටියුට් ආයතනයේ ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය වෙනුවෙන් පිහිටුවා ඇති අංශයටද බාර දියහැක.
4. මෙම භාරය මගින් නිකුත් කැරෙන ධර්ම ග්‍රන්ථ මගින් ඔබගේ දායකත්වය වරින් වර දායක භවතුන්ගේ දැනගැන්ම සඳහා පළ කරනු ඇත.
5. ඔබ විසින් කරනු ලබන ආධාරය බැංකු ගිණුමට බැර කරන විට ඒ සඳහා නිකුත් කරනු ලබන කුවිතාන්සියෙහි ඡායා පිටපතක් පහත සඳහන් ලිපිනයට එවීමෙන් මෙම ධර්ම දානමය කටයුත්තට දායක වන ඔබගේ නම සහ දායක මුදල අප විසින් වරින් වර පළ කරන දායක ලැයිස්තුවෙහි ඇතුළත් කිරීම කළ හැකිය.

ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය
රෝයල් ඉන්ස්ටිටියුට්
අංක 191, හැව්ලොක් පාර
කොළඹ 05

# අමා ගඟ

මහවැලි ගඟ උතුරට හැරවීමෙන් පසු එතෙක් නිසරු මුඩු බිම් ලෙස පැවති පෙදෙස්වල සිදුවූයේ ඉමහත් වෙනසෙකි. පිපාසයට පැන්බිඳක් නොලබා සිටි ගොවීහු පෙදෙස පුරා නිහඬව ගලා යන සිසිල් දිය දහරින් පිනා ගියහ. මැලවුනු ගොයම් සරුව නිල්වන්ව කරලින් බර විය. මල් පලින් ගැවසීගත් තුරු-ලිය බලා සැනසෙන පෙදෙස් වැසියෝ තුටු කඳුළු වගුළහ.

දහම් අමා ගඟ "උතුරට" හැරවීමේ වැඩ පිළිවෙළක් මෙයට කෙවසරකට පෙර ඇරඹුණි. දහම් පත-පොත කබා "එදා-වේල" සඳහා වත් විය පැහැදම් කිරීමට වත්-කමක් නැත්තෝ, නිහඬව නොමිලයේ ගලායන අමිල දහම් අමා දිය දහරින් සදහම් පිපාසය සන්සිඳුවා ගත්හ. අරිවූ මිසදිටු හැර, සැදැහැයෙන් සරුව, ගුණ නුවණින් බරව පිළිවෙත් මඟට නැමී ගත්හ. ලොවී - ලොවුතුරු මල් පල නෙලා ගනිමින් හද පුරා පිරි බැතියෙන් තුන් අයුරින් සොම්නස පළකළහ.

"ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් දියත් කළ මෙම ධර්මදාන වැඩපිළිවෙල සඳහා අපගෙන් වැයවුනේ පිරිසිදු ධර්මදාන සංකල්පය පමණි. අමාගඟ "උතුරට" හැරවූවෝ සදහම් ගුණ හඳුනන පරිත්‍යාගශීලී සැදැහැවත්හුමය. "නිවනේ නිවීම" පොත් පෙළ එළි දැක්වීමෙන් නොනැවතී "පහන් කණුව ධර්මදේශනා" පොත් පෙළෙහි "බර පැන" දැරීමටත්, දෙස් - විදෙස්වල දහම් පිපාසිතයින් උදෙසා අප අතින් ලියැවෙන අභිනව පොත - පත ඒ අයුරින්ම එළි දැක්වීමටත් ඔවුහු උත්සුක වූහ. "දෙන දේ පිරිසිදුවම දීමේ" අදහසින් අමිල වූ දහම ඊට නිසි ශෝභන මුද්‍රණයකින්ම ධර්මකාමීන් අතට පත් කිරීමට පියවර ගත්හ. මුද්‍රිත පිටපත් සංඛ්‍යාව අවසන්වනු හා සමගම "නැවත මුද්‍රණ" පළකිරීමෙන් දහම් අමා ගඟ වියළී යා නොදීමට දැඩි අදිටනකින් ඇප කැපවූහ.

"පොත් අලෙවිය" පිළිබඳව මෙකල බහුලව දක්නට ලැබෙන වාණිජ සංකල්පයට පිටුපා, තහංචිවලින් තොරව, තමන් අතට නොමිලයේම පත් කැරෙන "දහම් පඬුර" තුළින් ධර්මදාන සංකල්පයෙහි අගය වටහා ගත් බොහෝ පාඨක පින්වත්හු තමන් ලද රස අහරක්, නෑ-හිතවතුන් සමග බෙදා-හදා ගන්නාක් මෙන් නොමසුරුව අන් දහම් ලැදියනටද දී ධර්ම දානයට සහභාගී වූහ. ඉඳුදු නොනැවතී, ශක්ති පමණින් "ධර්ම ග්‍රන්ථ මුද්‍රණභාරයට" උරදීමටද ඉදිරිපත්වූහ, ඇතැමෙක් ලොකු කුඩා දහම් පොත්

මුද්‍රණය කරවීමේ හා නැවත-නැවත මුද්‍රණය කරවීමේ බරපැන ඉසිලීමට පවා පසුබට නොවූහ.

සම්බුදු සසුන මේ ලක් පොළොවෙහි පවතින තාක් මේ දහම් අමාගඟ ලෝ සතුන් සිත් සනහමින් නොසිඳී ගලා යේවා යනු අපගේ පැතුමයි.

"සබ්බදානං ධම්මදානං ජිනාති"

මෙයට,

සසුන් ලැදි
**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර, දේවාලේගම

2000 ජූනි 05 (2544 පොසොන්)

# ග්‍රන්ථ සංකේත නිරූපණය

| | | |
|---|---|---|
| මහා. | - | මහා වග්ග පාළි |
| දී.නි. | - | දීඝ නිකාය |
| ම.නි. | - | මජ්ඣිම නිකාය |
| සං.නි. | - | සංයුත්ත නිකාය |
| අං.නි. | - | අංගුත්තර නිකාය |
| ඛු.නි. | - | ඛුද්දක නිකාය |
| ධ.ප. | - | ධම්මපද |
| උදා. | - | උදාන |
| ඉති. | - | ඉතිවුත්තක |
| සු.නි. | - | සුත්තනිපාත |
| ථෙර. | - | ථෙරගාථා |
| ථෙරී. | - | ථෙරීගාථා |
| මහානි. | - | මහා නිද්දෙස |
| චූ.නි. | - | චූල්ල නිද්දෙස |
| නෙත්ති | - | නෙත්තිප්පකරණ |
| සු.වි. | - | සුමඞ්ගලවිලාසිනී (දීඝ නිකාය අටුවාව) |
| ප.සූ. | - | පපඤ්චසූදනී (මජ්ඣිම නිකාය අටුවාව) |
| සා.ප. | - | සාරත්ථප්පකාසිනී (සංයුත්ත නිකාය අටුවාව) |
| මනො. | - | මනොරථපූරණී (අංගුත්තර නිකාය අටුවාව) |
| ධ.අ. | - | ධම්මපදට්ඨ කථා |
| ප.ජෝ. | - | පරමත්ථජෝතිකා |
| ජා.අ. | - | ජාතකට්ඨකථා |
| ප.දී. | - | පරමත්ථදීපනී |
| වි.ම. | - | විසුද්ධිමග්ග |
| බු.ජ. | - | බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා |
| සේ.මු. | - | සයිමන් හේවාවිතාරණ මුද්‍රණය |

# 1 වන
# දේශනය

# 1 වන දේශනය

"නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"

'එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං'

"මෙය ශාන්තය, මෙය ප්‍රණීතය, එනම් සියලු සංස්කාරයන්ගේ සංසිඳීම සියලු උපධීන් අතහැර දැමීම, තණ්හාව ක්‍ෂය කිරීම, නොඇල්ම නම් වූ විරාගය, නැවැත්ම නම් වූ නිරෝධය, නිවීම නම් වූ නිබ්බානය"

අතිපූජනීය මහෝපාධ්‍යාය මාහිමිපාණන්වහන්සේ ප්‍රධාන ගරුතර යෝගාවචර මහා සංඝරත්නයෙන් අවසරයි.

පසුගියදා අපට අසන්නට ලැබුණු පටිගත කළ ධර්මදේශනා කීපයක් නිසා අප යෝගාවචර පිරිස අතර, නිර්වාණය පිළිබඳව සඳහන් වන සමහර ගැඹුරු සූත්‍ර ගැන නොයෙකුත් අදහස් උදහස් ඇතිවුනු බවත්, ඒ නිසා ඒවා සම්බන්ධයෙන් යම්කිසි ධර්මදේශනා පෙළක් පැවැත්වුවහොත් පිරිසට ප්‍රයෝජනවත් වෙන්ට පුළුවන් බවත්, අතිගරු මාහිමිපාණන් වහන්සේ මට මේ මෑතකදී ආරාධනාවක් කළා. මුලදී ඒ ගැන හේතු කීපයක් නිසා මා පසුබට වුනා. නමුත් මාහිමිපාණන් වහන්සේ මට ඒ ගැන උනන්දු කරවීම් වශයෙන් යම් යම් දේ කිවූ නිසා එය කළ හැකි ආකාරයක් ගැන මා ටිකක් කල්පනා කර බැලුවා. පෙර'පර දෙදිග උගතුන්ගේ විවාදයට භාජනය වුනු ගැඹුරු සූත්‍ර කීපයක් පිළිබඳව ශාස්ත්‍රීය වශයෙන් දේශනා පැවැත්වීමට වඩා, අප මේ නිස්සරණ වනයේ මේ කරගෙන යන වැඩ පිළිවෙලට උපකාර වන අන්දමින්, භාවනා මනසිකාරයට හසු කරගත හැකි අන්දමට, මේ දේශනා පැවැත්වීම සුදුසුය කියලා මට අදහස් වුනා. ඒ නිසාමයි, අර කොතෙකුත් ගැඹුරු සූත්‍රපාඨාදිය තිබුණත් මේ අවස්ථාවේ මේ දේශනා පෙළටම මාතෘකා වශයෙන් අර කලින් සඳහන් කළ පාඨය අප තබාගත්තේ.

"එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං"

"මෙය ශාන්තය, මෙය ප්‍රණීතය, එනම්, සියලු සංස්කාරයන්ගේ සංසිඳීම, සියලු උපධීන් අත්හැර දමීම, තෘෂ්ණාව ක්‍ෂය කිරීම, නොඇල්ම නම් වූ විරාගය, නැවැත්ම නම් වූ නිරෝධය, නිවීම නම් වූ නිබ්බානය."

මේ විදියේ භාවනා මනසිකාරයක්ම වන මේ පාඨය, අපේ සිත් තුළ ඉදිරිපත් කරගෙනම, මේක කම්මට්ඨානයක් හැටියට, 'එතං සන්තං එතං පණීතං .......' ආදී වශයෙන් නිර්වාණයට සිත යොමුකරන, සිත නංවන අන්දමේ පාඨය මුල්තැන තබාගෙන, ඊට අදාලවන අන්දමින් අපේ මනසිකාරය පැවැත්වුවොත් අර ධම්මයේ, ඒ ස්වාක්ඛාතවූ ධම්මයේ, සන්දිට්ඨික, අකාලික, එහිපස්සික, ඔපනයික, පච්චත්තං වේදිතබ්බ විඤ්ඤූහි ගුණවල අගය අපට තේරුම් ගන්ට පුළුවනි. එහෙම ඒ ප්‍රතිඵලය සැලසුනොත් අපේ මේ දේශනා පෙළත් සාර්ථක වුනා කියලා සතුටු වෙන්ට අවස්ථාවක් ලැබෙනව කියල මා හිතනවා. මේ දේශනා පෙළට පසුබිම් වශයෙන් පළමුවෙන්ම කාරණා කීපයක් සඳහන් කරන්ට සිද්ධවෙනව. ඒ ගැන සමාධිය භජනය කරන්ට වෙනව, සමහර කාරණා පිළිබඳව කියන්ට තිබෙන දේවල් පිළිබඳව.

පසුබිම් වශයෙන් විශේෂයෙන්ම නිර්වාණය සම්බන්ධ ගැඹුරු සූත්‍ර රාශියක අර්ථය පිළිබඳව යම් යම් ව්‍යාකූලතා ඇතිවීමට හේතුව ගැන යමක් කිවයුතුව තිබෙනව. සාමාන්‍යයෙන් අපි ප්‍රකීර්ණක දේශනා වශයෙන් අටුවා සාහිත්‍යය ගැන හඳුන්වන සිරිතක් තිබෙනව. නමුත් ඇත්ත වශයෙන් තිබෙන තත්වය ගැන කල්පනා කරල බැලුවාම, අටුවාවල බොහෝවිට තිබෙනව මේ ගැඹුරු සූත්‍ර පිළිබඳව එක නිගමනයක් දෙන්ට බැරිව නොයෙකුත් අවස්ථාවල විකල්පාර්ථ දෙනව. 'මෙසේත් විය හැක,' 'මෙසේත් විය හැක' කියල විසඳීමක් නැතිව පාඨකයා අතරමං කරන තැනුත් තිබෙනවා. සමහර තැන්වල පැහැදිලිවම ඒ අර්ථමාර්ගයෙන් ඉවත්වුනු යම් යම් නිගමනත් දෙනව. ඒ වගේම, සමහර ගැඹුරු සූත්‍ර පිළිබඳව අටුවාවල් නිහඬ මක්නිසාද කියන එකත් උගතුන්ට මේ කාලෙ ගැටළුවක්. මේ විදියේ තත්වයක් ඇතිවීමට ප්‍රධාන වශයෙන්ම හේතු උන යම් යම් ඓතිහාසික කාරණාත් තිබෙනව.

බුදුපියාණන් වහන්සේම දේශනා කර තිබෙනව අනාගත භය වශයෙන්, අනාගතයේ ඇතිවිය හැකි ශාසන පරිහානිය පිළිබඳ යම් යම් ලක්ෂණ හැටියට සංයුක්ත සඟියේ නිදාන වග්ගයේ ආණි සූත්‍රයේ[1] සඳහන් වෙනව අනාගතයේ ඇතිවන භික්ෂූන් තථාගත දේශිත ගම්භීර ගම්භීරාර්ථවත්, ලෝකෝත්තර, ශූන්‍යතා ප්‍රතිසංයුක්ත සූත්‍ර පිළිබඳව, ඒවාට ඇහුම්කන් දෙන්න වැඩි කැමැත්තක් දක්වන්නෙ නැත. ඒවා ඉගෙන ගැනීමට, ඒවායේ ගැඹුර ගැන සැළකීමට උනන්දුවක් දක්වන්නේ නැත, කියල ඒ විදියට දක්වල තිබෙනව.

'.........යෙ තෙ සුත්තන්තා තථාගතභාසිතා ගම්භීරා ගම්භීරත්ථා ලොකුත්තරා සුඤ්ඤතපටිසංයුත්තා තෙසු භඤ්ඤමානෙසු න සුස්සූසිස්සන්ති, න සොතං ඔදහිස්සන්ති න අඤ්ඤාචිත්තං උපට්ඨාපෙස්සන්ති, නච තෙ ධම්මෙ උග්ගහෙතබ්බං පරියාපුණිතබ්බං මඤ්ඤිස්සන්ති' ආදී වශයෙන්. අනාගතයේ ඇතැම් භික්ෂූන් අනාගත ශාසන පරිහානියේ ප්‍රතිඵලයක් වශයෙන් ඒ ගැඹුරු ශූන්‍යතා ප්‍රතිසංයුක්ත සූත්‍ර පිළිබඳව, ඒවා ඇසීමට, ඒවාට කන්යොමු කිරීමට, ඒවා ඉගෙන ගැනීමට උනන්දුවක්

දක්වන්නේ නැත කියල. ඒ වගේම තවත් ඓතිහාසික වශයෙන් දක්විය හැකි හේතුවක් තිබෙනව. මේ ශාසන ඉතිහාසයේ එක්තරා අවධියකදී මුල් බැසගත්තු අදහසක් තමයි, මේ සූත්‍ර පිටකයේ තිබෙන්නේ වොහාර දේශනාවය, ඒ නිසා එහි ඒ තරම් ගැඹුරක් නැත. ඒ තරම්ම ගැඹුරු ධර්මයක් එහෙන නැත, කියන හැඟීමකුත් මේ අතරේ මුල් බැසගත්ත. ඒකත් මේ සූත්‍ර පිළිබඳව සැළකිල්ල අඩුවීමට හේතු වුනා. ඒ වගේම, මනොරථපූරණී අඞ්ගුත්තර අටුවාවෙ[2] සඳහන් වෙනව ශාසන ඉතිහාසයේ මුල් අවධියකදීම මේ ලංකාවෙ පරියත්තිවාදීනුත් පටිපත්තිවාදීනුත් අතර එක්තරා විවාදයක් තිබ්ල ඒකෙන් ජයග්‍රහණය කළේ පරියත්තිවාදීන්ය කියල. ඔවුන්ගේ අවසාන නිගමනය උනේ කුමක්ද? ශාසනයේ පැවැත්මට ප්‍රතිපත්තිය නැතත් පර්යාප්තිය උනත් ප්‍රමාණවත්ය කියන එක. ඇත්ත වශයෙන්ම නොයෙකුත් උපද්‍රව මධ්‍යයේ - තියං සායවල් ආදිය මධ්‍යයේ - අතීතයේ භාණක ස්වාමීන් වහන්සේලා එහෙම පර්යාප්තිය රැකගැනීමට දරූ උත්සාහය ප්‍රශංසනීයයි. නමුත් අවාසනාවකට වගේ සිදුවුනේ අඳුරේ කූඩයක් අතින් අත යවන කොට ඒ කූඩේ තිබෙන වැදගත් වටිනා දේ සමහර විට ගිලිහී යන්න ඉඩ තිබෙන බවයි. ඒ වගේම මේ අටුවා යුගයේදී අර්ථ විපරිණාමයකුත් සිද්ධ උන බව පෙනෙනව. ඒක හංගන්න පුළුවන් දෙයක් නොවෙයි. ධර්මය පිළිබඳ සත්‍යය සොයන කෙනෙකුට පැහැදිලිවන කාරණයක්. එනම් සූත්‍රයේ පැහැදිලිවම තියෙන සමහර වචනවලට, අටුවා යුගයේ නොයෙකුත් විදියේ සංකීර්ණ අදහස් එකතු කරන බව පේනව සමහර අර්ථකථන ක්‍රම නිසා. නමුත් එයින් වෙන්නෙ මේ ධර්මයේ තිබෙන ඒ වටිනා අර්ථ මැකීයාමයි. සමහර අර්ථ විවරණවලින් අර්ථ ආවරණය වෙනව පේනව. අන්න එබඳු තත්වයක් ක්‍රම ක්‍රමයෙන් ඇතිවුනා. ඒ වගේම විශේෂයෙන්ම කිව යුතුව තිබෙන්නේ මේ සද්ධර්මයේ ගැඹුර දකිය යුත්තේ සරලත්වය තුළින්, නිර්මල ජලාශයක පතුල දකින්නා වගේ.

'ද්වෙ නාම කිං? නාමං ච රූපං ච' දෙක නම් කිම? නාමයයි රූපයයි. මේ බුදුපියාණන් වහන්සේ සත්හැවිරිදි වියේදීම මහ රහත් පදවිය ලබාගත් සෝපාක සාමණේරයන් වහන්සේගෙන් ඇසූ ප්‍රශ්න දහයෙන් දෙවැන්නයි. හරියට අර දහයට ගනින්න දන්නවද කියල දරුවෙකුගෙන් අහන්න වගේ බුදුපියාණන් වහන්සේ ඇසූ ඒ ප්‍රශ්න දහය එසේ මෙසේ ප්‍රශ්න නොවෙයි. අර්හත්වයෙන් කෙළවර වන ප්‍රශ්න මාලාවක්. බුදුපියාණන් වහන්සේ බලාපොරොත්තු වුනු, අපේක්ෂා කරපු පිළිතුරුම සෝපාක ස්වාමීන් වහන්සේ දුන්න.

මේ දෙවෙනි ප්‍රශ්නයයි අප මෙතැනදී සළකන්නෙ විශේෂයෙන්ම. 'නාමං ච රූපං ච' විදර්ශනා පාඨමාලාවේ මූලික පාඩමක් හැටියට ගන්න පුළුවන්, නාමයත් රූපයත් කියන මේ දෙක. මේ "නාමයත් රූපයත්" කියල කියනකොට, 'නාමය' කියල කියන්නේ නම බව කියන කොටමක් කෙනෙකුට වැටහෙනවා. සූත්‍රවලත් සාමාන්‍යයෙන් "නාම" කියන වචනය තනිව යෙදෙනකොට 'නම' කින අදහසයි එන්නේ. නමුත් අටුවා යුගයේ අපට පෙනෙනව, වෙන එකක් තබා මේ සෝපාක ප්‍රශ්නය සඳහන් වෙන

පරමත්ථජෝතිකාවෙ[3] පවා මේ නාමය කියන එකට නම කියල කීමේ මොකක්දෝ අඩුවක්, මදිකමක්, වගේ පෙනුන බවක් හැඟෙනවා. ඒ වෙනුවට 'නැමීම' කියන අර්ථයක් එකතුකරගෙන තියෙනව.

'ආරම්මණාභිමුඛං නමනතො, චිත්තස්ස ච නති හෙතුතො' - අරමුණ අභිමුඛයට නැමෙන නිසා. සිතේ නැමෙන ස්වභාවය නිසා, - 'සබ්බම්පි අරූපං නාමන්ති වුච්චති' සියලුම අරූප ධර්ම නාම නමින් හැඳින්වෙනව ආදී වශයෙන්. අභිධර්මසංග්‍රහ ග්‍රන්ථවලත් අටුවාවලත් මේක බොහොම ප්‍රකට අර්ථ කථනයක් වුනා. මේ නාමය කියන්නේ අරමුණ දෙසට නැමෙන අර්ථයෙන්ය කියල. සමහරවිට නාමය කියල ගත්තහම ඒක සරල වැඩියි කියල සැලකුව වෙන්න ඇති මෙතන මේ ගැඹුරු, විදර්ශනාවට යන විදියෙ සංකල්පයක් නිසා, නමුත් ඇත්ත වශයෙන්ම කල්පනා කරල බලනව නම් සූත්‍රදේශනාවලට අනුව, මේ 'නාමය', 'නම' කියල ගත්තත් ඒකෙත් විශාල ගැඹුරක් තියෙන බව හෙළිවෙන සූත්‍ර තිබෙනව.

'නාමං සබ්බං අන්වභවි - නාමා භීය්‍යො න විජ්ජති.
නාමස්ස එකධම්මස්ස - සබ්බෙව වසමන්වගූ'

මේ සංයුත් සඟියෙ සගාථක වග්ගයේ තිබෙන ගාථාවක්. 'නාමං සබ්බං අන්වභවි' නාමය සියල්ල යටපත් කොට සිටියේය. 'නාමා භීය්‍යො න විජ්ජති' නමට වඩා වැඩියෙක්, නමට වඩා ලොකු දෙයක් නැත 'නාමස්ස එකධම්මස්ස සබ්බෙව වසමන්වගූ' නාමය කියන එකම දේට මුළු ලෝකයාම යටත් වෙයි. එහි වසඟයට යෙයි. කියන අදහසක් මේ ගාථාවේ තිබෙනවා.

ඒ වගේම තවත් ගාථාවක් තිබෙනවා ඒකට මේ කාලයේදී අර්ථ දීමේදී පවා එහි තිබූ මූලික අර්ථය මැකිල ගිහින් තියෙන බව පේනව.

'අක්ඛෙය්‍ය සඤ්ඤිනො සත්තා - අක්ඛෙය්‍යස්මිං පතිට්ඨිතා
අක්ඛෙය්‍යං අපරිඤ්ඤාය - යොගමායන්ති මච්චුනො'[5]

'අක්ඛෙය්‍ය සඤ්ඤිනො සත්තා' මේ ලෝකයේ සත්වයෝ නම්කර කියන දෑ පිළිබඳව සංඥාව ඇත්තාහුය. අක්ඛෙය්‍යස්මිං පතිට්ඨිතා' නම්කර කියන දෑ කෙරෙහිම පිහිටියාහුය, එයින් ඔබ්බට යන්නෙ නැහැ කියන එකයි. 'අක්ඛෙය්‍යං අපරිඤ්ඤාය යොගමායන්ති මච්චුනො' - ඒ නම්කර කියන දෑ පිළිබඳව පිරිසිඳ අවබෝධයක් නැතිකම නිසා, හොඳ පරිපූර්ණ අවබෝධයක් නැතිකම නිසා - මාරයාගේ වසයට යෙත්. මේ ගාථාවලිනුත් අපට පෙනෙන්නේ මේ නාමයේ යම්කිසි ගැඹුරු පැත්තක් තිබෙන බවයි. නමුත් මේ නාමයේ - මෙතන නාමරූප කියල ගත්තහම මේ නාමය කියන එකේ - අඩුවක් තියෙනව ද කියලත් අපි හිතල බැලිය යුතුව තිබෙනව. දැන් නාම - රූප කියන එක අපි ගත්තොත්, දැන් මැදුම් සඟියේ සම්මාදිට්ඨි සූත්‍රයේ සැරියුත් ස්වාමීන් වහන්සේ නාම - රූප තෝරන ඒ විග්‍රහය ගත්තොත් ඉදිරියට - 'වෙදනා, සඤ්ඤා, චෙතනා, ඵස්සො, මනසිකාරො ඉදං වුච්චතාවුසො නාමං චත්තාරිච මහාභූතානි චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපං ඉදං වුච්චතාවුසො නාම රූපං'[6]

බොහොම පැහැදිලිව සරලව දක්වල තියෙනව සැරියුත් ස්වාමීන්වහන්සේ. වේදනා, සඤ්ඤා, චේතනා, ඵස්ස, මනසිකාර කියන්නෙ ඇවැත්නි, මෙන්න මේක නාමයයි. පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන මේ සතරමහාභූත ධර්මයනුත්, ඒ සතරමහාභූත ධර්මයන් නිසා පවත්නා රූපයත්, මෙය රූපයයි. මෙන්න මේ විදියට නාමයයි රූපයයි, මේකට තමයි නාමරූප කියන්නෙ කියල. එතකොට මෙතන මේ වේදනා, සඤ්ඤා, චේතනා, ඵස්ස, මනසිකාර කියන ධර්ම නාමය හැටියට - නමක් හැටියට සළකන්න හේතුවක් තියෙනවද කියල අපි හිතල බලමු.

අපි මේකට හොඳ උපමාවක් ගනිමු. කුඩා දරුවෙක් ඉන්නව බහකෝරන්න බැරි, ඒ දරුවාට පළමුවෙන්ම යම්කිසි කෙනෙක් රබර් බෝලයක් දෙනව. ළමයා මේක දක්කෙ පළමු වරටයි. යම්කිසි කෙනෙක් කිව්වොත් 'රබර් බෝලය වනාහි සෙල්ලම් බඩුවක්' කියල. ළමයට තේරෙන්නෙ නැහැ. බහකෝරන්න දන්නෙ නැති නිසා. කොහොමද ළමය මේක හඳුනගන්නෙ? රබර් බෝලෙ නැහැයට කිට්ටුකරල බලනව, දිවගාල. බලනව, කන්න පුළුවන් දෙයක් ද කියල. දොඩං වගේ. ඔබල බලනව. ටිකක් පෙරළල බලව. මේක ඉබේම හොඳට ලස්සනට පෙරළෙන නිසා මේක සෙල්ලම් බඩුවක් කියල තේරුම්ගන්නව. එතකොට අර වේදනා, සඤ්ඤා, චේතනා, ඵස්ස, මනසිකාර කියන මෙන්න මේ නාමධර්ම මුල්කරගෙන තමයි අර දරුව රබර් බෝලෙ ඇඳින ගන්නෙ. ලෝකසම්මුතියෙ තියෙන 'රබර් බෝලය' කියන නාමින් නොවෙයි. ඔන්න ඔය විදියට අපට කල්පනා කරල බැලුවම පේනව ඔතන තියෙන්නෙ නාමරූපයෙ කියන 'නාමය' - නාමයෙහි ප්‍රාථමික ස්වරූපයයි. මුල් ස්වරූපයයි, මුල් ආකෘතියයි. ලෝකයා වඩා පරිහරණය කරන්නෙ පහසුව සඳහා යම්කිසි නමක්. ඒක කීපදෙනෙක් සම්මත කරගත්තාම ඒක නමක් වෙනව. දැන් අර 'නාමං හියොා න විජ්ජති.' ආදී ගාථාවෙ, එතනදී නම් අටුවාචාරීන් වහන්සේත් හොඳ අදහසක් දක්වනව. නාමයෙහි ලෝකය මැඩපවත්වන ශක්තියක් තියෙනව කියල කියන්නෙ මොකද? යම්කිසි දෙයකට ලෝකයා එකෙක් නමක් දීල නැත්නම් - සමහරවිට ගහකට, පැලයකට, ආදියකට ප්‍රකට නමක් නැත්නම් - ඒක පිළිබඳව ව්‍යවහාර කරනකොට 'නමක් නැති එක' කියලවත් ව්‍යවහාර කරනව. එහෙම ස්වභාවයක් තිබෙනව. නමක් නැති එක 'අනාමකො'? නමක් නැති ගහ කියල හරි කොහොමහරි නමක් දාන ස්වභාවයක් තියෙනව. එතකොට ඒ විදියෙ කෘත්‍යයකුත් නැති අවස්ථාවේදී අර කුඩාදරුව යමක් හඳුනගන්නෙ මේ කියපු මූලික ධර්ම මාර්ගයෙන්. එතකොට මෙතනින් අපට තේරුම් ගන්න තියෙන්නේ, දැන් යෝගාවචරයට ඇත්තවශයෙන්ම ලෝකය පිළිබඳ කොයිතරම් අවබෝධයක් තිබුණත් ඇඳිනගතයුත්තෙ මේ නාම - රූප ලෝකයයි. මේ නාම-රූප ලෝකය හඳුනගන්න ඕනනම් අර කුඩා දරුවගෙ තත්වයට එන්න ඕන, එක පැත්තකින්. නමුත් අඥාන උපේක්ෂාව වෙනුවට ඥාන සම්ප්‍රයුක්ත උපේක්ෂාවකුත් ඇති කරගන්න වෙනව, ඒ යෝගාවචරයට. ඒ සඳහා තමයි සතිසම්පජඤ්ඤය උපකාර කරගෙන නාම ධර්ම තේරුම් ගන්නෙ. ලෝකයේ ප්‍රකට නාම ආශ්‍රයෙන් ඒ ඒ ද්‍රව්‍ය නමින් හඳුනාගෙන තිබුණත්, එහෙත්දී

නාම රූපය පිරිසිඳ දැනගැනීම සඳහා ඒ යෝගාවචරයා පාවිච්චි කරන්නෙ අර කියාපු ධර්ම. වේදනා - සඤ්ඤා - චේතනා - ඵස්ස - මනසිකාර. මේවා එක් එක් පුද්ගලයාට විශේෂයි. අර 'පච්චත්තං වේදිතබ්බෝ' කියල කියන්නෙත් ඒකයි. මේ ධර්මය තමන්ම ප්‍රත්‍යක්ෂ කරගත යුත්තක්. තමන්ගෙ නාම-රූප ලෝකය තමන්මයි හඳුනාගන්න ඕන. වෙනකෙනෙකුට හඳුන්වන්න බෑ. වෙන ශාස්ත්‍රීය වචනවලින් ඒක පෙන්නුම් කරන්න බැහැ. එතකොට දුක තියෙන්නෙ මේ නාම - රූප ලෝකයෙයි. බුදුපියාණන් වහන්සේ වදාළ මේ දුක තිබෙන්නෙ අර නොයෙකුත් දෘෂ්ටිගතිකයන් දක්වන විදියට ඒ සම්මත ලෝකයේ නොවෙයි. සම්මුති ලෝකයේ නොවෙයි, මේ නාම - රූප ලෝකයෙයි. 'අච්ඡේච්ඡි තණ්හං ඉධ නාමරූපෙ'[8] කියල එහෙම තියෙනව. එතකොට යෝගාවචරයා විසින් කළයුත්තෙ කුමක්ද - අවසාන බලාපොරොත්තුව කුමක්ද? මේ නාම - රූපය පිළිබඳව තියෙන තණ්හාව කපා හැරීමයි.

මේක උපමාවකින් කියනවනම්, බුදුරජාණන් වහන්සේ හඳුන්වනව 'සල්ලකත්තෝ අනුත්තරෝ'[9] කියල. අනුත්තර වූ ශල්‍ය වෛද්‍යවරයා. ඒ වගේම 'තණ්හාසල්ලස්ස හන්තාරං' කියලත් යොදල තිබෙනව. තණ්හා නමැති උල - විෂ පීය - ඇදල දාන වෛද්‍යවරයා. එතකොට බුදුපියාණන් වහන්සේගේ ධර්මය අනුව අපට පෙනෙනව මේ නාම - රූප කියන එක හරියට වණමුඛය වගෙයි. දැන් විෂ ඊතලයක් වැදුන කෙනෙක් බෙහෙත් බැඳිය යුත්තේ විද්ද එක්කෙනාටවත් දුනුමුඩාවටවත් නොවෙයි අර වණමුඛයටයි. ඉක්සෙල්ල වණමුඛය පාදාගත යුතුයි. එතකොට නාම - රූපය පිළිබඳ පිරිසිඳ අවබෝධයෙන් බලාපොරොත්තු වෙන්නෙ ඇත්තවශයෙන්ම අර තණ්හා උල, තණ්හා විෂ ඊය ඇනිල තිබෙන වණමුඛය පාදා ගැනීමයි. අන්න ඒක සඳහා තමයි අර ලෝක සම්මුතියෙ තිබෙන ඒ වචන කොහොම වෙනස්, ඒ අවබෝධය කොයි අන්දමට තිබුණත්, අර වේදනා - සඤ්ඤා - චේතනා - ඵස්ස - මනසිකාර කියන ඒ ධර්මයන් මතුකරගන්න වෙන්නෙ. අර කුඩා දරුව වගෙයි, නමුත් අඥාන අපේක්ෂාව නොවෙයි. ඤාණසම්ප්‍රයුක්ත විදියෙ උපේක්ෂාවකටයි එයින් යොමුවන්නෙ.

රූපධර්ම පිළිබඳව කල්පනාකර බැලුවත් ඒ විදියෙම දෙයක්. මෙතන තිබෙනව එක්තරා ගැඹුරක්. බොහෝ දෙනෙක් කල්පනා කරන්නෙ - සමහර පරිවර්තන ආදියෙන් බොහෝ දෙනෙක් උපකාර කරගන්නෙ - නාමරූප කියන්නෙ සිතක් රූපයක් කියල. එහෙම නැත්නම් අර භෞතිකවාදීන් කියනව වගෙ සිතක් ද්‍රව්‍යයක්. නමුත් ඒ විදියෙ බෙදීමක් නොවෙයි මේ ධර්මයෙ තිබෙන්නෙ. ප්‍රතීත්‍යසමුත්පාද ධර්මය අනුව බලනවනම් මේ නාම - රූපයත් ප්‍රතීත්‍යසමුත්පාද ධර්මයේ සඳහන්වන එක්තරා කොටසක්. ඉතාමත්ම වැදගත් කොටසක්. මෙතන කියන නාම-රූපය අන්‍යෝන්‍ය ප්‍රත්‍ය සම්බන්ධතාවෙන් බැඳුනු දෙයක්. මේ නාමය හේතුකොටගෙනයි රූපය පවතින්නෙ. ඒ කියන්නෙ අර රූපය හඳුනාගන්නෙ මේ නාමය මුල්කරගෙනයි. දැන් අර දරුව ඵස්ස - වේදනා - සඤ්ඤා - චේතනා - මනසිකාර යන ධර්ම ආශ්‍රයෙන් තමයි අර රූපය - අර බෝලයේ කද

ගතිය, බුරුල් ගතිය ආදිය තේරුම් ගන්නෙ. අන්න ඒ වගේ රූප ධර්ම පිළිබඳවයි මෙතන කියනව 'චත්තාරිච මහාභූතානි චතුන්නං ච මහාභූතානං උපාදාය රූපං' කියල. ඒ සතරමහාභූතයින් පිළිබඳව වැදගත්කම මෙතැන දක්වල තියෙන්නෙ මොන්නිසාද? සතරමහාභූතයින් තමයි රූපයේ ප්‍රාථමික අවස්ථාව. නාමයේ ප්‍රාථමික අවස්ථාව, ඒ කියන්නෙ සම්මුති වශයෙන් ගත්තු නාමයේ ප්‍රාථමික අවස්ථාව, වේදනා - සඤ්ඤා - චේතනා - ඵස්ස - මනසිකාර නම්, ලෝකසම්මත රූපය කියන එකේ ප්‍රාථමික අවස්ථාව තමයි සතරමහභූතයින්. මේ භූතයින් ඇත්ත වශයෙන් ලෙහෙසියෙන් හඳුනගන්න පුළුවන් අය නොවෙයි. ඒක නිසා මේ මහාභූතයින්ගෙ හොල්මන් ගොඩක් වගෙයි මේ රූපසඤ්ඤාව. මෙතන රූප කියල කියන්නෙ ඇත්තවශයෙන්ම රූපසඤ්ඤාව. ඒ බව හෙළිවන එක්තරා ගාථාවකුත් අපි පසුව සඳහන් කරනව. ලෝකයා රූප වශයෙන් ගන්නෙ, රූපය හඳුනගන්නෙ, හඳුන්වන්නෙ මේ සතරමහා භූතයින්ගෙ ගති ස්වරූපය අනුව. ඒකත් නාම ධර්මයන් මුල්කරගෙනයි ලබාගන්නෙ. තද-බුරුල් ගතිය ආශ්‍රයෙන් පඨවිය හඳුනගන්නව. ඝන-දියාරු ගතිය ආශ්‍රයෙන් ආපො ධාතුව හඳුනගන්නව. උණුසුම් - සිසිල් ගතිය ආශ්‍රයෙන් තේජෝ ධාතුව හඳුනගන්නව. සැලෙන - පිම්බෙන ගතිය ආශ්‍රයෙන් වායො ධාතුව හඳුනගන්නව. ඔය විදියට ප්‍රත්‍යක්ෂයටම ගොදුරුකරගන්නවා සතරමහාභූතයින්ගෙ ස්වභාවයන්. ඒ අනුව ඇතිකරගත්තු රූපසඤ්ඤාව තමයි එතකොට මේ පුද්ගලයාගේ ලෝකය. මේ කාරණය වඩාත් පැහැදිලි වෙන ගාථාවක් තිබෙනව.

'යත්ථ නාමං ච රූපංච - අසෙසං උපරුජ්ඣති
පටිඝං රූපසඤ්ඤා ච - එත්ථ සා ඡිජ්ජතෙ ජටා'[10]

ජටා සූත්‍රය කියල වැදගත් සූත්‍රයක් සංයුත් සඟියේම එනවා. ඉතාමත් ප්‍රකට ගාථාවක් එතන තිබෙනව. දේවතාවෙක් බුදුපියාණන් වහන්සේගෙන් විමසනවා.

'අන්තො ජටා බහි ජටා - ජටාය ජටිතා පජා
තං තං ගොතම පුච්ඡාමි - කො ඉමං විජටයෙ ජටං' කියල

මේ ලෝකය පිළිබඳව කියන්න තියෙන්නෙ 'අන්තො ජටා' - ඇතුළතත් අවුලක්, 'බහිජටා' - පිටතත් අවුලක් 'ජටාය ජටිතා පජා' - මේ සත්ව ප්‍රජාව එක්තරා විදියක වෙළුමකින් වෙළිලයි ඉන්නෙ. 'තං තං ගොතම පුච්ඡාමි' - මා අසනවා ගෞතමයෙනි ඔබගෙන්. 'කො ඉමං විජටයෙ ජටං' - මේ අවුල කවුද ලිහන්නෙ කියල. මේකට බුදුපියාණන් වහන්සේ පිළිතුරු දෙනව ගාථා තුනකින්. පළමුවෙනි ගාථාව ඉතාමත්ම ප්‍රකටයි විශුද්ධි මාර්ගයෙ මුලට ගත්තු නිසා.

'සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො - චිත්තං පඤ්ඤඤ්ච භාවයං,
ආතාපී නිපකො භික්ඛු - සො ඉමං විජටයෙ ජටං' කියල.

ඒ කියන්නෙ යම්කිසි භික්ෂුවක් සීලයේ පිහිටල, සමාධිය - ප්‍රඥාව වඩමින්, කෙලෙස් තවන වීර්යයෙන් යුක්තව, ඥානවන්තව උත්සාහ දරනව නම්, එබඳු භික්ෂුවට - ඒ රහතන් වහන්සේට, පුළුවන් මේ අවුල ලිහන්න කියල. දෙවැනි ගාථාවෙන් කියැවෙන්නෙ

'යෙසං රාගො ච දොසො ච - අවිජ්ජා ච විරාජිතා
ඛීණාසවා අරහන්තො - තෙසං විජටිතා ජටා'

කියල. යම් රහතන් වහන්සේලාගේ රාගය - ද්වේෂය සහ අවිද්‍යාව කියන මේ ධර්ම, 'විරාජිතා' මෙතන අමුතු වචනයක් යෙදෙනව. දිගින් දිගට නොකිව්වත්, එතන කියල තියෙන්නෙ සිසින් මකා දමන ලද්දේද, සිසින් සෝදල දමන ලද්දේ ද, එබඳු ඒ රහතන් වහන්සේලා පිළිබඳවත් කියන්න තියෙන්නෙ, උන්වහන්සේලා විසින් ඒ ජටාව - අවුල - ලිහන ලදී, කියන එකයි. තුන්වැනි ගාථාවයි මෙතන අපේ ප්‍රස්තුතයට අදාළ වන්නෙ.

'යත්ථ නාමඤ්ච රූපඤ්ච - අසෙසං උපරුජ්ඣති
පටිඝං රූපසඤ්ඤා ච - එත්ථ සා ඡිජ්ජතෙ ජටා'

මෙතැන කියවෙන්නෙ අර 'පුග්ගලාධිට්ඨාන' වශයෙන් පුද්ගලයන් පිළිබඳව නොවෙයි. ධර්මයක් හැටියට නිර්වාණය පිළිබඳවයි මෙතැන කියවෙන්නෙ. යම් තැනෙක නාමයත් රූපයත්, ඒ වගේම ප්‍රතිඝයත්, රූපසඤ්ඤාවත්, සම්පූර්ණයෙන්ම වළකාලනු ලැබේද: උපරෝධනය වෙයිද: එතැනයි ඒ ජටාව - ඒ අවුල - ලිහෙනු ලබන්නෙ කියන එකයි.

එතකොට මෙතනින් කියැවෙන්නෙත් අර නාමයත් රූපයත්. ඒ වගේම මෙතැන කියවෙන පටිඝය සාමාන්‍යයෙන් ව්‍යවහාරයේ තිබෙන හැටියට ද්වේෂය නොවෙයි මෙතන පටිඝය කියල කියන්නෙ. වෙන සිංහල වචනයක් ගත්තොත් රූපධර්මයන් පිළිබඳව එක්තරා ගැටීමක් තිබෙනව. සමහරවිට නොදැනුවත්වම වගේ යම්කිසි දෙයක හැපුනහම හැරිල බලනව ඒක හඳුනගන්න. ඒ වගේ දෙයක්. එතකොට ලෝකයාට ඇස් තිබුණට - බුදුපියාණන් වහන්සේගේ වචනයෙ හැටියට - ධර්ම චක්ෂුෂයවත් පැදෙනකං ලෝකයා අන්ධයි. එතකොට මේ හැපෙන හැපෙන එක - හැපෙන හැපෙන දෙය - ඒ හැපීමෙන්මයි හඳුනගන්නෙ. 'පටිඝං රූපසඤ්ඤාච' ගැටීමකුත්, ඒ ගැටීම හඳුනාගැනීම් වශයෙන් ඇතිකරගන්න රූප සඤ්ඤාවත්, මේ ගැටුනෙ යම්කිසි තද දෙයක, උණුසුම් දෙයක, බුරුල් දෙයක, ආදී වශයෙන් ඒක පිළිබඳව සඤ්ඤාවක් ඇතිකරගන්නව. මේක ඉතින් ඒ වගේම මෝඩයෝ ගණනක් සම්මත කරගත්තොත් ඒක ලෝක සම්මුතියක් - සත්‍යයක්, මේක තමයි වචනය. යම්කිසි කෙනෙක් යම්කිසි දෙයක 'නම' දන්නවනම්, ඒ තැනැත්තා ඒ දේ දැනගත්ත කියන අවබෝධයකුත් එනව. ඔන්න ඔය විදියෙ පටලැවිල්ලක් තිබෙන නිසා තමයි ලෝකය අවුලක් වෙලා තියෙන්නෙ. ඇත්ත වශයෙන්ම මේක පටලැවිල්ලක්, එහෙම නැත්නම්

වෙළුමක්, එහෙම නැත්නම් අවුලක් හැටියට බුදුපියාණන් වහන්සෙ වදාළෙ මේ නිසයි. මේ නාමයේ තිබෙනව ලෝකයා අවිද්‍යාව කරා ගෙනයන ස්වභාවයක්. අවිද්‍යාව සැඟවිල තිබෙන්නෙ මේ නාමපද තුළයි. එතකොට මේවායින් මිදීමේ මාර්ගයයි මේ විදර්ශනා මාර්ගය.

ඒක නිසා තමයි අර කුඩා දරුව වගේ, ලෙඩා වගේ, සතිසම්පජඤ්ඤයෙන් තමන්ගෙ ඉරියව් පැවැත්වීම් ආදියෙන් බොහොම ලූකයේ අර නාම රූප ධර්ම මතුකර ගන්නෙ. නමුත් වෙනස තිබෙන්නෙ, ඒ විදියෙ ඒ ලෙඩා වගෙ හිටියට, ඇත්තවශයෙන්ම නිරෝගීවෙන්න ගන්න උත්සාහයක්. කුඩා දරුව වගෙ නොදන්නව වගෙ හිටියට ඇත්තවශයෙන්ම බහතෝරන්න දන්නව. බහතෝරන්න දන්න යෝගාවචරය විදර්ශනාව සඳහායි අර විදියෙ ප්‍රයත්නයක් කරන්නෙ. මේ විදියට අපට පෙනෙනව මේ නාම රූප ධර්ම පිළිබඳවත් යම්කිසි ගැඹුරක් තිබෙනව. විශේෂයෙන්ම අර සම්මුතියට සම්බන්ධතාවක් මෙතැන තිබෙනව, නාම කියන වචනයෙ. මෙන්න මේ නාමයෙ අර සම්මුතියට අදාළ සාමාන්‍ය නාම කියන එකට, නාම කියන වචනයටම තිබෙන සම්බන්ධතාව අටුවාවල දෙන අමුතු නිරුක්තියෙන් - අමුතු නැමීමෙන් - යටපත් වෙනව. මේ නිසා සද්ධර්මයේ ප්‍රගතිය ගැන කල්පනා කරල බලනවනම් සමහරවිට කෙනෙකුට සංවේගයක් උපදිනව මෙන්න මේ අර්ථ කථන ගැන.

එතකොට අපි මෙතැන ගතයුත්තෙ, නාමංච රූපංච කියන්නෙ, කෙලින්ම කියනවනම් නාමයත් රූපයත්. ඒක තවදුරටත් තේරුම් ගන්නනම්, පිළිපැදලම තේරුම් ගන්න ඕන, ඵස්ස - වේදනා ආදී ධර්ම මාර්ගයෙන්, ලෝකයා හඳුන්වන නාමයට වඩා ගැඹුරට යාමක් මෙතනින් කෙරෙන්නෙ. එතකොට ඒ නාම - රූපය ගැන එහෙමයි. මෙතෙක් සඳහන් කළ අදහස් සමූහයම, අපි වාක්‍ය දෙකකට හකුළුවල දැක්වුවහොත්, මෙන්න මේ විදියටයි කියන්න වෙන්න.

'නාමරූපයෙහි එන නාමය නාමරූපයකි - නාම ස්වරූපයකි.
නාමරූපයෙහි එන රූපය නාම රූපයකි - නාමමාත්‍ර රූපයකි'

නැවත වරක් :

නාමරූපයෙහි එන නාමය නාමරූපයකි - නාම ස්වරූපයකි.
නාමරූපයෙහි එන රූපය නාම රූපයකි - නාමමාත්‍ර රූපයකි'

එතන අවධාරණය කරන පදය අනුව මෙහෙම කියන්නෙ. එතකොට නාමයේ තිබෙන්නෙ ලෝකසම්මත නාමයේ ප්‍රාථමික අවස්ථාව, සතරමහාභූතයින්ට සම්බන්ධ කරල ගත්තාම, රූපයේ තිබෙන්නෙ රූපයේ ප්‍රාථමික අවස්ථාව. ඒ නාම - රූපය පිළිබඳවයි.

ඒ විදියටම කියන්න සිද්ධවෙනව නිබ්බානය ගැනත්. නිවන ගැනත්. නිවන පිළිබඳවත් ඒ විදියෙම අර්ථකථන ආදියේදී යම්කිසි අමුත්තක් සිද්ධවෙච්ච බව පෙනෙනව. ඉතාමත්ම ප්‍රකටව මේ කාලයේ ව්‍යවහාරවන 'නිබ්බාන' කියන වචනයට දෙන නිරුක්තිය තමයි. 'වානසංඛාතාය තණ්හාය නික්ඛන්තත්තා' එහෙම නැත්නම් 'නික්ඛන්තන්ති'. ඔය ආදි

වශයෙන්. 'වාන නම් වූ තණ්හාවෙන් නික්මුණු නිසා නිවන නම්.' වාන කියල මෙතැන ගන්නෙ වියමනක් හැටියට. ටිකක් දිගට ගිය අර්ථයක්. කලින් අර කරපු නැටීම වගේම එකක්. මේ තණ්හාවේ තිබෙනවාය භවයෙන් භවය එකට ගලපන සවභාවයක්. අන්න ඒක නිසා 'නි වාන' නිබ්බාන. ඔය විදියටයි නිබ්බාන කියන පදයට වැඩියෙන්ම නිරුක්ති දෙන්න පුරුදුවෙල තිබෙන්නෙ. නමුත් අපි සූත්‍ර දේශනා බලනකොට මුල ඉඳල අගටම, මේ විදියෙ නිරුක්තියක් නම් අපට සොයනකටවත් දකින්න ලැබෙන්නෙ නැහැ.

එපමණක් නොවෙයි, මේ 'නිබ්බාන' කියන වචනයෙ තිබෙන නිවීම කියන අර්ථයයි මෙතන ගතයුත්තෙ. ඇත්තවශයෙන්ම ධර්මයේ ජීවය තිබෙන්නෙ ඒ වචනයෙයි. නිතර දෙවේලෙ සජ්ඣායනා කරන රතන සූත්‍රයෙ සඳහන් වෙනව 'නිබ්බන්ති ධීරා යථායම්පදීපො'[11] කියල. ඒ රහතන් වහන්සේලා මේ පහන වගෙ නිවී යනව. නිවී යන පහනක් පිළිබඳ උපමාව ධාතුවිභංග[12] ආදී කොතෙකුත් සූත්‍රවල සඳහන් වෙනව. සමහර අවස්ථාවල සඳහන් වෙනව නිවීයන පන්දමක් ගැන. 'පජ්ජෝතස්සෙව නිබ්බානං විමොක්ඛො චෙතසො අහු'[13] කියල. පන්දමක නිවීම වගේ ඒ සිත නිවුනා කියල. තවත් සමහර තැන්වල ගින්නක නිවීම පිළිබඳව, 'අග්ගිවච්ඡගොත්ත' සූත්‍ර[14] ආදියෙදි බුදුපියාණන් වහන්සෙ ගින්නක නිවීම පිළිබඳ උපමාවයි දක්වන්නෙ. ඉතාම ගැඹුරු අර්ථයක් සරාම ගෙනයනව ඒකෙන්.

ගින්නක් පවතින්නෙ ඒ දරකෝටු ආදිය මුල්කරගෙනයි. එතකොට, දැන් ගින්නක් දල්වෙනකොට, කෙනෙක් ඇහුවොත් දල්වෙන්නෙ කුමක්ද? කියල, අපි මෙයට දියයුතු පිළිතුර කුමක්ද? දල්වෙන්නෙ කුමක්ද? දරද දල්වෙන්නෙ? ගින්නද? දර නිසා ගින්න දල්වෙනව, ගින්න නිසා දර දල්වෙනව. සමහර විට මේක වෙසඳගන්න බැරිනිසා වෙන්න ඇති 'ගින්දර' කියල වචනයක් තියෙන්නෙ. ඉතින් මෙතැනම තිබෙනව 'ඉදප්පච්චයතාව'.

මෙතැන ඉතාමත්ම ගැඹුරු අර්ථයක් තිබෙන බව අපට පේනව. මේ නිවීම කියන වචනයෙ ඉතාමත්ම ගැඹුරු අර්ථයක් තිබෙනව. ඒ නිසාම තමයි 'නිබ්බාන' කියන ඒ තත්ත්වය හැඳින්වීමට පද රාශියක් තියෙන්නෙ. 'අධිවචන' නමින් හැඳින්වෙනව පාළියේ. පෙළින් සොයාගන්න පුළුවන් පර්යාය පද රාශියක් තිබෙනව. ඒව තිස්තුනක් සංග්‍රහ කරල සංයුක්ත සඟියෙ අසංඛත සංයුක්තයෙ[15] දක්වල තිබෙනව. නමුත් මේවා අතරින් නිබ්බාන කියන පදය තමයි ප්‍රධාන. මුල් කාලයේදීම ඊට ප්‍රධාන තැනක් ලැබුණේ මේ ගින්න පිළිබඳ උපමාව සිහිගන්වන නිසයි. එතැනම තියෙනව ලෝකයා අසන ප්‍රශ්නවලට පිළිතුරු රාශියක්.

වච්ඡගොත්ත පරිබ්‍රාජකයා බුදුපියාණන් වහන්සේට චෝදනා කළා. ඒ වගේම තවත් බොහෝ තැන්වල තිබෙනව උච්ඡේදවාදයක්ය කියන චෝදනාව. මේ නිවන, බුදුපියාණන් වහන්සෙ දේශනා කරන ඒ උසස්

සත්ත්වය, ඇත්තවශයෙන්ම උච්ඡේදයක්ය කියල. 'සතො සත්තස්ස උච්ඡේදං විනාසං විභවං පඤ්ඤපෙති'[16] කියල. ඇත්තාවූ - සත්‍ය වශයෙන්ම සිටිනා වූ - සත්ත්වයකුගේ උච්ඡේදයක් දක්වනව කියල. බුදුපියාණන් වහන්සෙ ඊට පිළිතුරු දුන්නෙ මේ ගින්න උපමාවට අරගෙන. දන් නුඹ ඉදිරියේ ගින්නක් දල්වෙනව මේ දරකෝටු නිසා. එතකොට දන්නව නේද මේ ගින්න දල්වෙන්නෙ වෙන දෙයක් නිසා නොවෙයි. මේ දරකෝටු නිසා බව. මේව උපාදාන කරගෙනයි. ඒ ඇරෙන්න ගින්නක් කියල අමුතු දෙයක් නැහැ. එතකොට මෙතනම තිබෙනව ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මය. 'යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධ ධම්මං' මේ විදියට දල්වෙන ගින්න, අර හේතු ප්‍රත්‍ය - ඊට උපකාර වුණු දර - ඉවර් කළාම, එහෙම නැත්නම් දර අවසන් උනාම ඒ ගින්න නිවෙනව. තව දූරටත් ඒකෙ ගැඹුර තේරුම් ගන්න පුළුවන්. දර පිළිබඳව මේ 'උපාදාන' වචනය යෙදෙනව සාමාන්‍යයෙන් ඉන්ධන ද්‍රව්‍ය වලට. ඉන්ධන ද්‍රව්‍ය කියන්නෙ ගින්නක් දල්වීමට උපකාරීවන දර ආදී දේවල්. 'උපාදාන පච්චයා භවො' - මේ පටිච්චසමුප්පාද ධර්මයේ ඉතාමත්ම වැදගත් අංග දෙකක්, සන්ධිස්ථානයක්. එතකොට මේ භවය - භවය කියන්නෙ - ලෝකයා සිතන භවයක් තිබෙනව: භවතෘෂ්ණාවට යටවුණු ශාස්වතවාදීන් මේ භවය සත්‍ය වූ දෙයක්, මේක යම්කිසි හරයක් තිබෙන දෙයක් හැටියට, නිත්‍ය දෙයක් හැටියට කල්පනා කරනව. බුදුපියාණන් වහන්සෙ මේ භවය පිළිබඳව දක්වුවෙ කොහොමද? මේ භවය ගැන කියන්න තියෙන්නෙත් ගින්න ගැන කියන දේමයි, කියන එකයි. ඒ කියන්නෙ 'උපදාන පච්චයා භවො' අල්ලා ගන්න දෙයක් තියෙන තාක් පැවැත්මක් තියෙනව. මේ දරවලට උපාදාන කියන වචනය යොදන්නෙ ගින්න දර අල්ල ගන්න නිසා. ගින්න දර අල්ලගන්නව, දර ගින්න අල්ලගන්නව. මෙතනම තමයි ඉදප්පච්චයතාව, ඒ විදියෙ පැවැත්මක් මෙතන තියෙන්නෙ. එතකොට පැවැත්ම කියල කියන්නෙ ඒකාන්ත සත්‍ය දෙයක් නොවෙයි. වෛදික යුගයෙ ඉදලම තිබුන 'සත්' - 'අසත්' කියල දෙකක් ගැන ගැටළුවක්. 'සත්' වලින් 'අසත්' ඇති වුනාද? 'අසත්' වලින් 'සත්' ඇති වුනාද? කියල 'කථං අසතො සත් ජායෙථ' අසත් වලින් සත් ඇතිවන්නෙ කොහොමද? ඔය විදියෙ ගැටළු මුල් කාලයෙ ඉදලම තිබුනා. 'නාසදාසීත් නො' සදාසීත් තදානීම්'[17] ආදී වශයෙන් වෛදික ග්‍රන්ථ වලත් තියෙනව මුල්ම කාලයෙ සත් තිබුනෙත් නැත. අසත් තිබුනෙත් නැත, කියල, මේක සමහර විට මේක මැවූ එක්කෙනා දන්නව ඇති කියල, ඔය විදියෙ මහා පටලැවිල්ලක් හදාගෙන තිබුන මේ 'සත්' - 'අසත්' කියන වචන දෙක මුල්කරගෙන.

බුදුපියාණන් වහන්සෙ විතරයි මේ සියලුම ධර්මවලට වෙනස් අඳමේ, පුදුම අඳමේ විග්‍රහයක් දුන්නෙ භවය පිළිබඳව. මේ භවය කියල කියන්නෙ අන්න අර ගින්න වගේම දෙයක්. උපාදානයක් ඇතිතාක් භවය පවතිනව. උපාදානය නැතිවුන හැටියෙ භවය නිරුද්ධ වෙනව. එතකොට මෙතැනම තිබෙනව - මේ ගින්න පිළිබඳ උපමාවෙම - පිළිතුර, අර නිතර අහන ප්‍රශ්න වලට. 'අව්‍යාකෘත වස්තු' වශයෙන් ධර්මයේ සඳහන් වෙනව ප්‍රශ්න දහයක්. එයින් අග ප්‍රශ්න හතර - තථාගතයන් වහන්සේ මරණින් මතු

සිටිනවාද? නැද්ද? ආදී වශයෙන්. ඒ ඇසූ සතරාකාර ප්‍රශ්නයට පිළිතුරුත් මෙතැන තිබෙනවා. අර ගින්න කොහෙද ගියෙ කියල. මේක සාමාන්‍ය ව්‍යවහාරයක්. 'නිබ්බුතොති සඞ්ඛං ගච්ඡති' බුදුපියාණන් වහන්සේ අග්ගිවච්ඡගොත්ත සූත්‍රයේ ඒ ගින්න පිළිබඳ උපමාවේදී අවසාන වශයෙන් ප්‍රකාශ කළේ 'නිබ්බුතොති සඞ්ඛං ගච්ඡති' ගින්න නිවුනාට පස්සෙ කියන්න තිබෙන්නෙ - ඒක ගණන්ගනු ලැබෙන්නෙ, සංඛ්‍යාවට වැටෙන්නෙ - 'නිබ්බුතො' (නිවුනා) කියලයි.

එතකොට 'නිවී ගියේය' කියන එකේ 'අර ගියේය' කියන වචනය තිබෙන නිසා, නිවිල කොහෙද ගියේ? කියන එකයි සාමාන්‍ය ලෝකයා අහන්නෙ. මේක නැගෙනහිරටද, දකුණටද, බටහිරටද, උතුරටද, උඩටද යටටද ගියේ? කියල අන්න අර වචනය අනුව යනව. අන්න අර නාම ධර්ම පිළිබඳ අවබෝධයක් නැතිකම නිසාමයි. ඒ 'නිවී ගියේය' කියන වචනය ඔස්සෙ යන අවස්ථාවේදී බුදුපියාණන් වහන්සේ පෙන්නුම් කරනව, ඇත්ත වශයෙන්ම මේ ගින්න ගැන කල්පනා කළාම අර තමන් අසන ප්‍රශ්නයෙ මෝඩකම පේනව කියන එක. ගින්න නිවුනාම කොහෙද ගියෙ කියලා ඇහුවාම ඒකට පිළිතුරු දෙන්න බැරිවුනේ අර සංකල්පවල තිබෙන අඩුපාඩුව නිසයි. ඔන්න ඔය විදියට නිබ්බාන කියන එකේ ඉතාමත් ගැඹුරු අර්ථයක් තිබෙනව.

'අච්චී යථා වාතවෙගෙන ඛිත්තා - අත්ථං පලෙති න උපෙති සඞ්ඛං'[18] ගිනිසිල පුළඟින් නිවුනට පස්සෙ, ඒක අස්තයට ගියා කියල කියනව මිසක්, ඒ පිළිබඳ ප්‍රමාණ කිරීමක්, ප්‍රඥප්ති යෙදීමක් කළහැක්කෙ නැහැයි කියල, ඔය විදියට එතකොට නිබ්බාන කියන වචනයෙ ඉතාමත්ම ගැඹුරු අර්ථයක් තිබෙනව. මේ ගැඹුරු අර්ථය ක්‍රමක්‍රමයෙන් යටපත් වුනු බවයි අපට පේන්නෙ. මේකට අමුතු නිරුක්තියක් දීමට යම්කිසි හේතුවක් - රහසක් - තිබෙන්න පුළුවනි. මේ නිබ්බාන කියන පදයෙ නිවීම කියන එක ගැන මදිකමක් ඇතිවෙන්න ඇති. ඒකට හේතුව හිතාගන්න පුළුවන්. බොහෝවිට අපේ අටුවාචාරීන් වහන්සේලාට ජීවත්වෙන්න සිද්ධ උනෙ බ්‍රාහ්මණයින්ගෙ මහා ගැඹුරු තර්ක මධ්‍යයේයි. ඔවුන් නිතරම මේ ධර්මයට එල්ල කළ ප්‍රහාරය තමයි මේක උච්ඡේද වාදයක් කියන එක. මේ උච්ඡේදවාද චෝදනාවෙන් ගැලවීමට නම්, මේ නිවන ටිකක් ලස්සන කරගන්න ඕන. මේක නිවීම කියන එක මදි. නිකම්ම නිවීමක් කිව්වාම ඒකේ මොකක්දෝ අඩුපාඩුවක් තිබෙනව. ඒක නිසා මේක ටිකක් කෙළින් කරල ගන්න ඕන.

'නිබ්බානං ආගම්ම රාගාදයො පහීයන්ති' ආදී වශයෙන් ඊළඟට අමුතු නිරුක්ති ක්‍රමයක් පටන් ගත්ත. 'නිවනට පැමිණ' - 'ආගම්ම' කියල එතන යොදාගන්නෙ නිවනට අරමුණු කිරීම් වශයෙන් පැමිණුනාම - මේ කෙලෙස් නැතිවෙනව කියලයි. ඔන්න ඔතන විශාල ගැටළුවක් තිබෙනව. අපට ඉදිරියට හමුවන ඒ සූත්‍ර පිළිබඳව දුරවබෝධයට හේතුවත් ඔතැනයි. අටුවා යුගයෙන් අනිකුත් ඒ උගතුන් කල්පනා කරන්නෙ මේ නිවන කියන එක සත්‍යවශයෙන්ම ඇත තියෙනව. අපෙන් අහන්න එපා කොහේද කියල.

අසවල් තැනයි කියල කියන්නත් බැහැ. ඒ වගේම හැම තැනම තියෙනව. මේ කියන මේ ගුඪ ධර්මය - ඇත්ත වශයෙන්ම 'නිවන' ගුඪ ධර්මයක් බවට පත්වුනා - මේ ගුඪ ධර්මය දක්කාම කෙලෙස් ඉබේම නැතිවෙල යනව. ඔන්න ඔහොම තත්වයකුයි මෙතැන දක්වන්න උත්සාහ කරන්නෙ.

ථෙර - ථෙරී ගාථා ආදී ග්‍රන්ථවල ඒ ධර්මය ප්‍රත්‍යක්ෂ කළ තෙර - තෙරණියන් වැනූ උදානය මොකක්ද? 'සීතිභූතොස්මි නිබ්බුතො'[19] අහන කොටස් සිසිල් වන විදියෙ පද දෙකක්. 'සිසිල් වූයේ වෙමි - නිවුනේ වෙමි.' නමුත් මේ වචනයෙ මදිකමක් පසුකාලීන උගතුන්ට පෙනුන. මේ නිවීම සිදුවන්නෙ යම්කිසි සන්තානයක, අජටාකාශයේ නොවෙයි. ඒ සන්තානයෙ නිවීම උනානම් එක මොහොතක් ජීවත් වුනත් අවුරුදු සියයක් ජීවත් වුනත් නිවීම පිළිබඳ ඒ සැපය, ඒ සන්සිඳීම, ඒ පුද්ගලයා විඳිනව. අන්න ඒක තමයි 'ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා'[20] කියල රතන සූත්‍රයෙ සඳහන් වෙන්නෙ. වියදම් කරන්නෙ නැතිව ලබාගන්න පුළුවන් ඒ නිබ්බුතිය, ඒක භුක්ති විඳින්න පුළුවන් නිබ්බුතියක්, නිවීමක්. වියදමක් නැතිව භුක්ති විඳින්න පුළුවන් නිවීමක් ලබාගත්තු අය තමයි රහතන් වහන්සේලා.

ලෝක සම්මත වශයෙන් බලනවනම් නිවීම කියනකොට උච්ඡේදයක්. එතැනින් එහාට මොකක්වත් නැහැ කියන හැඟීමකුත් එනව. ඔන්න ඕක නිසා තමයි අර 'නිබ්බානං පන ආගම්ම රාගාදයො පහීයන්ති' කියන්නෙ. එහෙම නැත්නම්, සමහර අවස්ථාවල තෝරනව නිවන දුටුවහම තමයි තණ්හාව ක්ෂය වන්නෙ කියල. නිවන කියන්නෙ මොකක්ද කියල ඇහුවාම - එක පැත්තකින් තෝරනව 'තණ්හාවෙන් නික්මුණු නිසා නිවනයි.' අනික් පැත්තට තෝරනව 'නිවන දක්කාම තමයි තණ්හාව නැතිවෙන්නෙ.' එතකොට මේ දෙකින් මොකක්ද ගන්නෙ ඉදිරියට, කියන එක අපට ප්‍රශ්නයක් වෙන්න පුළුවන්. පරස්පර විරෝධී බවක් මෙතැන තියෙනව. තණ්හාවෙන් නික්මුණු අර්ථයෙන් මේක නිවන වෙනව. ඊළඟට ඒ නිවන කියන එක ඈත දක්කාම - හරියට අර එළියක් වගේ දක්කහම - ඔන්න තණ්හාව නැති වෙනව. නමුත් බුදුරජාණන් වහන්සෙගෙ ධර්මය පැහැදිලිවමයි තියෙන්නෙ. බුදුපියාණන් වහන්සේම බ්‍රාහ්මණාදීන්ට එල්ලකළ උපමාවක් තමයි, නොපෙනෙන ප්‍රාසාදයකට ඉණිමගක් තැනීම.[21] අන්න ඒ වගේ දේකට අපේ මේ ධර්මයත් යොමුවෙච්ච බව පේනව. ධම්මචක්කප්පවත්තන සූත්‍රයෙම ඉතාමත් පැහැදිලිවම තිබෙනව තුන්වෙනි ආර්ය සත්‍යය. දෙවන ආර්ය සත්‍යය හැටියට තණ්හාව ගැන කියල, ඊළඟට 'තස්සායෙව තණ්හාය අසෙස විරාග නිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො'[22] කියල ඔය විදියට පැහැදිලි වචනයෙන් සඳහන් කරනව, 'එම තණ්හාවගේම නිරවශේෂ ප්‍රහාණය, විරාගය, නිරෝධය, අත්හැරීම,' ඔය ආදී වශයෙන් දක්වනව. එහෙම කියල තියෙන්නෙ මේ තියෙන දුඃඛස්කන්ධය නැති කිරීමමයි නිවන - 'තණ්හක්ඛයො. නමුත් අටුවාව මේක පිළිගන්න මදිකමක් දක්වනව. අටුවාව කියනව 'න ඛයමත්තමෙව නිබ්බානං' - ක්ෂය මාත්‍රය නිර්වාණය නොවේ - නමුත් අපට පේනව

'තණ්හක්ඛය' කියන එකේ තිබෙන සැපත රහතන් වහන්සෙල පමණයි දන්නෙ. ඒක නිසා තමයි අර උදාන පාළියෙ සඳහන් වෙන්නෙ,

'යං ච කාමසුඛං ලොකෙ - යඤ්චිදං දිවියං සුඛං
තණ්හක්ඛය සුඛස්සෙතෙ - කලං නාග්ඝන්ති සොළසිං'[33]

කියල.

'ලෝකයේ යම්කිසි කාම සුඛයක් තිබෙනව නම්, යම් දිව්‍යමය සුඛයක් තිබෙනව නම් තණ්හාව ක්ෂය කිරීම කියන ඒ සැපයෙන් අර කියාපු සැප, දහසයෙන් පංගුවක්වත් වටින්නෙ නැහැ කියල කියෙනව. ඒ වගේම උදාන පාළියෙ බොහෝවිට දක්වන ගාථා ඉතාමත්ම ගැඹුරුයි. ඒක හිතාගන්න පුළුවන්. උදාන කියල කියන්නෙ ප්‍රීති වාක්‍ය. සාමාන්‍යයෙන් ප්‍රීතිවාක්‍ය එන්නෙ සැනසුම් හුස්ම වගෙ බොහොම ගැඹුරකින්. සාමාන්‍යයෙන් කථාන්තරයටත් වඩා ඈතට විහිදී යන අර්ථයක් තියෙනව උදාන පාළියෙ එන ගාථාවල. එබඳු එක ගාථාවක් බුදුපියාණන් වහන්සෙ ප්‍රකාශ කරනව ආනන්ද හාමුදුරුවන්ට,

'කිං කයිරා උදපානෙන - ආපා චෙ සබ්බදා සියුං
තණ්හාය මූලතො ඡෙත්වා - කිස්ස පරියෙසනං චරෙ'[34]

මේක අපට තේරෙන භාෂාවෙන්ම පරිවර්තනය කළොත් 'කිං කයිරා උදපානෙන - ආපා චෙ සබ්බදා සියුං හැමදාම වතුර තියෙනව නම් ළිඳක් මොකටද? 'තණ්හාය මූලතො ඡෙත්වා' 'තණ්හාව මුලින් සින්දට පස්සෙ, 'කිස්ස පරියෙසනං චරෙ' තවත් මොකක්ද සොය සොය ඇවිදින්න තියෙන්නෙ? එතකොට මේ තණ්හාව ක්ෂය කිරීම නිකම්ම 'ක්ෂයයක්' නොවෙන බව අපට මෙතැනින් පෙනෙනව, මේ තෘෂ්ණාව ක්ෂය කළානම් යම්කිසි සන්තානයක - මෙතන තණ්හාව කියන්නෙ මොකක්ද? පිපාසය. ඒකම තමයි නිවනට සමහර තැන්වල යොදල තියෙන්නෙ 'පිපාස විනයො' කියල - පිපාසය සන්සිඳුවා ගන්න. පිපාසය සන්සිඳුවා ගන්න කෙනෙකුට වතුර පොවන්න යාමක් වැනි වැඩක් මේ තණ්හාව ක්ෂය කිරීම මදියි කියන එක. ඒ විදියෙ අදහසකුයි දෙන්න යන්නෙ. නමුත් මේ තණ්හක්ඛයම ඉහලම සැපතයි. පිපාසය සන්සිඳුන නම් යම් පුද්ගලයකුගෙ, ඒ පුද්ගලයා ආවර්ජනය කරනකොට ලෝකයා පිපාසයෙන් දුවනව දකින කොට, ඇතුළත බැලුවාම ප්‍රත්‍යවේක්ෂා මාත්‍රයෙන්ම පේනව අනේ මට පිපාසයක් - තිබහක් - නැහැනේ. මේක තේද ලෝකෙ ඉහළම සැපත කියල.

මේවගේ මොකක්ද 'අභාව' බවක්, මදිකමක්, අපේ උගතුන්ට පෙනුන නිසා වෙන්න ඇති මේ තණ්හක්ඛය කියන වචනයට ටිකක් පසුබාන්නෙ. මෙබඳු වචන ගණනක් ඉදිරිපත් වන හැම අවස්ථාවකම අටුවාචාරීන් වහන්සේලා බොහොම උත්සාහවත් වෙලා අර 'ආගම්ම' පදේ යොදනව. 'තං ආගම්ම' 'නිබ්බානං ආගම්ම' - ඔය ආගම්ම කියන පදේ නිතර යෙදෙනව. මෙතැන ව්‍යාකරණානුකූලව එක්තරා ගැඹුරු හේතුවක් තිබෙනව. කෙටියෙන්, අපට තේරෙන භාෂාවෙන් - මෙතැන අප අවබෝධය මුල්කරගෙනයි දේශනා කරන්නෙ - ව්‍යාකරණානුකූලව බලනවනම් මේ 'ආගම්ම' කියන පදය උපකාරක අර්ථයේ යෙදෙන අවස්ථාවල් තිබෙනව.

අපේ සිංහල භාෂාවෙත් ඔය විදියෙ වචන තියෙනවා. සමහර ප්‍රාදේශීය භාෂාවල තිබෙනවා 'එයා ඇවිල්ල නුවර කොහොත් තියල.' මෙතනදී අපි අර 'ඇවිල්ල' කියන වචනය තේරුම් ගන්න උත්සාහ ගන්නෙ නැහැ. ඒක මේකට ආධාර කරගන්න යොදාගන්න වචනයක්. ඒ වගේ තමයි 'තියල හිටන්' කිව්වහම 'හිටන්' කියන වචනය තෝරන්න යන්නෙ නැහැ.

ඔන්න ඔය විදියට 'ආගම්ම' කියන පදය පාළිභාෂාවේ එක්තරා විදියක උපකාරක අර්ථයක් දනවනවා පමණයි. නමුත් මේ වගේ එකක් උපකාර කරගෙන නිබ්බාන කියන එක වෙන්කළා - ඈත් කළා - අර තණ්හාවෙන්. ඔන්න ඔහොම දෙයක් සිද්ධ වුනා. ඇත්තවශයෙන්ම මෙතැන කියැවෙන්නෙ, රාගාදි ක්ලේශ. මේ හැම එකක්ම ගින්නක්. බුදුපියාණන් වහන්සෙ වදාළෙ 'භව නිරෝධය නිවන' බවයි. නිවන කියන්නෙ භව නිරෝධය පිළිබඳ ප්‍රත්‍යක්ෂයයි. භවයම එකළොස් ගින්නක්. එනකොට මුළු භවයමත් ගින්නක්. තණ්හා, රාග, ද්වේෂ, මෝහ, ඕවත් ගිනි. මේ හැම එකක්ම ගිනි. ඒ නිසා මේකට 'නිවීම' කියන වචනය තමයි හොඳටම ගැළපෙන වචනය. නිවාගත්තට පස්සෙ තවත් මොකක්ද ඕන කරන්නෙ? නමුත් මේ කාරණය තෝරගන්න බැරුවදෝ, මොන හේතුවකින් හෝ, මොන අවාසනාවක් නිසාදෝ, අපේ බුද්ධඝෝෂ ස්වාමීන් වහන්සේ ඒ සාරත්ථප්පකාසිනී අටුවාවෙත්,[25] විසුද්ධි මාර්ගයෙත්,[26] ඔක්කෝටම වඩා 'සම්මෝහ විනෝදනියෙත්', ග්‍රන්ථනාමයටත් ගැලපෙන්න නැති හැටියට විතණ්ඩවාදියෙක් ඉදිරිපත් කරගෙන නිවන පිළිබඳව දීඝ විවරණයක් කරල තිබෙනවා. එතැන අටුවාචාරීන් වහන්සේලාම ඉතාම ඕළාරික තර්කයකුත් ඉදිරිපත් කරල තිබෙනවා. සමහරවිට ඒක ධර්මගෞරවයටත් එතරම් හොඳ නැති වෙන්න පුළුවන්.

අර විතණ්ඩවාදියා ඉදිරිපත් කරන හැටියට කියනවා, මේ 'නිවීම' කියන්නෙ රාගක්ඛය, දොසක්ඛය, මොහක්ඛයමය කියල. ඇත්ත වශයෙන්ම විතණ්ඩවාදිය කියන්නෙ බුද්ධ වචනයයි. සූත්‍ර දේශනාවල කොතෙකුත් සඳහන් වෙනවා නිබ්බානයට අධිවචනයක් වශයෙන් 'රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයොති ඉදං වුච්චති නිබ්බානං'[27] කියල. මේ රාගක්ඛය, දොසක්ඛයො, මොහක්ඛය කියන පද තුනම බොහෝ සූත්‍රවල යෙදිල තිබෙනවා නිවනට අධිවචන වශයෙන්. නමුත් අටුවාචාරීන් වහන්සේ පළමුවෙන්ම මේක අධිවචන තුනක් කරගන්නවා. රාගක්ඛයො කියන්නෙ එක අධිවචනයක්, දොසක්ඛයො කියන්නෙ තව අධිවචනයක්, මොහක්ඛයො කියන්නෙ තව අධිවචනයක්. ඊළඟට අර කාල්පනික විතණ්ඩවාදිය ඉදිරියට අරගෙන ඒ පුද්ගලයාට පෙන්නුම් කරනවා, නිවන කෙලෙස් නිවීම් මාත්‍රයක් නම් රාගාදිය නිවීම් මාත්‍රයක් නම් - මේක හරියට අර තිරිසන් සතුන්ගෙ කෙලෙස් නිවාගැනීම් වගේය කියල. තිරිසන් සතුන් හෝ කෙලෙස්වලට වසඟ වූ අය හෝ කෙලෙස් නිවාගැනීම සඳහා ඒවට උපකාරවන වස්තූන් ප්‍රතිසේවනය කරනවය, අන්න ඒ විදියෙ දෙයක්ය, මෙහෙම ගත්තොත් නිවන. මෙතැන ඉතාමත්ම ගැඹුරු ශාසනික අර්ථයක් යටපත් වෙලා තිබෙනවා. බුදුපියාණන් වහන්සෙ වදාළ, මේ ලෝකයේ කෙලෙස් නිවාගන්න

ලෝකයා, සිරිසත් සතුන් පමණක් නොවෙයි මනුෂ්‍යයින් පවා, ඒ රාගාදි කෙලෙස් නිවාගැනීමට ගන්න උත්සාහය මාගන්දිය සූත්‍රයේ[28] දක්වල තිබෙන හැටියට අඟුරු වලක් ළඟ කුෂ්ට රෝගියෙක් ඉඳගෙන තමන්ගෙ වේදනාවල් නැතිකර ගන්න දරන උත්සාහයක් වගේය කියල. කුෂ්ට රෝගියා එතැන ඉඳගෙන මොකද කරන්නෙ? නිවාගන්න එක නොවෙයි කරන්නෙ තවාගන්න එක. රත්කර කර තවාගන්නව.

එතකොට මේ ලෝකයේ සත්වයා, අර කියාපු සෝණ සිගාලාදි සතුනුත්, අනෙකුත් අයත් කරන්නෙ මොකක්ද? නිවාගැනීම වෙනුවෙට තවා ගැනීමයි කරන්නෙ. ඒ තවාගැනීම උපමාකරන්න බැහැ රහතන් වහන්සේලාගෙ මේ නිවා ගැනීමට, මේ නිවීමට. 'නිබ්බුතිං භුඤ්ජමානා' මේ නිබ්බුතිය ඒ විදියෙ තාවකාලික නිවීමක් නොවෙයි. මේ නිවීම තමා ළඟ හැමදාම තියෙනව සන්තානය දිහා බැලුවාම. උපමාවට තියෙන්නෙ අතපය කපාපු කෙනෙක් ප්‍රත්‍යවේක්ෂා පමණින් තමාගේ අතපය නැතිබව දන්නව වගෙ.[29] ආශ්‍රවයන් ක්ෂය කළ රහතන් වහන්සේ ඒ පිළිබඳ ප්‍රත්‍යවේක්ෂා මාත්‍රයෙන්ම තමන් ලබාපු විමුක්තිය පිළිබඳව 'අහො සුඛං' කියල කියන තරම් ප්‍රීතියකින් බලනව. අන්න ඒ විදියෙ නිබ්බුතියක්. ඒක නිසා තමයි 'නිබ්බුතිං භුඤ්ජමානා' - එතැන භුක්ති විඳින්න පුළුවන් නිබ්බුතියක්. මේ වගේ අදහස් රාශියක් යටපත් වුන මේ විදියෙ තර්ක සමූහයකින්. ඇත්තවශයෙන්ම, මේ දේශනා මාලාවට මා යම්කිසි විදියකින් ඉදිරිපත් වෙන්න කැමැති උනානම්, කැමති උනේ අතිගරු මහෝපාධ්‍යාය මාහිම්පාණන් වහන්සේ මට කළ ආරාධනාව නිසාත්, අනික අපේ ගරු සබ්‍රහ්මචාරීන් වහන්සේලාට මෙයින් යම්කිසි සේවයක්, ශාසනයට සේවයක් ඉටුවේවා කියන අදහස නිසාත්. ඊළඟට අනිත් කාරණය ඇත්ත වශයෙන්ම ධර්ම සංවේගයක් මේ විදියෙ විවරණ නිසා මට ඇතිවුනා.

මෙතැන කියවුනෙ 'නිබ්බාන' කියන වචනය පිළිබඳවයි. මේ නිවීම - නිවන - පිළිබඳව සඳහන් වන සූත්‍ර රාශියක් ඉදිරියටත් තියෙනව දක්වන්න. නමුත් ඒවා ඉදිරියට ගැනීමට කලින් මේ මූලික කරුණු ටික ප්‍රකාශ කළේ මෙතැන මේ නිබ්බාන කියන වචනයේ තිබෙන 'නිවීම්' අර්ථයෙහි ප්‍රතීත්‍ය සමුත්පාදයට සම්බන්ධ වූ ගැඹුරු අර්ථ රාශියක් තිබෙන බව පෙන්වාදීමට. අර වාන ආදී වචන ලංකර ගැනීම නිසා වැදගත් අර්ථ රාශියක් යටපත් උනා. බුදුපියාණන් වහන්සෙ දේශනා කළේ 'දුක්ඛ නිරෝධො නිබ්බානං.' බොහෝ තැන්වල පෙන්නුම් කරන්නෙ මේ දුක නිරෝධ කිරීම නිවන බවයි. එහෙම නැත්නම් 'තණ්හක්ඛයො.' මේකට නොයෙකුත් වචන යොදල තිබෙනව. ඒ හැම තැනකින්ම පෙන්නුම් කරන්නෙ, ඒව අධිවචන හැටියට දක්වනව නම්, ඒවට තවත් අමුතුවෙන් සක්කපද අවශ්‍ය නැති බවයි. අධිවචන සමූහයක් දුන්නට පස්සෙ, ඒ අධිවචන වලින් එකක් වෙන්කරගෙන, අනිත් ඒව පැත්තකට කරල, ඒක හමුවෙන හැම තැනකම 'ආගමම' ආදි සක්ක පදයක් යෙදීම අවශ්‍ය වෙන්නෙ නැහැ. අන්න එබඳු තත්වයක් තිබෙන්නෙ. තවත් වැදගත් කාරණයක් තිබෙනව. මේ නිවන ඇත්තවශයෙන්ම බ්‍රහ්මචරියටම අයිති දෙයක්. ඒක නිසා තමයි

'බ්‍රහ්මචරියපරියොසානං' කියල කියන්නෙ. මේ ශාසන බ්‍රහ්මචර්යාව පුරල ඉවර වෙනකොට නිවන එතැනමයි. රාධ සංයුක්තයෙ - රාධ ස්වාමීන් වහන්සේ බුදුපියාණන් වහන්සේගෙන් එක්තරා ප්‍රශ්න මාලාවක් ඇහුව.[30]

'සම්මාදස්සනං පන භන්තෙ කිමත්ථියං' මේ සම්‍යක් දර්ශනය කුමක් සඳහාද? 'සම්මාදස්සනං පන රාධ නිබ්බිදත්ථං' මේ සම්‍යක් දර්ශනය නිබ්බිදාව සඳහායි. ඒ කියන්නෙ සම්‍යක් දර්ශනය උපකාර කරගන්නෙ සසර කලකිරීම කියල කියන නිබ්බිදාව සඳහාය කියන එකයි. ඊළඟට විමසනව නිබ්බිදාව කුමක් සඳහාද? 'විරාගය සඳහායි' කියල බුදුපියාණන් වහන්සෙ පිළිතුරු දෙනව. 'විරාගය කුමක් සඳහාද' කියල අහනව. 'විරාගය විමුක්තිය සඳහායි' කියල පිළිතුරු දෙනව. 'විමුක්තිය කුමක් සඳහාද' කියල අහනව. 'විමුක්තිය නිබ්බානය සඳහාය' කියල පිළිතුරු දෙනව. එතකොට රාධ ස්වාමීන් වහන්සෙ අහනව 'නිබ්බානං පන භන්තෙ කිමත්ථියං' නිවන කුමක් සඳහාද? ඊට බුදු පියාණන් වහන්සේ දෙන පිළිතුර, 'අච්චසරා රාධ පඤ්හං නාසක්ඛි පඤ්හස්ස පරියන්තං ගහෙතුං නිබ්බානොගධං හි රාධ බ්‍රහ්මචරියං නිබ්බානපරායණං නිබ්බානපරියොසානං'. ඒ කියන්නෙ, 'රාධ, තුඹ මේ ප්‍රශ්නවල සීමාව ඉක්මෙව්ව. මේ ප්‍රශ්නවල කෙළවර අල්ලගන්න බැරිවුනා. ඒකයි ඔය විදියෙ ප්‍රශ්නයක් ඇහුවෙ.' මේ ශාසන බ්‍රහ්මචරියාව නිවනෙහිම ගැලී තිබෙනව. නිවනෙහිම ගිලිල වගේ තිබෙනව. එහෙම නැත්නම් 'නිවනේ බැසගත්' කියල කියන්නත් පුළුවන්, හරියට ගංගාව මුහුදට ගලායන්න වගේ. නිවනම පරම නිෂ්ඨාව කරගෙන තිබෙනව. අන්න ඒක නිසා තමයි අර දෙවඟනන් බලාපොරොත්තුවෙන් මහණ උන නන්ද හාමුදුරුවො දන්නෙම නැතුව වගේ රහත් උනෙ. අන්තිමට ඇවිත් බුදුපියාණන් වහන්සෙ නිදහස් කළා ඒ පොරොන්දුවෙන්. මේ මක් නිසාද? සාසන බ්‍රහ්මචරිය සම්පූර්ණ වෙනකොට නිවන ලැබිල ඉවරයි. අඩාලව කළොත් තමයි දිව්‍යලෝකෙ යන්න පුළුවන් වෙන්නෙ. ඒක නිසා මේක නිසර්ග සිද්ධ විදියෙ ප්‍රතිඵලයක්. මේකට ආයිත් 'ආගමම' එකක් - ඇසින් දකින දෙයක් අවශ්‍ය නැහැ. මේ ආර්යාෂ්ටාංගික මාර්ගය යම් අවස්ථාවකදී සම්පූර්ණ කළානම්, එතැනම නිවන.

දැන්, විභාගයකට උත්තර ලිව්වට පස්සෙ නම් ප්‍රතිඵල එනකං පාස්වෙනකං බලාගෙන ඉන්නව. ඒ විදියෙ දෙයක් නොවෙයි මෙතන තියෙන්නෙ. මෙතැන විභාගයට ලියපු හැටියෙ විභාගයෙන් පාස්, සහතිකයත් එතැනමයි. ඒක නිසා තමයි අර 'අඤ්ඤා' කියල යොදන වචනයක් තියෙන්නෙ. 'අඤ්ඤා' කියන්නෙ ඇත්තවශයෙන්ම අර නිවන පිළිබඳ සම්පූර්ණ සහතිකය - 'අඤ්ඤා එලො' රහතන් වහන්සේලාට ඒ සහතිකයත් ලැබිල ඉවරයි. ඒ නිසා තමයි නිවන සාක්ෂාත් කළ යුතු ධර්මයක් කියල කියන්නෙ. තමන්ටම ප්‍රත්‍යක්ෂයි. 'වුසිතං බ්‍රහ්මචරියං' බ්‍රහ්මචරියාව අවසානයි. 'ඛීණා ජාති' 'ජාති ජරා මරණ, ඒ හැම එකෙන්ම නිදහස් කියන ඒ ප්‍රත්‍යක්ෂය - සහතිකය ලැබිල ඉවරයි. ඔන්න ඔය විදියෙ අර්ථ රාශියක් මෙතැන තිබෙනව. එතකොට දැන් සමහර කෙනෙක් අහන්න පුළුවනි, මොකටද නිවන් ලබන්නෙ? කියල. අන්න ඒ ප්‍රශ්නයට පිළිතුරු සොයාගන්නයි ඔය

විදියට උගතුන් අතර තර්ක රාශියක් ඇති උනෙ. මොකටද නිවන් දකින්නෙ? ලෝකයා කරන හැමදෙයකම පරමාථයක් තිබෙනව. දන් වෙළඳාමක්, ගොවිතැනක්, කරන්නෙ යම්කිසි ලාභයක් ලබන්නයි. හොරෙක් ගෙයක් බිඳින්නෙ යම්කිසි දෙයක් හොරකම් කරගන්නයි. ඔය විදියට නිවන් දකීමෙන් යම්කිසි පරමාථයක් ඇතෙයි කියල කෙනෙක් හිතනව. මොකටද නිවන් දකින්නෙ? නිවන් දකීමෙන් ඇති වැඩේ මොකක්ද? කියල. ඉතින් ඔය ප්‍රශ්නයට පිළිතුරු සොයන්න තිබිල්ල තමයි 'නිබ්බානං පන ආගම්ම' නිවන් දකින්නෙ තණ්හාව රාගාදිය නැතිකර ගන්න කියල කියන්න වෙන්නෙ. ඔන්න ඔතන දන් කියන්න තියෙන්නෙ අර නාමය ගැන කිව්ව වගේ, ඊකත් කල්පනා කළයුතු වාක්‍යයක් හැටියට කියන්න තියෙන්නෙ - 'නිවනෙහි පරමාථයක් ඇතොත් නිවන පරමාථය වන්නෙ නැහැ.' කියලයි. එතකොට නිවන පරමාථය වන්න නම් නිවනෙහි පරමාර්ථයක් නැතිවන්න ඕන. ඒ කියන්නෙ, නිවනෙහි පරමාථයක් ඇතෙයි කියල කිව්වොත් එතනිනුත් එහාට යම්කිසි දෙයක් තියෙනව. තණ්හාවේ ස්වභාවය, හැම තිස්සෙම ඉදිරියට හෙත්තියක් තියන එකයි. ඒ නිසා තමයි තණ්හාව පිළිබඳව 'භවනෙත්ති' කියල ප්‍රකාශ කරන්නෙ. භවය ඉදිරියට ගෙනයන හෙත්තියක්, හොරයන ගතියක්, තිබෙනව. ඊක නිසා තමයි ලෝකයේ තණ්හාවෙන් ඉදිරිපත් වෙන හැම අරමුණකම, හැම දේකම, ඉදිරියට යම්කිසි හෙරා යාමක් තිබෙන්නෙ. නමුත් යම්කිසි විදියකින් තණ්හාව ක්ෂය කිරීමම අරමුණ කරගත්තොත්. තණ්හාවෙන් ඉදිරිපත්වෙන හැම දෙයකම ඉදිරියට හෙත්තියක්, හෙරායාමක් තිබෙනව. මේක කරන්නෙ අනික් එක සඳහා, මේක කරන්නෙ අනික් එක සඳහා, ඔය විදියට කෙළවරක් නැතිව ඉදිරියට යනව. නමුත් යම්කිසි කෙනෙක් තණ්හාව ක්ෂය කිරීමම අරමුණ කරගත්තොත්, ඒ තණ්හාව ක්ෂය කළ අවස්ථාවේ තවත් කරන්න දෙයක් නැහැ. ඒ පුද්ගලයාට තවත් වතුර පොවන්න යන්න අවශ්‍ය නැහැ. අන්න ඊක නිසා 'තණ්හක්ඛයො කියන්නෙ වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම නිවනයි.

එතකොට මෙපමණකින් අදට මේ දේශනය අවසාන කරන්න බලාපොරොත්තු වෙනව. තව ඉදිරියට අවස්ථාව තිබුනොත් - ජීවිතය රැකෙන පමණින් - මේ දේශනා මාලාව පවත්වන්ට අදහස් කරනව. අතිපූජනීය මාහිමිපාණන් වහන්සේ එක්තරා විදියක දරු සුරතලයක් දකීමට දෙන් මේ කළේ යම්කිසි ආරාධනාවක්. මගේ හොඳට හෝ නරකට හෝ ඒක පිළිගන්න සිද්ධ උනා. හොඳද නරකද කියන එක ශාසනය පිළිබඳව නම් තව ඉදිරියටයි විසඳෙන්නෙ.

අධෝලිපි


1. සං.නි. II බු.ජ. 14-412 පිටුව.
2. මනො. I හේ.මු. 52-53 පිටු.
3. ප.ජෝ. 50 පිටුව හේ.මු.
4. සං.නි. I බු.ජ. 13-72 පිටුව.
5. සං.නි. I 13-23 පිටුව.
6. ම.නි. I බු.ජ. 10-126 පිටුව.
7. සා. ප. I 75 පිටුව (හේ.මු)
8. සමිද්ධි ස. දේවතා සංයුත්ත, සං.නි. I බු.ජ. 13-22 පිටුව.
9. සෙල සු.,සු.නි.බු.ජ. 25-176 පිටුව.
10. සං.නි. I බු.ජ. 13-26 පිටුව.
11. ඛු.නි. I බු.ජ. 24-12 පිටුව.
12. ම.නි. III බු.ජ. 12-506 පිටුව.
13. මහා පරිනිබ්බාන සු.දී.නි. II බු.ජ. 8-246
14. ම.නි. II බු.ජ. 11-262 පිටුව.
15. සං.නි. IV බු.ජ. 16-634 පිටුව.
16. අලගද්දූපම සු.ම.නි. I බු.ජ. 10-350 පිටුව.
17. නාසදීය සූක්ත, ඍග්වේද X 129
18. උපසීව මාණව පුච්ඡා. සු.නි.බු.ජ. 25-328 පිටුව.
19. රාහුල ථෙරගාථා - බු.ජ. 28-98 පිටුව.
20. සු.නි. බු.ජ. 25-70 පිටුව.
21. පොට්ඨපාද සු.දී.නි. බු.ජ. 7-422 පිටුව.
22. සං.නි V (2) බු.ජ. 17-270 පිටුව.
23. රාජ.සු.උදා. I ඛු.නි. 24-150 පිටුව.
24. උදපාන සු.උදා I ඛු.නි. 24-286 පිටුව.
25. සා.ප. III 91 පිට හේ.මු.
26. වි.ම. 378-380 පිටුව (හේ.මු.)
27. නිබ්බාන සු.අසංඛත සං, සං.නි. IV බු.ජ. 16-663
28. ම.නි. II බු.ජ. 11-288 පිටුව.
29. සන්දක සු.ම.නි.
30. සං.නි III බු.ජ. 15-3470 පිටුව.

# 2 වන
# දේශනය

# 2 වන දේශනය

"නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"

'එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං'

"මෙය ශාන්තය, මෙය ප්‍රණීතය, එනම් සියලු සංස්කාරයන්ගේ සංසිඳීම සියලු උපධීන් අත්හැර දැමීම, තණ්හාව ක්‍ෂය කිරීම, නොඇල්ම නම් වූ විරාගය, නැවැත්ම නම් වූ නිරෝධය, නිවීම නම් වූ නිබ්බානය"

අභිපූජනීය මහෝපාධ්‍යාය මාහිමිපාණන්වහන්සේ ප්‍රධාන ගරුතර යෝගාවචර මහා සංඝරත්නයෙන් අවසරයි. නිවන යන මාතෘකාව යටතේ සැලසුම් කළ දේශනා මාලාවේ දෙවැනි දේශනයයි අද කරන්ට සිදුවෙල තිබෙන්නෙ.

අප පසුගිය දවසෙ දේශනාව අවසාන භාගයේදී කාරණයක් මතු කළා, නිවනෙහි පරමාර්ථය කුමක්ද? නිවන කුමක් සඳහාද? කියන ප්‍රශ්නය නොගැලපෙන්නේ මක්නිසාද කියන එක. ඒ කියන්නෙ සාසනබ්‍රහ්මචරියාව එනම්, ආර්‍යඅෂ්ටාංගික මාර්‍ගයම නිවන නිෂ්ඨාව කොටගෙන - නිවන පරමාර්ථය කොටගෙන - නිවනෙහිම බැසගෙන සිටින නිසා, නිවන කුමක් සඳහාද? නිවනෙහි පරමාර්ථය කුමක්ද, කියන ප්‍රශ්නය නුසුදුසු ප්‍රශ්නයක් බව අපි කලින් දවසෙ සාකච්ඡා කළා. ඇත්ත වශයෙන්ම සමහර තැන්වල නිවන හැඳින්වීමට යොදල තිබෙනව. 'අනුත්තර බ්‍රහ්මචරිය පරියොසාන' කියන පදය පවා.

නිතර දක්වෙන පාඨයක් තමයි සූත්‍රවල - 'යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති තදනුත්තරං බ්‍රහ්මචරිය පරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි'[1] කියන පාඨය. යම් අර්ථයක්, යම් කාරණයක් සඳහා කුලපුත්‍රයෝ මැනවින් ගිහිගෙන් නික්ම අනගාරික වූ ඒ පැවිද්දට ඇතුළු වෙත්ද, එම අර්ථය, එම අනුත්තර වූ බ්‍රහ්මචරියපරියෝසානය, බ්‍රහ්මචරිය අවසානය, දිටු දැමියෙහි දීම - මේ ජීවිතයේදීම - ස්වකීය අභිඥාවෙන් සාක්‍ෂාත් කරගෙන - ප්‍රත්‍යක්‍ෂ කරගෙන - ඊට එළඹ වාසය කළා කියන එකයි ඒ පාඨයේ අදහස. මේ විදියට මේ බ්‍රහ්මචරියාව අවසාන වෙනකොට නිවන ලැබෙනවයි කියන එකට හේතුව මොකක්ද? මේ ආර්‍යඅෂ්ටාංගික මාර්‍ගය සෘජු මාර්‍ගයක්. 'උජුකො නාම සො මග්ගො අභයා නාම සා දිසා'[2] ආදි වශයෙන් දක්වෙනව. මේ මාර්‍ගය සෘජුයි, යන දිසාව නිර්භයයි කියල. ඒ

විදියටත් සමහර තැන්වල දක්වෙනවා. විශේෂයෙන්ම හොඳ ගාථා ධර්මයක් සඳහන් වෙනවා.

'සෙඛස්ස සික්ඛමානස්ස - උජුමග්ගානුසාරිනො
ඛයස්මිං පඨමං ඤාණං - තතො අඤ්ඤා අනන්තරා'[3]

කියල ඉතිවුත්තක පාළියේ සඳහන් වෙනවා. 'ඍජු මාර්ගයට අනුව හැසිරෙන්නාවූ ඒ අනුව හික්මෙන්නා වූ - ශෛක්ෂ පුද්ගලයාට ආශ්‍රව' ක්ෂය කිරීමේ ඤාණය පළමුවෙන් ඇතිවෙනවා. ඊට අනතුරුවම 'අඤ්ඤා' නම් වූ ඒ අර්හත් ඵලයෙන් නිර්වාණය පිළිබඳ ප්‍රත්‍යක්ෂ සහතිකය, ප්‍රත්‍යක්ෂ අවබෝධය, ලැබෙනවා. මෙතනින් අපට පේනවා 'අනන්තරා' කියන වචනය යෙදිල තිබෙන බව. 'ආනන්තරික සමාධි'[4] කියලත් කියනවා මේ අර්හත්ඵල සමාධියට. අනන්තරවම ලැබෙනවා කියන එකයි.

එතකොට රහතන් වහන්සේ පිළිබඳව ඒ විදියට කිව්වත් ආනන්තරික වශයෙන්, කෙනෙකුට ප්‍රශ්නයක් නගන්න පුළුවනි. හොඳයි සෝවාන් පුද්ගලය පිළිබඳව කොහොමද? කියල. සාමාන්‍ය විශ්වාසයේ හැටියට සමහර කෙනෙක් හිතන හැටියට - සෝවාන් පුද්ගලය නිවන දකින්නෙ හරියට අර වංගු සහිත පාරක එක වංගුවකින් හැරෙන කොට ඈතින් පෙනෙන පොඩි පහන් එළියක් දකිනවා වගෙ. එහෙම නිවනක් දක්මක්ය කියල. නමුත් ධර්මානුකූලව කල්පනා කරල බලනවා නම්, අර ආනන්තරික ධර්මතාව මේ ප්‍රථම මාර්ග ඥානයට පවා පොදු දෙයක්. ඒක හොඳට දක්වෙනවා. සමහර විට සෝවාන් ඵලය ලබන පුද්ගලයා ඉතාම දිළින්දෙක් වෙන්න පුළුවන්, නුගතෙක් වෙන්න පුළුවන්, සත් හැවිරිදි දරුවෙක් වෙන්න පුළුවන්. ඒ වගේම පළමු වරට ඒ ධර්මය අසන කෙනෙක් උනත් ඒ නැනැත්තා සෝවාන් උනාම, පුදුම අන්දමේ උපපද මාලාවක් ඒ ධර්මයේ යෙදිල තිබෙනවා. උපපද මහ ගොඩක් යෙදිල තිබෙනවා.

'දිට්ඨධම්මො, පත්තධම්මො, විදිතධම්මො පරියොගාළ්හධම්මො තිණ්ණවිචිකිච්ඡො විගතකථංකථො වෙසාරජ්ජප්පත්තො අපරප්පච්චයො සත්ථු සාසනෙ'[5] කියල ඔය විදියට දිග උපපද මාලාවක් යොදල තිබෙනවා. එතන 'දිට්ඨධම්මො' කියල සඳහන් වෙනවා. නිර්වාණධර්මය දුටුව. ඒ විදියටම විග්‍රහ කරනවනම් රතනසූත්‍රයෙ එහෙම තියෙනවා. 'සහාවස්ස දස්සන සම්පදාය - තයස්සු ධම්මා ජහිතා භවන්ති' කියල. ඒ ප්‍රථම මාර්ග ඥානයෙන් ඒ දර්ශනය ලැබෙනවත් සමගම 'සක්කාය දිට්ඨි - විචිකිච්ඡා - සීලබ්බත පරාමාස කියන ඒ සංයෝජන ධර්ම තුන ප්‍රහීන වෙනවා කියල. සමහර කෙනෙක් හිතන්න පුළුවන් නිවන යන්තමින් දක්ක නිසා මෙහෙම වෙනවා කියල. නමුත් මේ පාඨයෙන් පේනවා දිට්ඨධම්ම පමණක් නොවෙයි, නිවන දුටුවා පමණක් නොවෙයි. 'පත්ත ධම්මො' නිවනට පැමිණියා. එපමණකුත් නොවෙයි, විදිතධම්මො' නිවන තේරුම් ගත්ත. 'පරියොගාළ්හධම්මො' නිවනට බැස ගත්ත. නිවනට කිමිද ගත්ත. ඒ අනුවම තවත් වචන කීපයක් යෙදෙනවා. 'තිණ්ණවිචිකිච්ඡො' දෙගිඩියාවෙන් එතෙර උනා. 'විගතකථංකථො' සැකය පහ උනා. සැකය දුරුකර ගත්ත.

'වෙසාරජ්ජප්පත්තො' විශාරද භාවයට පැමිණියා. 'අපරප්පච්චයො සත්ථුසාසනෙ' මේ ශාස්තෘ ශාසනයේ වෙන ගුරුපදේශයක් නැතිව පවා - සමහර විට ගුරුපදේශ ඇත්නම් ඉක්මන් කර ගන්න පුළුවන් - එහෙම නැති උනත් නිවන් දකින්න පුළුවන්. ඒ මාර්ග ලැබූ පුද්ගලයකුට කියන. ඒ විදියෙ පද රාශියක් එතන යෙදිල තිබෙනව. මෙයින් අපට පෙනෙනව ප්‍රථම මාර්ග ඥානයෙන් ලබන ප්‍රත්‍යක්‍ෂය පවා අර ඇසින් දකින නිවන් නිමිත්තක් එහෙම නිමිත්ත කරගන්නු දෙයක් නොවෙයි. මේක නිවනට පැමිණීමක්, බැස ගැනීමක්. උපමාවක් වශයෙන් කියනවනම් ඉතිහාස ප්‍රවෘත්තියකට සම්බන්ධ ජනප්‍රවාදයක් තිබෙනව. ගජබා රජ්ජුරුවන් දඹදිව ආක්‍රමණය කරන අවස්ථාවේදී නීලමහායෝධයා යගදාවක් අරගෙන, යගදා ප්‍රහාරයෙන් මුහුදුදිය දෙබෑ කරල, ඒ යන මාර්ගය පැදුව කියල. එතකොට නීලමහායෝධයගෙ යගදා ප්‍රහාරය වගේ එකක් තමයි මේ ලෝකෝත්තර මාර්ග චිත්තය. ඒක ඒ තරම්ම ප්‍රබලයි. පළමුවැනිවර යගදාව ගහනකොටමත් මුහුදුදිය දෙබෑ වෙල මුහුදුපතුල පේනව. ඒ පුද්ගලය මුහුදුපතුල දුටුව. මුහුදුපත්ලට පැමිණිය, ඒකට කිමිද ගත්ත වගේ, අන්න එහෙම තත්වයක් මෙතැන අපට හිතාගන්න තිබෙන්නෙ. අර යගදා ප්‍රහාරයෙන් මුහුදුදිය දෙබෑ කරනව වගේ තමයි, මේ ආශ්‍රවයන් - ආශ්‍රවයන් ගලාගෙන එන ස්වභාවයක් තිබෙනව - නමුත් ඒ මාර්ග චිත්තය කොයිතරම් බලවත්ද කිවුවොත්, මොහොතකට දකිනව නිවන. ඒ කියන්නෙ මොහොතකට ඒ සංස්කාර දෙබෑ කරගෙන සංස්කාර නිරෝධය දකිනව. මේ කාරණය දන් අපි මේ උපමාවකින් කිව්වෙ. මේ උපමාවට කිට්ටු කරන්න පුළුවන් ධම්මපද ගාථාවකුත් තිබෙනව.

'ඡින්ද සොතං පරක්කම්ම - කාමෙ පනුද බ්‍රාහ්මණ
සංඛාරානං ඛයං ඤත්වා - අකතඤ්ඤූසි බ්‍රාහ්මණ'[6]

'බ්‍රාහ්මණය, මේ කෙලෙස් සැඩවතුර - තෘෂ්ණාව නමැති සැඩවතුර - ඉදිරියට පැනල පරාක්‍රමයෙන් යුක්තව කපාහරින්න. කාමයන් දුරුකරන්න. සංස්කාරයන්ගේ ක්‍ෂයවීම දැනගෙන බ්‍රාහ්මණය, ඔබ අකත නම් වූ, අසංඛත නම් වූ ඒ තත්වය දැනගත් කෙනෙක් වෙන්න.' මේ ගාථාවෙන් ඉතින් හොඳටම පැහැදිලි වෙනව මේ මාර්ගඥානයෙන් කරන්නෙ කුමක්ද කියල. අර විදියට ඉදිරියට පැනල ඒ සැඩ වතුරපහර කපන්නා වගේ මේ තෘෂ්ණාවෙන් බැඳිල තිබෙන සංස්කාර සමූහය, මේ කෙලෙස් ගොඩ, මොහොතකට කපාහරිනවා. එහෙම කපාහරිනකොට තේරුම් ගන්නව 'සංඛාරානං ඛයං ඤත්වා' සංස්කාරයන් ක්‍ෂයකරන්න පුළුවන් කියන ප්‍රත්‍යක්‍ෂ අවබෝධය ලැබෙනව. ඒ මොහොතකට සංස්කාරයන්, අර යගදාවෙන් ඉවත්වුනා වගේ, දෙබෑ වුනා වගේ - ඈත් වෙනව. 'අසංඛත' මුහුදුපත්ල දකිනව. 'අකත' කියල කියන්නෙත් 'අසංඛත' කියන්නෙත් එකයි. ඒ කියන්නෙ සංස්කාරයන්ගෙන් තොරවූ ඒ මුහුදුපත්ල මොහොතකට දුටුව. ඒ යගදාව ඉස්සුවාට පස්සෙ ආයින් ගලාගෙන එනව. නමුත් අර දිට්ඨාසව කියල කියන එක් ආශ්‍රව පක්‍ෂයක් නවත් නොඑන්නම යනව. ඒ ක්‍ෂණයෙන් වගේ රහත් උන මහාප්‍රාඥයින් වහන්සේලා, බාහිය වැනි මහරහතන්

වහන්සේලා, මොකද කළේ, බුදුපියාණන් වහන්සේගේ ඒ දේශනාව අවසන් වෙනවත් එක්කම, එකපිට එක යගදා ප්‍රහාර හතරක් ගහල ආශ්‍රවයන් ගලා ඒම සම්පූර්ණයෙන්ම නතර කළා. ආශ්‍රවක්ෂය කියන තත්ත්වයට සම්පූර්ණයෙන්ම පැමිණියා. එහෙම නැති පුද්ගලයා අර මාර්ගචිත්තයම පිහිට කරගෙන, අර යගදාවම පිහිට කරගෙන 'අකත' - 'අසංඛත' - තත්ත්වය දකිනවා. එතකොට මෙතනිනුත් අපට පෙනෙනවා අකත - අසංඛත කියන දේවල් ඇත තිබෙන නිමිත්තක් හැටියට නිවන් දකින පුද්ගලයා අල්ලාගන්නව නොවෙයි කියන එක - මේ නිමිති අනුව සිතීම බොහෝදුරට භාෂාව්‍යවහාරයේ ලක්ෂණයක්. ඒක බොහොම අවස්ථාවල අපට ඉවත්කරන්න බැරි විදියට පෙනෙනවා. මේ කෙලෙස් සහිත ලෝකයාගෙ ව්‍යවහාරයටයි භාෂාව සකස් වෙලා තිබෙන්නෙ. ඒක නිසා මේ භාෂාවෙ එක ලක්ෂණයක් තමයි ග්‍රාහ්‍ය - ග්‍රාහක භේදය. 'ග්‍රාහ්‍ය - ග්‍රාහක' භේදය කියල කියන්නෙ, මේ භාෂාවේ අල්ලගන්න දෙයකුත් තිබෙනවය, අල්ලගන්න කෙනෙකුත් ඉන්නවය කියන ව්‍යවහාරයක් තියෙනවා. විෂය - විෂයී කියල කියනවා. 'කර්ම - කර්තෘ.' ඔය කොයි විදියට බැලුවත් භාෂාව්‍යවහාරයෙ, කරන කෙනෙක් ඉන්නවා. කරන දෙයක් තිබෙනවා. අල්ලගන්න දෙයක් තිබෙනවා - අල්ලගන්න කෙනෙක් ඉන්නවා. ඔන්න ඔය විදියෙ ස්වභාවයක් තිබෙනවා මේ භාෂාවෙ. ඒක නිසාම අපට සාමාන්‍ය ව්‍යවහාරයක් වශයෙන් වළක්වන්න බැරි විදියට කියන්න සිද්ධවෙනවා 'මම නිවන් දකින්න කැමතියි' 'නිවන ලබාගන්න කැමතියි' කියල. ඔය විදියට ලැබීමක් ලබාගැනීමක් හැටියට අපට කථාකරන්න සිද්ධවෙනවා.

නමුත් බුදුපියාණන් වහන්සේ සමහර අවස්ථාවල මතක් කරල දෙනවා, මේක ව්‍යවහාර මාත්‍රයක් පමණයි, දැඩිව ගතයුතු දෙයක් නොවෙයි කියල. සමහර පිළිතුරු තිබෙනවා 'ගත්කටවම කියන්න' වගේ. අන්න එහෙම පිළිතුරු දෙන තැනක් හමුවෙනවා සංයුක්ත සඟියෙ සගාථක වග්ගයෙ.[7] කකුධ නමැති දේවපුත්‍රයා බුදුරජාණන් වහන්සේගෙන් අහනවා 'නන්දසි සමණ?' මහණ ඔබ සතුටුවන්නෙහිද? බුදුපියාණන් වහන්සේ ඊට දෙන පිළිතුර 'කිං ලද්ධා ආවුසෝ?' 'කුමක් ලබාගත්තටද ඇවැත්නි?' ඊළඟට ඒ දේවපුත්‍රයා අහනවා 'තෙනහි සමණ සෝචසි' එහෙනම් මහණ ඔබ දුක් වෙන්නෙහිද?' 'කිං ජීයිත්ථ ආවුසො' කුමක්ද ඇවැත්නි නැතිවුනේ? 'තෙනහි සමණ නෙව නන්දසි න සොචසි' 'හොඳයි එහෙමනම් මහණ ඔබ සතුටු වන්නෙත් නැත - දුක්වන්නෙත් නැත' 'එසේය ඇවැත්නි' කියල පිළිතුරු දෙනවා. මේ විදියට බලනකොට අන්තිමට නිවන් ලබනවා කියල අපි කිව්වට මොකද, ලබා ගන්න දේකුත් නැහැ නැති උන දේකුත් නැහැ. ඔය විදියෙ තත්ත්වයක් තිබෙන්නෙ. නැතිවුනා නම් නැතිවුනෙ යමක් ඇතෙයි කියල හිතා ගත්තු අවිද්‍යාවකුත්, තව මදිය කියල හිතාගත්තු තණ්හාවකුත්. ඔච්චරයි නැති උනේ. මේ අදහස තවත් අපට මතුකරගන්න පුළුවන්.

දැන් නිවන හැඳින්වීමට අකත - අසංඛත ආදී පද රාශියක් තියෙනවා. අපි එදා කිව්ව පද තිස්තුනක්ම එකතුකරල තියෙනවා කියල එක

ලේඛණයක.[8] එයින් එකක් තමයි ඔය 'දීපං' කියන එක. 'දීප' කියල කියන්නෙ දිවයින. නිවන දිවයිනක් කිව්වහම අපට හිතෙනව මේක බොහොම ලක්‍ෂණ දිවයිනක්, ද්වීපයක් වෙන්න පුළුවන් කියල. මේ අදහසට අනුව අපි සමහරවිට මේක දකිව්ව හිතාගන්නව අනෙකුත් ලෝක වගෙ යම්කිසි භව තත්වයක් කියල. නමුත් මේකටත් බුදුපියාණන් වහන්සෙ හොඳ පිළිතුරක් දීපු තැනක් අපට හමුවෙනව සුත්ත නිපාතයෙ පාරායණ වග්ගයෙ. කප්ප කියන බ්‍රාහ්මණ මාණවකය - බාවරී බ්‍රාහ්මණයගෙ ගෝලය - බුදුපියාණන් වහන්සේගෙන් ඉල්ලීමක් කරනව, බොහොම ලස්සන ගාථාවකින්,

'මජ්ඣෙ සරස්මිං තිට්ඨතං - ඔඝෙ ජාතෙ මහබ්භයෙ
ජරාමච්චු පරේතානං - දීපං පබ්‍රෑහි මාරිස[9]

කියල 'මහත් භයානක ගංවතුර ගලාගෙන එද්දි විලක් මැද සිටින ජනයාට දිවයිනක් කියන්න වගේ, මේ ජරාවෙන් මරණයෙන් පෙළුන්නාවූ, ජරා මරණ දෙකට භයේ පීඩිතව සිටින්නා වූ මේ ලෝකයාට දිවයිනක් කියනු මැනවි නිදුකාණෙනි', කියල බුදුපියාණන් වහන්සේගෙන් ඉල්ලා සිටිනව. බුදුපියාණන් වහන්සේ ඊට දෙන පිළිතුර,

'මජ්ඣෙ සරස්මිං තිට්ඨතං - ඔඝෙ ජාතෙ මහබ්භයෙ
ජරා මච්චුපරේතානං - දීපං පබ්‍රෑමි කප්ප තෙ'

කප්පය, මම තුඹට කියනව ඒ දිවයින කුමක්ද කියල. මෙන්න මේකයි දිවයින,

'අකිඤ්චනං අනාදානං - එතං දීපං අනාපරං
නිබ්බානමිති නං බ්‍රෑමි - ජරා මච්චු පරික්ඛයං'

'අකිඤ්චනං' කියන්නෙ කිසිවක් අයිති නැති බව. 'අනාදානං' කියන්නෙ කිසිවක් අල්ලගන්නෙ නැති බව. 'එතං දීපං අනාපරං' - මෙන්න මේකයි දිවයින, වෙන එකක් නොවෙයි. එකකොට කිසිවක් අයිති නැති බවත්, කිසිවක් අල්ලගන්නෙ නැති බවත් කියන එක තමයි මේ දිවයින කියන්නේ. 'එතං දීපං අනාපරං' - වෙන එකක් නොවෙයි.

'නිබ්බානමිති නං බ්‍රෑමි' - මම ඒකට කියනව 'නිවන' කියල. ජරා මච්චු පරික්ඛයං' ජරාව සහ මරණය නැතිකරන, ඒවා විනාශ කරන, තත්වය ඒකයි. මෙයිනුත් අපට පේනව, 'අකත' 'අසංඛත' ඒ වගේම 'සබ්බසංඛාර සමථ' ආදී පද ඇත්ත වශයෙන්ම නිවනට යොදාපු ගැලපෙන උප පද සමූහයක්. එයින් අනාවූ වෙන ගූඪ ධර්මයක් නොවෙයි නිවන. වෙන ඈත තියෙන නිමිත්තක් වගේ දෙයක් නොවෙයි කියන එකයි. සංඛතය එක පැත්තකට දමල, අසංඛතය අනිත් පැත්තට දමල නිවන පිළිබඳ විග්‍රහවලට සමහර කෙනෙක් බසිනව. සංඛතය අනිත්‍යයි. අසංඛත ධාතු නම් වූ නිබ්බානය - ඒ වචනයේ හැටි බලල සංඛතය අනිත්‍ය නම්, අසංඛතය නිත්‍ය වෙන්න ඕනැ. ඔය විදියට හිතල අසංඛතය නිත්‍යයි

කියනවා. එතකොට, සංඛතය දුකයි. අසංඛතය සැප වෙන්න ඕන. ඊළඟට ඔය විදියට කියාගෙන ගිහිල්ල සංඛතය අනාත්මයි, එතකොට තමයි ඔන්න ටිකක් අමාරුවෙ වැටෙන්නෙ. අසංඛතය ආත්මයි කියල කියන්න වෙනවා. ඉතින් එහෙන්දි සමහර විට නිවන වනාහි ප්‍රත්‍යක්‍ෂ කරගත යුතු ධර්මයක් කියල නිහඬ වෙන්නත් සිද්ධ වෙනවා. ඔය විදියෙ තත්ත්වයකට පත්වෙන්නෙ, ඇත්ත වශයෙන්ම මෙහි රහස තියෙන්නෙ, පටිච්ච සමුප්පාද ධර්මය පිළිබඳ පැහැදිලි අවබෝධයක් නැති කමයි. ඒක නිසා අපට යම්කිසි දෙයක් කියන්න සිද්ධ වෙනවා පටිච්ච සමුප්පාද ධර්මය පිළිබඳව. රසායන බෙහෙතක් ගන්න උනත් පළමුවෙන්ම විරේකයක් අවශ්‍යවෙනවා. ඒ වගේම නිර්වාණය පිළිබඳ ගැඹුරු සූත්‍ර දේශනාවලට ළංවෙන්න කලින් හුඟක් මග එළිකිරීමට සිද්ධ වෙනවා. ඒ නිසා පටිච්ච සමුප්පාද ධර්මය පිළිබඳව අපි මීළඟට යමක් කියන්න බලාපොරොත්තු වෙනවා.

මැදුම් සඟියේ අරිය පරියේසන සූත්‍රයේ[10] දක්වෙන හැටියට බුදුපියාණන් වහන්සේ සම්බෝධිය ලබාගන්නට පස්සෙ පළමුවෙන්ම වගේ මේ ධර්මගම්භීරතාව ගැන කල්පනාකරල බලල ධර්මය දේශනා කිරීමට අල්පෝත්සාහී වුනා. එහෙන්දි කාරණා දෙකක් - තැන් දෙකක් - ගැඹුරු හැටියට බුදුපියාණන් වහන්සේට පෙනී ගියා. 'දුද්දසං ඉදං ඨානං - යදිදං ඉදප්පච්චයතා පටිච්ච සමුප්පාදො. 'එක තැනක් - එක කාරණයක් තමයි "ඉදප්පච්චයතා' කියල කියන පටිච්චසමුප්පාදය දුද්දසං - දකීම - තේරුම් ගැනීම ඉතාමත්ම අපහසුයි දෙවෙනි කාරණය - 'ඉදම්පි ඛො ඨානං දුද්දසං යදිදං සබ්බසංඛාර සමථො, සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං.' මෙන්න මෙතැනක්, මේ කාරණයත්, දකීම අපහසුයි, තේරුම් ගැනීම අපහසුයි. කුමක්ද? - 'සබ්බසංඛාරසමථො' සියලු සංස්කාරයන්ගේ සමනය කිරීම, සබ්බූපධිපටිනිස්සග්ගො' - සියලු උපධීන් අතහැරීම, 'තණ්හක්ඛයො' තෘෂ්ණාව ක්‍ෂය කිරීම විරාගය නිරෝධය නිබ්බාන කියන මෙන්න මේ නිර්වාණ තත්ත්වයත් දකීම අපහසුයි. ඉතින් අපට මෙතනින් පෙනෙනවා පටිච්ච සමුප්පාදය හැඳින්වීමට යම් වචනයක් යොදනවනම් - ඒකටම ළංකල හැකි වචනයක් යොදනවනම් - ඒකට ඉතාමත්ම ගැලපෙන වචනයක් තමයි 'ඉදප්පච්චයතාව'. බුදුපියාණන් වහන්සේ එතැන 'ඉදප්පච්චයතා' කියල හඳුන්වල තියෙනවා. ඇත්තවශයෙන්ම මේ පටිච්චසමුප්පාද ධර්මයේ මූලධර්මය, මූලන්‍යායය - ආර්ය න්‍යාය - තමයි මේ ඉදප්පච්චයතාව, මේක මොකක්ද කියල තේරුම් ගන්න අපි ඊළඟට පටිච්චසමුප්පාදය ගැන විමසල බලමු.

බොහෝ තැන්වල, මේ අසවල් සූත්‍රයේ කියල කිවයුතු නැති තරමට, බහුධාතුක ආදී සූත්‍රවලත්[11] උදාන පාළියේ[12] ආදියෙත් පටිච්ච සමුප්පාදය දක්වන ආකාරය මෙන්න මේ විධියයි.

"ඉති ඉමස්මිං සති ඉදං හොති, ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති, ඉමස්මිං අසති ඉදං න හොති, ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති. යදිදං අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා සළායතනං සළායතන පච්චයා ඵස්සො, ඵස්ස පච්චයා

වෙදනා වෙදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං උපාදාන පච්චයා භවො, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරා මරණං, සොක පරිදෙව, දුක්ඛ දොමනස්සුපායාසා සම්භවන්ති: එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. අවිජ්ජායත්වෙව අසෙස විරාග නිරොධා සංඛාර නිරොධො, සංඛාර නිරොධා විඤ්ඤාණ නිරොධො, විඤ්ඤාණ නිරොධා නාමරූප නිරොධො, නාමරූප නිරොධා සළායතන නිරොධො සළායතන නිරොධා ඵස්ස නිරොධො, ඵස්ස නිරොධා වෙදනා නිරොධො, වෙදනා නිරොධා තණ්හා නිරොධො, තණ්හා නිරොධා උපාදාන නිරොධො, උපාදාන නිරොධා භව නිරොධො, භව නිරොධා, ජාති නිරොධො, ජාති නිරොධා, ජරා මරණ සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති"

ඔය විදියටයි දක්වෙන්නෙ. දැන් මෙතන 'ඉමස්මිං සති ඉදං හොති' කියල කිව්වෙ - අපි සිංහලට නැගුවොත් මේක එක්තරා මූල සිද්ධාන්තයක් වගෙයි තියෙන්නේ. 'ඉමස්මිං සති ඉදං හොති' - මෙය ඇතිකල්හි මෙය වෙයි - 'ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති' - මෙය හටගැනීමෙන් මෙය හට ගනී. ඉමස්මිං අසති ඉදං න හොති' - මෙය නැති කල්හි මෙය නැත. 'ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති' - මෙය නිරුද්ධ වීමෙන් මෙය නිරුද්ධ වෙයි. මෙතන හරියට අර වීජගණිතමය සිද්ධාන්තයක් වගේ දක්වල තියෙන්නෙ. නමුත් ඊළඟට තියෙනව 'යදිදං (එනම්) යදිදං' කියන එකෙන් හැඟෙනව, මුලින් දක්වූයේ සිද්ධාන්තයයි, ඊළඟට දක්වන්නෙ නිදර්ශනයයි කියල. ඒ නිදර්ශනය තමයි අර අවිජ්ජා පච්චයා සංඛාරා ආදී ඒ ද්වාදසාංගය. අංග දොළහ. මේ අංග දොළහ මෙහෙම දක්වූවට මොකද, ඇත්ත වශයෙන්ම මෙතන සිද්ධාන්තය - වැදගත් දෙය - තමයි අර 'ඉමස්මිං සති' ආදී වශයෙන් මුලින් දක්වූ ඒ පද හතර. මේ බව හුඟක්ම පැහැදිලි වන තැනක් තියෙනව සංයුත් සඟියේ නිදාන වග්ගයේ. බුදුපියාණන්වහන්සේම ප්‍රශ්නය නගල පිළිතුරු දෙනව "පටිච්චසමුප්පාදං ච වො භික්ඛවෙ දෙසිස්සාමි, පටිච්චසමුප්පන්නෙ ච ධම්මෙ[13]"- මහණෙනි මම තුඹලාට පටිච්චසමුප්පාදයත් දේශනා කරනව. පටිච්ච සමුප්පන්න ධර්මයනුත් දේශනා කරනව කියල. ඔය විදියට පටන්ගෙන, මෙතන වෙනසක් පෙන්නුම් කරනව පටිච්ච සමුප්පාදයත්, පටිච්චසමුප්පන්න ධර්මත් අතර. ඒ කියන්නේ පටිච්ච සමුප්පාදය අනුව හට ගත්ත ධර්ම කියන එකයි.

එතකොට පටිච්චසමුප්පාදය තෝරන්න මේ දොළහෙන්ම අග කෙළවරේ තියෙන අංග දෙකක් ඉදිරියට ගන්නව - "ජාති පච්චයා භික්ඛවෙ ජරාමරණං....." උප්පාදා වා තථාගතානං අනුප්පාදා වා තථාගතානං ඨිතාව සා ධාතු ධම්මට්ඨිතතා ධම්මනියාමතා ඉදප්පච්චයතා" ඒක තව දිගට යනව. අපට ඕනෑ කරන ටික-"ජාති පච්චයා භික්ඛවෙ ජරා මරණං" - මහණෙනි ජරා මරණය ජාතිය ප්‍රත්‍යය කරගත් දෙයක් - ජාතිය ප්‍රත්‍යය කරගත් දෙයක් ජරා මරණය. "උප්පාදා වා තථාගතානං අනුප්පාදා වා තථාගතානං" - තථාගතයන් වහන්සේලාගේ පහළවීම වූයේ හෝ වේවා නොවූයේ හෝ වේවා "ඨිතාව සා ධාතු" ඒ ධර්ම ධාතුව, ඒ ධර්ම

ස්වභාවය, ඒ අන්දමින්ම පවතිනව - ධම්මට්ඨිතතා - ධම්මට්ඨිතිය කියල දක්වන ධම්මනියාමතාව. "ඉදප්පච්චයතා" මේ ඉදප්පච්චයතාව කියන ධම්තාව. එතකොට මේ අංග දෙකක්ම උනත් ඇති, අර සිද්ධාන්තය තේරුම් ගන්න. මේ කාරණය අටුවාවෙදි එහෙම ඒ තරම් සැලකිල්ලට ගත්තෙ නැති බව පේනව "ඉමෙසං පච්චයා ඉදප්පච්චයතා" ආදී තේරුම් වලින්. ඒ කියන්නේ මේක සාමූහික අර්ථයකින් තේරුම් ගන්නව. නමුත් මේක අංග දෙකකින් උනත් තේරුම් කරන්න පුළුවන් නිසා තමයි අර පටිච්චසමුප්පාදයේ මේ අංග දෙකට පස්සෙ බුදුරජාණන් වහන්සේ වදාරන්නෙ 'මේකයි පටිච්චසමුප්පාදය' කියල. ඊළඟට ප්‍රකාශ කරනව "කතමෙච භික්ඛවෙ පටිච්චසමුප්පන්නා ධම්මා?" කියල. ඒකට ඉතින් දක්වන්නෙ - "ජරා මරණං භික්ඛවෙ, අනිච්චං සංඛතං, පටිච්ච සමුප්පන්නං, ඛයධම්මං වයධම්මං, විරාගධම්මං, නිරොධධම්මං" - මහණෙනි ජරාමරණය - මේ අග තියෙන එක අංගයක් අරගෙන ප්‍රකාශ කරනව - ජරා මරණ කියන එක - අනිත්‍ය දෙයක්, සංඛතං - සකස් කරන ලද දෙයක්, පටිච්චසමුප්පන්නං - හේතු ප්‍රත්‍යයන්ගෙන් උපන්නාවූ දෙයක්, ඛයධම්මං, වයධම්මං, විරාග ධම්මං නිරොධ ධම්මං - ඒ ජරාමරණය ක්ෂය වීමේ ස්වභාවය ඇති දෙයක්, ගෙවී යාමේ ස්වභාවය ඇති දෙයක්, 'විරාග ධම්මං - සාමාන්‍ය අදහස නොඇල්ම කියන එකයි. සමහර සූත්‍රවල යෙදිල තියෙනව 'අවිජ්ජා විරාගා' 'පීතියා විරාගා' ආදී වශයෙන්. ප්‍රධාන අර්ථයට වඩා එතැනදී ගන්න තියෙන්නෙ සායමක් මැකිල යාම වගේ, පාටක් මැකිල යාම වගේ අර්ථයක්. ඒ විදියට ගන්නත් පුළුවන්. කොහොම නමුත් අපි හිතමු ජරා මරණයෙ පාට මැකිල යනව වගේ - 'විරාග ධම්මං, 'නිරොධ ධම්මං' මේ ජරා මරණය නිරුද්ධ වීමේ ස්වභාවය ඇති දෙයක්. ඛය ධම්මං වයධම්මං විරාග ධම්මං නිරොධ ධම්මං' - ඔය විදියට එක අංගයක් ගැන දක්වනව. ඊළඟට 'ජාති' පිළිබඳවත් ඒ විධියට කියනව. ජාතියත් ඒ විධියමයි. අර කියාපු ලක්ෂණවලින් යුක්තයි. ඔය විධියට අවිද්‍යාව දක්වාම, ඒ එක එක අංගයක් පටිච්ච සමුප්පන්න වශයෙන් බුදුපියාණන් වහන්සේ දක්වනව. එතකොට මේ එක එක අංගයක්ම මෙතැන පටිච්චසමුප්පන්න වශයෙන් දක්වීම - මේ ගැනත් ටිකක් කල්පනාකාරී විය යුතුව තියෙනව. මෙතෙ ටිකක් අමුත්තක් පෙනෙනව. මෙතන මේ ජරාමරණය - මේක අනිත්‍යය කියල ප්‍රකාශ කළේ මක්නිසාද?

'අනිච්චං සංඛතං' මේක එක්තරා විධියක සකස් කර ගත්තු දෙයක්, - 'සංඛතං' පටිච්ච සමුප්පන්න දෙයක් - පටිච්ච සමුප්පන්නං. 'ඛය ධම්මං' මේක ක්ෂය වෙනව. දත්, ජරාව කියල ගන්න කොටත් ක්ෂයවීමක්. නමුත් ජරා මරණයත් ක්ෂයවන්න පුළුවන්. ගෙවිල යන්නත් පුළුවන්. ඒ විදියෙ දෙයක් මෙතන දක්වනව. ඒ වගේම ජාතිය ගැනත් ඒ විදියටම කියැවෙනව. එතකොට මේ පදවල අමුත්තක් බැලූ බැල්මට පේනව. කලින් සඳහන් කළ ඉදප්පච්චයතා සිද්ධාන්තයෙත් සඳහන් වෙනව ඒ වගේම කියමනක්.

'ඉමස්මිං සති ඉදං හොති' කියන ඒ බීජ ගණිතමය වගේ පෙනෙන සිද්ධාන්තයට අපි ඇතුල් කළොත් අර අංග දෙක, ඒ කියන්නෙ, ජාතියත්

ජරාමරණයක් ඇතුල් කළොත්, මේ විදියට අපට කියන්න සිද්ධ වෙනව. 'ඉමස්මිං සති ඉදං හොති' කියනව වෙනුවට, ජාතියා සති ජරාමරණං හොති. ජාතියා උප්පාදා ජරාමරණං උප්පජ්ජති, ජාතියා අසති ජරාමරණං න හොති, ජාතියා නිරොධා ජරාමරණං නිරුජ්ඣති.' ඔය විදියට කියන්න සිද්ධ වෙනව. එතකොට මේක සිංහලට හැරුවොත්, බැලුබැල්මට ටිකක් අමුත්තක් පේනව. 'උපත' කියලයි සාමාන්‍යයෙන් ජාති කියන එක තේරන්නෙ. 'උපත' ඇති කල්හි ජරා මරණය වෙයි. උපතෙහි 'ඉපදීමෙන්', එහෙම නැත්නම් හටගැනීමෙන්, ජරාමරණයද හටගනී. උපත නැති කල්හි ජරාමරණය නොවෙයි. උපතෙහි නිරුද්ධ වීමෙන් ජරාමරණය නිරුද්ධ වෙයි. මේ ජාති, ජරාමරණ, කියන අංග දෙක ගැන කල්පනා කරල බැලුවත් මෙතන මේ යෙදුන ආකාරය අමුතුයි. ජාතිය - උපත - උපදින්නෙ කොහොමද? මෙතන 'උපත' උපදිනව වගේ, මේ කියන හැටියට. ඒ වගේම ජරාමරණය මැරිල යනව. ජරාමරණයෙ පාට පේදිල යනව. එහෙම ගතියකුත් තියෙනව. මේක වෙන්නෙ කොහොමද කියන එකට පිළිතුරු ඉදිරියට එන දේශනාවලදී අපට ටික ටික හෙළිවෙන්නත් පුළුවනි. ප්‍රධාන වශයෙන්ම අපි මෙතැනදී ඉදිරියට ගනිමු දීඝ නිකායෙ මහා නිදාන සූත්‍රයෙ තිබෙන පටිච්ච සමුප්පාද විග්‍රහයෙ එන එක්තරා ඡේදයක්.

බුදුපියාණන් වහන්සෙ වදාරනව: "එත්තාවතා බො ආනන්ද ජායෙථ වා ජීයෙථ වා මීයෙථ වා උපපජ්ජෙථ වා, එත්තාවතා අධිවචන පථො එත්තාවතා නිරුත්තිපථො එත්තාවතා පඤ්ඤත්තිපථො එත්තාවතා පඤ්ඤාවචරං එත්තාවතා වට්ටං වත්තති ඉත්ථත්තං පඤ්ඤාපනාය යදිදං නාමරූපං සහ විඤ්ඤාණෙන"[14] කියල. මේ විදියෙ ඡේදයක් එනව. "ආනන්දය, මෙතෙකින්ම කෙනෙක් උපදනේ වෙයි. දිරන්නේ වෙයි. මැරෙන්නේ වෙයි. චුතවන්නේ වෙයි. යළි උපදනේ වෙයි. මෙතෙකින්ම - මේ තාක් දුරට - අධිවචන මාර්ගයක් වෙයි. මේතාක් දුරට නිරුක්ති මාර්ගයක් වෙයි. මේතාක් දුරට ප්‍රඥප්තිමාර්ගයක් වෙයි. මේ තාක් දුරට ප්‍රඥාවගේ බැසගැනීමක් වෙයි ඉත්ථත්වයක් පෙන්නුම් කිරීම සඳහා මේ සංසාර වට්ටය, සංසාර නමැති මේ දියසුළිය, මෙතෙක් දුරට කරකැවෙනවය."

මේ 'ඉත්ථත්ත' කියන වචනය දැනට අපි විග්‍රහ කරන්නෙ නැහැ. ඉදිරියෙදී ඒකෙ අර්ථයත් ටික ටික ලිහිල යන්න පුළුවනි. දැනට අපට හිතාගන්න තියෙන්නෙ, 'එත්තාවතා වට්ටං වත්තති ඉත්ථත්තං පඤ්ඤාපනාය', 'මේතාක් දුරට ඉත්ථත්වයක් පෙන්නුම් කිරීම සඳහා සංසාර දියසුළිය කරකැවෙයි.' කොතෙක් දුරටද කියන එක නාම කියැවුනේ නැහැ. ඒක අගටයි කියැවෙන්නෙ. ඒක බුද්ධ දේශනා ශෛලියෙ එක්තරා ලක්ෂණයක්. 'යදිදං නාමරූපං සහ විඤ්ඤාණෙන' එනම්, නාමරූපය විඤ්ඤාණය සහිත වූ කල්හි. මීට අමතරව වචන කීපයකුත් සමහර සංශෝධනවල තියෙනව. ඒ, අටුවාවලින් එකතු කරගත්තු වචන. 'අඤ්ඤමඤ්ඤපච්චයතාය පවත්තති' කියල. ඒක බුද්ධ දේශනාවලට අදාළ එකක් නොවෙයි. ඒක හොඳටම තේරෙනව. ඒ වාක්‍යය සම්පූර්ණයි, 'යදිදං නාමරූපං සහ විඤ්ඤාණෙන'

සිව්වහම. එයින් කියන්නෙ, 'නාමරූපය යම්තාක් කල් විඤ්ඤාණය සහිතව තිබෙනවද, ඒ තාක් කල්, අන්න එතෙක් දුරට, කියන එකයි. කලින් අර මෙතෙකින් කියල කිව්වෙ, මේ අග පද දෙකට සම්බන්ධ කරලයි, ඒක ගන්න තියෙන්නෙ. යම්තාක් කල් නාමරූපය විඤ්ඤාණය සහිතව පවතිනවද ඒ තාක් කල් කෙනෙක් උපන්නායි කියල කියන්න පුළුවන්, චුතවෙනව කියල කියන්න පුළුවන්, යළි උපදිනව කියල කියන්න පුළුවන්. 'එත්තාවතා අධිවචනපථො', මෙන්න මේතාක් දුරටයි අධිවචන මාර්ගයක් තියෙන්නෙ. සාමාන්‍යයෙන් භාෂාවල තියෙන අධිවචන, නිරුක්ති, ප්‍රඥප්ති, කියන ඒව භාෂාව පිළිබඳ අංගෝපාංග කියල දැනට හිතාගන්නාම ඇති - අධිවචනමාර්ග, නිරුක්තිමාර්ග, මේ ඔක්කොම මෙන්න මේ තාක් දුරටයි තියෙන්නෙ. ඒ වගේම, 'පඤ්ඤාවචරං' ප්‍රඥාවගේ බැසගැනීමත් මේ තාක් දුරටයි. ඒ කියන්නෙ, විඤ්ඤාණයත් නාමරූපයත් එකට තියෙනවා නම්, එතැන තියෙනව මේ ඔක්කොම. මුළුමහත් සංසාරයෙම රහස මෙන්න මේ දියසුළිය තුළ ගැබ්වෙල තිබෙනව. මේ 'වට්ට ආවට්ට ශබ්දය යෙදෙනව දියසුළියට. ඒක දියසුළිය සඳහා යෙදෙන බව. ඒකත් ඉදිරියෙදි හෙළිවෙන්න පුළුවනි. දැන් කාලයේ ඒ අර්ථත් හුඟක් දුරට මැකිල ගිහින්. අටුවාවල, නූතන පරිවර්තන ආදියෙ, 'වට්ටං වට්ටති' කියන එක තෝරගන්නෙ 'සසර වැහි' කියලයි. වැස්සට සම්බන්ධ කරල තෝරනව. එහෙම එකක් නොවෙයි. මෙතන කියැවෙන්නෙ. මේ දෙක අතර තියෙන එක්තරා කරකැවිල්ලක්, 'වට්ට' කියල තියෙන්නෙ එක්තරා කරකැවිල්ලක්. දියසුළියක් වැනියි සංසාරවට්ටය. මෙතනින් අපට හෙළිකරගන්න පුළුවන් එක කාරණයක්. අපි අර මුලදිම, පළමු දේශනයේදීම, නාමරූපය ගැන කථා කිරීමෙදි 'නාම' කියන වචනය, නමට, නැත්නම් ප්‍රඥප්ති ආදියට සම්බන්ධ දෙයක් කියල විග්‍රහ කළෙත් මෙන්න මේ විදියෙ විවරණ ඉදිරියට තියෙන නිසයි. දැන් මෙතනින් පැහැදිලිවම පෙනෙනව, අධිවචන, නිරුක්ති, ප්‍රඥප්ති මාර්ග මේ ඔක්කොම නාමරූප - විඤ්ඤාණ දෙක අතරට සම්බන්ධ දේවල් කියන එක.

දැන් ඊළඟට අපි මේ දියසුළිය මේ තරම් වැදගත් හැටියට දක්වල තියෙන නිසා, දියසුළියක් හැදෙන හැටි, දියසුළියක් හැදීම පිළිබඳ ධර්මතාවට, හිත යොමුකරල බලමු. කොහොමද දියසුළියක් හැදෙන්නෙ? ගඟක, මුහුදක, ගැඹුරුම තැන තමයි දිය සුළිය. මේ දිය සුළිය හැදීමෙදී පළමුවෙන්ම හිතාගන්න තියෙන්නෙ මෙන්න මේ ආකාරයටයි සිද්ද වෙන්නෙ කියල. ඔන්න අපි හිතමු, ගඟක වතුර පහලට ගලාගෙන යනව. ඒක ගඟේ ස්වභාවයයි. ගඟේ ස්වභාවය පහලට ගලාගෙන යාමයි. නමුත් යම්කිසි දියවැලක් කල්පනා කරනව 'මට පුළුවන් ඉස්සරහට යන්න' කියල ඔය දියවැල ඉදිරියට උඩහට යනව. අර ගඟේ පහලට ගලාගෙන යන වතුරෙන් වෙන් වෙලා ඉදිරියට යනව. ටිකක් දුර ඉදිරියට ගියාට පස්සෙ අර මහ ජලකඳේ හැපිල, තෙරපිල, විසිවෙල, වටරවුමෙ ගිහිල්ල, ආයිමත් ඇවිල්ල අරකෙ තෙරපීම නිසාම සම්බන්ධවෙල ආයිමත් ඉදිරියට යන්න උත්සාහ කරනව. එතකොට, හිතට නගාගන්න පුළුවනි අපි හැම

කෙනෙකුටම, ඔය විදියට දියවැල ඉදිරියට ගිහිල්ල, එක තැනකදි හැපිල විසිවෙල, වටරවුමෙ ගිහිල්ල, ආපසු කරකැවෙනව, ඔන්න ඔතැන දැන් කරකැවිල්ලක්, චක්‍රයක්. එතැන එක්තරා වටවළල්ලක යාමක් පටන් ගන්නව. ඔය විදියට මේ වටවළල්ලෙයාම ක්‍රමක්‍රමයෙන් කාලයක් තිස්සෙ යන්න යන්න, දියවැල තේරුම් ගන්නව 'මට ඉස්සරහට යන්න බැහැ' කියල, එහෙනම් ඊළඟට මොකක්ද කරන්නෙ? පතුල දිහාවට යන්න බලනව, පාතාලය දෙසට, හරියට අර තිරිගෝට්ටක හැඩේට, එහෙම නැත්නම් පුනීලයක හැඩේට, දියසුළිය යටට හාරගෙන හාරගෙන යනව. දැන් මේක පතුල නොපෙනෙන පාතාලයක් වෙන තරමට හාරගෙන හාරගෙන යනව. ඒ අතරෙ මොකක්ද වෙන්නෙ? අර පාතාලයෙ ඇති ඌනත්වය පිරවීමට නොයෙකුත් විදියෙ දේවල් ඇදගන්න ශක්තියකුත් - ආකර්ෂණ බලවේගයකුත් - මේ දියසුළියට ලැබෙනව. අවට තිබෙන අතුඉති, ගස්කොළං, මලකුණු හැම එකක්ම ඇදල ගන්න පුළුවන් එක්තරා විදියක උපාදානයකුත් ඇතිවෙනව. අර තණ්හාව පිරීමට "සුරුසුරු" ගගා අරව ඔක්කොම ඇදල ගන්න ස්වභාවයක් මේ දියසුළියෙ ඇතිවෙනව. එතකොට මෙතැන මහා ජවයකින්, වේගයකින්, කරකැවෙන දියසුළියක්. ක්‍රමක්‍රමයෙන් නිම්වළල්ලත් විශාල වෙනව. මහා භයානක තත්වයක් මෙතැන තියෙන්නෙ.

මේ ක්‍රියාකාරීත්වය මේ විදියට තියෙන කොට, මේකට අත දික්කරල අපට පෙන්නන්න පුළුවන්. දැන් ගඟක, මුහුදක, වතුරවල මේ වගෙ ක්‍රියාකාරීත්වයක් තියෙන කොට, අපට පෙන්නුම් කරන්න පුළුවන්. 'අතන' කියල කියන්න පුළුවන්, 'මෙතන' කියල කියන්න පුළුවන්. 'ඔන්න ඔතැන' කියල කියන්න පුළුවන්, ඔහොම තත්වයක් එනව. මක්නිසාද? මෙතැන එක්තරා ක්‍රියාකාරීත්වයක් තියෙන නිසා. සාමාන්‍යයෙන් ලෝකයා ක්‍රියාකාරීත්වක් තියෙන තැනකට තමයි ඒකකයක් කියල කියන්නෙ. නූතනයෙ යෙදෙන වචනයක් 'ඒකකයක්' කියන එක. එහෙම නැත්නම් මධ්‍යස්ථානයක්. එහෙම නැත්නම් ආයතනයක්. ඔය ක්‍රියාකාරීත්වයක් ඇති තැනකට, 'ඒකක', 'මධ්‍යස්ථාන', 'ආයතන' ආදී පද යෙදෙනව. ඔන්න එතකොට අර දියසුළියත් දැන් මහ වැඩකොටසක් කෙරෙන තැනක්. ඒක නිසා මේකට නමකුත් දෙන්න පුළුවන්. 'අතන' කියල කියන්න පුළුවන්. එහෙම නැත්නම් 'අර තැන' කියන්න පුළුවන් 'මෙතන' 'මේතැන', 'මෙයා' කියන්න පුළුවන්. ඔය විදියට නොයෙකුත් ආකාරයෙන් පුරුෂත්වයක් ආරෝපණය කරල හරි, නැතිව හරි, මේක පෙන්නුම් කරල කියන්න පුළුවන්. 'අධිවචන පථ', 'නිරුක්ති පථ' 'පඤ්ඤත්තිපථ' විවෘත කරන්න පුළුවන්, මේ දියසුළිය අනුව. නමුත් මෙතන තිබෙන ක්‍රියාවලිය ගැන අපි හිත යොදල බැලුවොත්, මොකක්ද මෙතන මේ කෙරෙන්නෙ? මෙතැන මහ විපර්යාසයක්. අර දියවැල හිතා ගන්නව - අවිද්‍යාවෙන්, මෝහයෙන් - 'මට පුළුවන් ඉදිරියට යන්න' කියල. එහෙම ගිහිල්ල හැපිල, වටරවුමෙ එක්තරා නිෂ්ඵල ගමනකයි මේ යෙදෙන්නෙ. පතුල දක්වාම හාරගෙන යන නිෂ්ඵල ගමනක යෙදෙන්නෙ. එතකොට ඒ එක්කම 'අවිද්‍යාව' එක පැත්තකින් තියෙනව, අනිත් පැත්තෙන් අර දියසුළියෙන් හැරුන

මහාපකාලය නිසා 'කණ්ණාවක්'. ඒ කණ්ණාව පිරෙන්න ඊළඟට වටපිට තියෙන දේවල් හැම එකක්ම ඇදගන්න ස්වභාවයකුත් තියෙනව මහ උපාදානයක්. ඔන්න ඔතන තමයි ඉතින් භවය තියෙන්නෙ. දැන් මේකත එහෙම පිටින්ම ක්‍රියාකාරී මධ්‍යස්ථානයක්.

මේ දිය සුළියෙ ස්වභාවය අපට දකින්න පුළුවන් අපේ මේ ශරීරයෙ පවා. මේ ආශ්වාස ප්‍රශ්වාස - මෙතැනත් තියෙන්නෙ හිස්වීම් පිරවීම් ගොඩක්. අපි 'ප්‍රාණය' කියල කියන මේ ආශ්වාස ප්‍රශ්වාසයෙ තියෙන්නෙත් අර දිය සුළියෙ ක්‍රියාකාරීත්වය වගේ දෙයක්. මේ පෙනහළුවල ක්‍රියාකාරීත්වයත් අර විදියෙ දෙයක්. අපේ හෘදය වස්තුව - අපේ රුධිරධාවනය මේ කොයි එකත් ගත්තත් එක්තරා විදියක කරකැවිල්ලක් තිබෙන්නෙ. බැලූ බැල්මට මේක 'ස්වයංක්‍රියත්වයක්" වගේ. සාමාන්‍ය ලෝකයා 'ස්වයංක්‍රිය' කියල වචනයක් යොදනව 'මේ කාලයේ. තමන්ටම කරන්න පුළුවන් ස්වභාවයක් වගේ මේකත තියෙන්නෙ. නමුත් බලනකොට මේකත මහ විපර්යාසයක්. අර ආශ්වාස - ප්‍රශ්වාස ආදී හැම එකකම එකිනෙකට ප්‍රතිවිරුද්ධ ධර්ම දෙකක සට්ටනයක්. අර දියසුළිය වගේම තමයි. දියවැල මහ ජලකඳත් එක්ක හැප්පිල පෙරළිල කරන මහා විපර්යාසය වගේම තමයි මේ මුළුමහත් පැවැත්මම. භවය පුරාම ඔය ලක්ෂණය තිබෙනව. අපේ ශරීරය පිළිබඳවත් ඒ වගෙයි. වැඩිදුරට නොකිව්වත් තේරුම් ගන්න පුළුවනි, සමාජයෙ පැවැත්මත් ඒ වගෙ එකක්. දැන් සමාජයෙ පැවැත්ම ගැන, සමාජ ජීවිතය ගැන, සමාජ ධර්ම ආදිය ගැන, කල්පනා කරල බලන කොට, අපට අයිතිවාසිකම්' භුක්ති විඳින්න නම් අපි යුතුකම් ඉෂ්ට කරන්න ඕන. මේකත 'අන්‍යොන්‍යාපේක්ෂා' 'බහිජටා' තත්ත්වයක් තියෙන්නෙ. අයිතිවාසිකම් භුක්ති විඳින්න යුතුකම් ඉෂ්ට කරන්න ඕන. ඒ වගේම බලතල පාවිච්චි කරන්න නිදහස තියෙනව, නමුත් වගකීම්වලින් බැඳිල. ඔන්න ඔතැනත් තියෙන්නෙ 'අන්‍යොන්‍යාපේක්ෂා බහිජටා' වගේ තත්ත්වයක්. ඔය විදියට සමාජය පිළිබඳවත් එහෙමයි. ආර්ථික මූලධර්ම පිළිබඳව - අපි ඉතින් ඒව විස්තර වශයෙන් නොකිව්වත් කෙටියෙන් සඳහන් කළොත්, ඒ අර්ථ ක්‍රමය ගැන කල්පනා කරල බැලුවත් මහ පුදුම අඳමේ තත්ත්වයක් තියෙන්නෙ. දැන්, යම් යම් නිෂ්පාදන පිළිබඳව කල්පනා කරල බලන කොට, ඒ නිෂ්පාදනවලට වෙළඳ පොළක් ලැබෙන්නෙ ඉල්ලුමක් තිබුණොත්. සිංහලයෙන් කියනව නම් 'ඉල්ලුම - සැපයුම' කියල පද දෙකක් තියෙනව. පාරිභෝගිකයගෙ ඉල්ලුමක් තියෙනව නම් තමයි ඒකට සැපයුමක් තියෙන්නෙ. එතකොට ඉල්ලුමත් සැපයුමත් අතර මහ පෙරළිමක්, මහපටලැවිල්ලක්, මේ ආර්ථිකය පිළිබඳව තියෙන්නෙ. ඒක නිසා තමයි අර සමහර ධනවත් රටවල්, වෙළඳ පොළේ මිල ගණන් පහත බහින නිසා අතිරික්ත ධාන්‍ය - වැඩිපුර නිපදවන ධාන්‍ය - මුහුදට හිහිං දාන්නෙ. මේක බැලූවහම විහිළුවක් වගේ. නමුත් අර ආර්ථික මූල ධර්මය නිසයි. පැවැත්මේ තියෙන භයානකත්වයත් මෙතැනින් හෙළි වෙනව. මේකට උපමාවක් කියනොත් - අපි විකකට හිතමු, එක ප්‍රමාණයෙ සර්පයින් දෙදෙනෙක් එකිනෙකා ගිලගන්න උත්සාහ කරනව. එකෙක් අනිකගෙ වල්ගෙ ඉඳන් ගිලිගන්න පටන්ගන්නව. ඔය

විදියට දෙන්නම ගිලගෙන ගිහිල්ල, මැදට ආවම, අපට මොකක්ද දකින්න ලැබෙන්නෙ? 'සජී චක්‍රයක්'. ඔය සජී චක්‍රයෙ එකිනෙකා ගිලගන්න ගන්න උත්සාහය ඉෂ්ට කරගන්න වටේට, රවුමට, යනව, ඒක කවදාවත් විසඳෙන තත්ත්වයක් නොවෙයි. ලෝභ, දොස, මෝහ වගේ. ඔය විදියෙ වටරවුමක් යනව. ඔය සර්ප චක්‍රයෙ තියෙනව වගේම එක්තරා අවදානම් තත්ත්වයක් අපේ ශරීරයේ ආශ්වාස ප්‍රශ්වාස පිළිබඳව, ලේ ධාවනය පිළිබඳව, සමාජයේ පැවැත්ම පිළිබඳව, ආර්ථිකය පිළිබඳව, මේ හැම එකේම තියෙන්නෙ මහ පුදුම අන්දමේ - අවදානම් අන්දමේ - සමබරතාවක්. අවදානම් අන්දමේ සමබරතාවක්.

මේකම තමයි අර භවය පිළිබඳ ඒ පැවැත්මේ ඇති දුක. බුදුපියාණන් වහන්සේ දුටුව දුක. සමුදය පක්ෂය ගැන කල්පනා කරල බලනකොට, ලෝකයෙ තියෙන දුඃඛ ස්වභාවය. බැලූ බැල්මට මේ හැම එකකම ස්වයංක්‍රියත්වයක් වගේ පේනව. මේ ශරීරය පිළිබඳවත් එහෙමයි. මේ යන්ත්‍ර ගැන කල්පනා කරල බැලුවත්, සමහර විට ජලපොම්ප ආදිය, එහෙම නැත්නම් විදුලි උපකරණ ආදිය, හැම එකක්ම ප්‍රතිවිරුද්ධ ධර්ම දෙකක සංකලනයෙනුයි ක්‍රියා කෙරෙන්නෙ. ඔය විදියට බැලුවාම කිසිම දෙයක ස්වයංක්‍රියත්වයක් නැහැ. 'ඔටෝ මැටික්' දෙයකවත් 'ඔටෝ' බවක් නැහැ. ඇත්තවශයෙන් තියෙන්නෙ 'දුකයේ දරා සිටීමක්.' මේක තමයි අර 'දුඃඛ' කියන කෙටි වචනෙ තේරුම. 'දුඃ' කියන්නෙ දුකයේ, 'ඛ' කියන්නෙ දරා සිටීම. 'දුකයේ තමුන් දරාසිටිනව. දරා සිටින තමුන් දුකයි.' එතකොට 'දුඃඛ' කියන එකේ අර්ථය ඔතනින් ගන්න පුළුවනි.

මේ එක්කම අපට තවත් කාරණයක් මෙතැනින් හෙළිවෙනව. මේ දියසුළියේ ක්‍රියාකාරිත්වය නිසාම 'මෙතන' කියල කියන්න පුළුවන් තත්ත්වයක් ඇති වුනා. අපි තේරුම් නොකළ වචනයක් තියෙනව 'ඉත්ථත්තං' කියල, කලින් සඳහන් කළ පාඨයේ. 'එත්තාවතා වට්ටං වට්ටති ඉත්ථත්තං පඤ්ඤපනාය. 'ඉත්ථත්වයක්' දැක්වීම සඳහා මේ සංසාර වට්ටය කරකැවෙයි කියල. ඔන්න දැන් 'ඉත්ථත්තං' කියල කියන්නෙ මොකක්ද බලමු. 'ඉත්ථං' කියල කියන්නෙ 'මෙසේ බව', එතකොට, 'මෙසේ බවක්' දැක්වීමට පුළුවන් තත්ත්වයක් ඇතිවෙනව, අර දිය සුළිය නිසා. මේ කාරණය හොඳට පැහැදිලිවෙන ගාථා දෙකක් සුත්තනිපාතයේ ද්වයතානුපස්සනා සුත්‍රයේ සඳහන් වෙනව.

'ජාතිමරණසංසාරං - යෙ වජන්ති පුනප්පුනං
ඉත්ථභාවඤ්ඤථාභාවං - අවිජ්ජායෙව සා ගති
තණ්හාදුතියො පුරිසො - දීඝමද්ධාන සංසරං
ඉත්ථභාවඤ්ඤථාභාවං - සංසාරං නාතිවත්තති'[15]

මේ ගාථා දෙකේම 'ඉත්ථභාව' අඤ්ඤථාභාව යන පද දෙක සඳහන් වෙනව. බොහොම වැදගත් කාරණයක් බව මෙතැනින් හෙළිවෙනව. එතකොට පළමුවෙන් කියැවුනේ 'යම් කෙනෙක් ජාතිමරණ දෙක අතර මේ වට රවුමෙ කරකැවිල්ලක් වශයෙන් නැවත නැවත ගමන් කරත්ද,

'ඉත්ථභාව අඤ්ඤථාභාවයක්' වන මේ සංසාර ගමන අවිද්‍යාවගේම ගමනය - 'අවිජ්ජාය + එව සා ගති' ඒ ගමන අවිද්‍යාවෙන්ම යැවෙන ගමනක් කියන එකයි. ඊළඟ ගාථාවෙ කියැවෙන්නෙ, තණ්හාව දෙවැන්නා කොටගත්- දෙවැන්නා කියල කියන්නෙ, දුක් ගමනක් යනකොට දෙවැන්නෙක් එක්කරගෙන යන සිරිතක් තියෙනවනේ සමහරුන්ගෙ - සගයෙක්, - ඒ වගේ - 'තණ්හාදුතියො පුරිසො' මේ සංසාරගත පුද්ගලය තණ්හාව දෙවැන්න කොටගෙන, යහළුව කරගෙනයි යන්නෙ. දීර්ඝ කාලයක් සංසාරයේ ගමන් කරන්නේ, ඉත්ථභාව අඤ්ඤථාභාව ස්වභාවය ඇති මේ සංසාරය නොඉක්මවයි. මෙයින් බේරෙන්නෙ නැතෙයි කියන එකයි.

අපි කලින් කිව්ව 'මෙතනක්' පහළවුනා කියල, අර දිය සුළිය නිසා. ඇත්ත වශයෙන්ම කෙනෙකුගේ උත්පත්තිය - කෙනෙක් උපන්න කියල කියන්නෙ - 'මෙතනක්' පහළවීම. මහා ආශ්චර්යවත් දෙයක් සිද්ධ වෙනව. කෙනෙක් උපන්නා කියල කියන කොට, එහෙම නැත්නම් ඉත්ථත්වයක් ඇතිවෙනකොට, 'එතන' 'මෙතනක්' වෙනව. 'මෙතනක්' ලෝකෙට උපදිනව. මෙතන 'ඉත්ථභාව' කියන එක තව තේරුම් කළ යුතුව තිබෙනව - 'ඉත්ථභාව' 'අඤ්ඤථාභාව' කියන පද දෙකම. 'ඉත්ථත්ත' කියන්නෙ 'මෙසේ බව.' මේ යුගල හැටියට එකකොට යෙදෙන්නෙ, 'ඉත්ථභාව - අඤ්ඤථාභාව' යයි. 'අඤ්ඤථාභාව' කියල කියන්නෙ මීට වෙනස් බව. මෙසේ බවත්, මීට වෙනස් බවත්. ප්‍රතිවිරුද්ධ ධර්ම දෙකක සංඝට්ටනාව එතැනින් පේනව. අඤ්ඤථාභාව කියල කියන්නෙ මීට වෙනස් බව නිසා කෙටියෙන් අපට සලකගන්න පුළුවනි 'මෙසේ බව' හා 'අන්සේ බව' කියල. අපට වචනයක් හදන්නත් වෙනව. මේව ගැන වැඩිය සාකච්ඡා නොකරපු නිසා වචන හදන්නත් වෙන විදියයි පෙනෙන්නෙ. ඉත්ථභාව අඤ්ඤථාභාව 'මෙසේ බවත්' 'අන්සේ බවත්' කියල දෙකක්. දැන් මේ කාරණය ගැන තව ටිකක් කියන්න ඕන සමහර කෙනෙකුට සැකයක් ඇතිවෙන්න පුළුවන් නිසා. අටුවාවල මේක තේරන්නෙ ඉතාමත්ම ලිහිල් කරගෙන. සුත්තනිපාතයෙ මේ තරම් වැදගත් ගාථා දෙකටම අටුවාව සපයන අවස්ථාවෙදි, මේ ඉත්ථභාව අඤ්ඤථාභාව කියන වචන දෙක තේරන්නෙ මෙහෙමයි. ඉත්ථභාව කියන එක තේරන්නෙ 'ඉමං මනුස්සභාවං' - 'මේ මනුෂ්‍යභාවය' කියල, අඤ්ඤථාභාව කියන එක තේරන්නෙ 'ඉතො අවසෙස අඤ්ඤනිකායභාවං'[16] කියල. 'මේ මනුෂ්‍යභාවයෙන් අනාවූ අනෙකුත් භව කියන එකයි. නමුත් මේ 'ඉත්ථත්ත' කියන එකේ මූලික අර්ථය, ගැඹුරු අර්ථය, තේරුම් ගන්නෙ නැතිබව පේනව.

මේ අටුවාව දෙන අර්ථ වැරදි බව පෙන්නන්න හොඳ සාධකයක් දීඝ නිකායෙ පාථික සූත්‍රයෙන් හෙළිවෙනව. පාථික සූත්‍රයෙ සඳහන් වෙනව -ඒක කෙටියෙන් කියනොත් - කල්ප විනාශ අවස්ථාවෙදි ශූන්‍යවූ බ්‍රහ්ම විමානයක් පහළ වෙනවය. ඒකෙ කවුරු හරි ගිහින් උපදිනවය. ඉපදිල කලක් එතන තනියම ඉන්න කොට, තනිකම වැඩි නිසා කල්පනා කරනවා 'අහො වත අඤ්ඤෙපි සත්තා ඉත්ථත්තං ආගච්ඡෙය්‍යුං'[17] - 'අනේ තවත්

සත්ත්වයින් මෙතනට - මේ ඉත්ථත්වයට එනවනම්, කියල. එතන ඉත්ථත්වය කිව්වෙ මනුෂ්‍ය ලෝකය නොවෙයි නේ. එතන කියන්නෙ බ්‍රහ්මලෝකය. බ්‍රහ්මලෝකයෙ ඉඳන් බලනකොට ඉත්ථත්වය බ්‍රහ්මලෝකයයි. මනුෂ්‍යලෝකයෙ ඉන්න අපටයි ඉත්ථත්වය මනුෂ්‍යලෝකය වෙන්නෙ. එතකොට, මේක සාමාන්‍ය පටු අර්ථයකින් ගත්තොත් මනුෂ්‍ය ලෝකය කියල ගන්න පුළුවන් උනාට, මෙතන විශේෂයෙන්ම යෙදිල තියෙන්නෙ, මුළු මහත් සංසාරයම ගැන කියන කොට, මනුෂ්‍යලෝකෙ එක පැත්තකට දාල අනික් ඒව වෙන පැත්තකට දම්මත් නොවෙයි මෙතන තියෙන්නෙ. මෙතන ධර්මතාවක් දක්වන්නෙ. අර දියසුළියෙ වගේ ඉත්ථභාවයත් එක්කම තියෙනව අඤ්ඤථාභාවයක්. පැවැත්මේ තිබෙන සටහනයි මෙතනින් පෙන්නුම් කරන්නෙ. යම් තැනක ඉත්ථත්වයක් ඇති උනා නම් - 'මෙතන' කියල දෙයක් ඇති උනානම්, ඒ එක්කම 'අන්‍යවූ තැනක්' ඇතිවීමේ ස්වභාවයකුත් තියෙනව. 'ඉත්ථත්ත' එක්කම 'අඤ්ඤථාභාව' කියල කියන වෙනස්වීම තිබෙනව. අනිත්‍යතාව තෝරන කොට යොදන පද නමයි 'විපරිනාම අඤ්ඤථාභාව'. එතනත් අඤ්ඤථාභාව කියල කියනව. විපරිනාමය වෙනව. 'පරිනත' කියල කියන්නෙ හොඳට මෝරපු අවස්ථාව. විපරිනාම කියන වචනයෙන්ම හැඟෙනව උස්සෙල්ලම පරිනතයක් ගැන අදහසක් තිබුන බව. විපරිනාම අඤ්ඤථාභාව කියල කියන්නෙ, ඔන්න හොඳ පරිනත තත්වය, මෝරපු තත්වය කියල හිතාගෙන ඉන්නව. නමුත් දන්නෙම නැතිව ඒක විපරිනාමයට හැරෙනව. වෙනස් බවට හැරෙනව. 'අඤ්ඤථාභාව' - වෙන දෙයක් බවට පත්වෙනව. මෙන්න මේක ලෝක ස්වභාවයක්. අනිත්‍යතා ධර්මයේම ස්වභාවයක් බව පේනව. මුල් කාලයෙ අනිත්‍යතාව පිළිබඳව තේරීමේදී සංඛත ලක්ෂණ වශයෙන් දක්වන්නෙ 'උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති'[18] කියල. 'උපතක් පෙනෙනව, ගෙවී යාමක් පෙනෙනව, 'ඨිතස්ස අඤ්ඤථත්තං - 'ස්ථිත' - 'තිබෙනව' කියල හිතන දෙයෙහි, වෙනස්වීමක්. අඤ්ඤථාභාවයක්, තිබෙනව. පසුකාලෙක මේක ශාස්ත්‍රීය වශයෙන් තෝරන්න ගිය අය මේක තුනක් හැටියට හදා ගත්ත, 'උප්පාද', 'ඨිති', 'භංග' කියල. නමුත් ධර්මතාව අනුව බලන කොට, වචන දෙකකින්ම, පද දෙකකින්ම, මේ තත්වය අල්ල ගන්න පුළුවන්. ඉත්ථභාවයකුත් තියෙනව අඤ්ඤථාභාවයකුත් තියෙනව. ඒක නිසා තමයි අර සමුදය - වය ආදී වශයෙන් බොහෝ අවස්ථාවල වචන දෙකකින්ම බුදු පියාණන් වහන්සේ අනිත්‍යතාව දක්වන්නෙ. අර 'ඨිතස්ස අඤ්ඤථත්තං' කීමෙ අදහස මොකක්ද? ලෝකයා සාමාන්‍යයෙන් 'ස්ථිති' කියල හිතන එක, ඇත්ත වශයෙන්ම ස්ථිතියක් නොවෙයි. ඒ ස්ථිතියෙ මුල ඉඳල අගටම තියෙන්නෙ අඤ්ඤථාභාවයක්. අපි මේක පටිච්චසමුප්පාදයෙ ජාතිජරාමරණවලට සම්බන්ධ කරල බැලුවොත්, මෙතනින් අපට පෙනෙන්නෙ අර ජාති - ජරාමරණ අංග දෙකේ සම්බන්ධය කොයිතරම් ද කියතොත්, - යම්කිසි කෙනෙක් උපදිනවත් එක්කම ඒ තැනැත්තගෙ අඤ්ඤථාභාවයත් පටන් ගන්න බවයි. මරණයත් එකනමයි.

අර පසුකාලීන ගාථාවක් නමුත් බොහොම අර්ථවත් ගාථාවක් තමයි, 'උපපත්තියා සහෙවෙදං- මරණං ආගතං සදා' ආදී ගාථාව. උපතත් සමගම හැමකල්හිම මරණය එනවා කියන එක. ඇඳුත්තකින් එකක් ඇදල ගන්න කොට අනික් එකත් ඇදිල එන්න වගේ, ජාතිය ඇදල ගන්න කොට ජරාමරණයත් ඇදිල එනව. බුදුපියාණන් වහන්සේ පහළ වෙන තාක් ලෝකයා හිතුවෙ ජරාමරණයෙන් තොර ජාතියක් අපට ලබාගන්න පුළුවන් කියල. භවයෙන් තොර උපාදානයක්. ඔය විදියට ඇඳුත්තේ ඇඳුතු ස්වභාවය - 'ඉදප්පච්චයතා' - නොතැකීම නිසා ලෝකයා අර විදියට මෝහයෙන් ප්‍රයත්නයක් යෙදුව. ඕක නිසා තමයි ගැටුමක් ඇති උනෙත්. එතකොට බුදුපියාණන් වහන්සෙගෙ ධර්මය අනුව අපට පෙනෙනව, උපතක් ඇතිඋනා කියල කියන්නෙ පළමුවෙන්ම 'මෙතනක්' ඇති උනා. ඇත්ත වශයෙන් කියනව නම් ආර්ය්‍යව්‍යවහාරයට අනුව ලෝකයක් මැනීමට, ලෝකයක් තැනීමට, කුසඳයක් ගැහුව වගෙයි, 'මෙතැනක්' ඇතිවීම. ඔය විදියට ජාතිය වශයෙන් කොතෙක් උපදින කොටම, ඉපදීමත් එක්කම ලබන පළමුවෙනිම 'උපන්දින තෑග්ග' තමයි මරණය. ඒ තැනැත්තට හිමිවන මරණය. ඔය විදියට අපට හිතාගන්න පුළුවන් ඉපැවහාව, අසදෘථාභාව කියන වචන දෙක ඉතාමත්ම ගැඹුරින්. මේ දියපුළිය පිළිබඳවත් තියෙන්නෙ ඒ විදියෙ දෙයක්. බැලූබැල්මට මෙතන 'වසවත්තන' ස්වභාවයක් තියෙනව. දැන් අර දියපුළිය දිහා ඇත ඉඳල බැලුවාම. 'වසවත්තන' කියල කියන්නෙ යම්කිසි දෙයක් තමන්ගෙ පාලනයෙහි පවත්වාගත හැකි ශක්තියයි. 'ආතම' කියන පදයෙ මූලික අර්ථයක් තමයි - ලෝකයා අතර තියෙන ආතම දෘෂ්ටියෙ මූලික හැඟීමක් තමයි - 'මට පුළුවන් මේව මගේ යටතෙ තබාගන්න' කියන එක. ඒක තමයි වසයෙ පවත්වනවයි කියන්නෙ. එතකොට දියපුළියක් දිහා බැලූ බැල්මට පේන්නෙ, ඒකෙ ස්වයංක්‍රියත්වයක් පෙනුන වගේම, වසවත්තන ස්වභාවයක්. දිය පුළිය අර හැම එකක්ම ඇදල ගන්නව වගේ පෙනෙනව නේ? නමුත් ඇත්තවශයෙන්ම මෙතන වසවත්තන ස්වභාවයක් නොවෙයි තියෙන්නෙ, අනාත්ම ස්වභාවයක්. ඒ කියන්නෙ, 'දියපුළිය' කියල හඳුන්වන්නෙ මොකක්ද කියල ගැඹුරින් විග්‍රහ කරල බැලුවාම, මෙතන තියෙන්නෙ දියවැලකුත් මහ ජල කඳකුත් අතර හැපීමක්. දෙකක් අතර හැපීමක් මිසක් එක් කෙනකුගෙ වැඩක් නොවෙයි. 'ඉදප්පච්චයතාව' එයින් පෙනෙනව. අන්න ඒක නිසා තමයි 'අත්තාපි අත්තනො නත්ථි'[19] තමාට තමාවත් අයත් නැත කියල කියන්නෙ. දිය පුළියට දියපුළියවත් අයත් නැත. ස්වයංක්‍රියත්වයක් නැත, 'ඔටෝ' බවක් නැත කිව වගේ මේ ලෝක ස්වභාවය ඕකයි. මේක තමයි ඉතින් දුක. මෙන්න මේ කාරණය තවදුරටත් බුදුපියාණන් වහන්සේ උදාන පාළියෙ දක්වනව, මේ ලෝකස්වභාවයම, මේ ලෝකයා, 'භවය' කියල අල්ලගෙන ඉන්න එක ඇත්තවශයෙන්ම 'අසදෘථාභාවයක්' - වෙනස්වීමක් - අනිත්‍යතාව ඒකෙම ඇතුල්වෙල තියෙන්නෙ.

'අයං ලොකො සන්තාපජාතො ඵස්සපරේතො රොගං වදති අත්තතො
යෙන යෙනහි මඤ්ඤති තතො තං හොති අඤ්ඤථා
අඤ්ඤථාභාවී භවසත්තො ලොකො භවපරේතො භවමෙවාභිනන්දති
යදභිනන්දති තං භයං යස්ස භායති තං දුක්ඛං
භව විප්පහානාය ඛො පනිදං බ්‍රහ්මචරියං වුස්සති.[30]

ඉතාම කෙටි පද කීපයක්. නමුත් බොහොම ගැඹුරක් තියෙනව. 'සන්තාපයට පත්වූ, ස්පර්ශයට ගැතිවූ මේ ලෝකයා රෝගයකට 'ආත්මය' යයි කියයි. 'යෙන යෙනහි මඤ්ඤති තතො තං හොති අඤ්ඤථා' - මේ මඤ්ඤති කියන වචනයත් එක්තරා විදියක ගැඹුරක් ඇති වචනයක්. කෙටියෙන් සඳහන් කළොත්, මඤ්ඤනාවන් කියන්නෙ තෘෂ්ණා, මාන, දෘෂ්ටි වශයෙන් යම් යම් දේවල් පිළිබඳව ප්‍රකල්පනය කිරීම, සිතීම. තණ්හා මාන දිට්ඨි වශයෙන් යම් කිසි දෙයක් ගැන හිතන කොට, ඒකට මඤ්ඤනා කියල කියනව. 'යෙන යෙනහි මඤ්ඤති' - යම් යම් දෙයක් මුල්කරගෙන, යම් යම් දෙයක් වස්තු කරගෙන, මඤ්ඤනාවල් පවත්වනව නම්, තණ්හා, මාන, දිට්ඨි වශයෙන් කෙනෙක් හිතනව නම් ඒ සිතිවිල්ලත් එක්කම, 'තතො තං හොති අඤ්ඤථා' - මොකද වෙන්නෙ, ඒකෙන් අඤ්ඤථාභාවයට මුලක් පැදෙනව. අර උපතත් එක්ක මරණය ආව වගේ. අන්න ඒක නිසා ඒ මඤ්ඤනාව නිසාම, අඤ්ඤථාභාවයට හැරෙන්න හේතුවක් ඇති උනා. ඒක වෙනස්වීමට පටන්ගත්තා. යමක් මෙයට වඩා වෙනස් වෙන්න පටන් ගන්නව නම් ඒක 'මෙයක්' වෙන්න ඕන. ඒක 'මෙයක්' වෙන්නෙ ඒකට අවධානය යොමුවෙලා තණ්හා, මාන, දිට්ඨි වශයෙන් ඒක මුළු මහත් ලෝකයෙන් වෙන් කරගෙන එකක් හැටියට අල්ල ගත්තහමයි. ඔන්න ඕක තමයි අර කියන්නෙ: 'යං යං හි ලොකස්මිං උපාදියන්ති - තෙනෙව මාරො අන්වෙති ජන්තුං[31]' කියල. ලෝකයා යම් යම් දෙයක් උපාදාන වශයෙන් අල්ලගන්නව නම් ඒ එක්කම මාරයත් පිටිපස්සෙන් එනව' කියල.

මුලින් සඳහන් කළ ගාථාවෙ ඉතිරි හරියෙ තේරුම බලමු. බුදුපියාණන් වහන්සෙ මේ ලෝකයා ගැන සංවේගයෙන් වෙන්න ඇති මේ ප්‍රකාශය කරන්න ඇත්තෙ. 'අඤ්ඤථාභාවී භවසත්තො ලොකො භවපරේතො' - මේ 'අඤ්ඤථාභාව' කියන වෙනස්වීම ස්වභාවය කොට ඇති, 'භවසත්තො ලොකො' - භවයෙහිම ඇලුනා වූ ලෝකයා, 'භවපරේතො' - භවයටම ගැතිවූ, 'භවමෙවාභිනන්දති' භවය ගැනම සතුටු වෙනව. ඊළඟට ප්‍රකාශ කරනව ඒකෙ ප්‍රතිඵලය: 'යදභිනන්දති තං භයං' - යමක් පිළිබඳව සතුටු වෙනව නම් - ඒ කියන්නෙ, භවය පිළිබඳවයි සතුට දක්වන්නෙ 'තං භයං' එය අනතුරායක්, එය භයක්. 'යස්ස භායති තං දුක්ඛං' - යමකටද බියවෙන්නෙ එය දුකක්. මොකටද බිය වෙන්නෙ? අර භවය කියල අල්ලගෙන ඉන්න එක වෙනස් වීමටයි. එතකොට වෙනස්වීම තමයි දුක. අල්ලගෙන ඉන්න එක භයට හේතුවක්. යම්කිසි කෙනෙක් තමාගේ සාක්කුවල මැණික් පුරවාගෙන යනව නම් ඒ පුද්ගලයා බොහොම භයකින් කොළඹ වගේ නගරයක යන්නෙ. මක්නිසාද, තමන් ළඟ තියෙන වටිනා දේ පිළිබඳව ඇති උපාදානය නිසා. අන්න ඒ වගේ භවය තමයි භයට

හේතුව, මේ භවය පිළිබඳව ඇල්ම ඇතිකරගැනීම. 'යදභිනන්දති තං භයං - යස්ස භායති තං දුක්ඛං' කියවන්නෙ ඇලුම් කරන ඒව වෙනස් වෙයි කියල. ඒ නිසා, ඒකම දුකක්. අන්න ඒ නිසාම, 'භව විප්පහානාය බො පනිදං බ්‍රහ්මචරියං වුස්සති' ඒ භවයෙන් මිදීමට, භවය ප්‍රහීන කිරීම සඳහා, බ්‍රහ්මචරියෙහි හැසිරෙනව කියල බුදුපියාණන් වහන්සේ දක්වා වදාළ. මෙතනිනුත් අපට පෙනෙනව භවය අසංස්කෘතභාවයම සවභාව කොට ඇති බව. මෙන්න මේ ධර්මතාව දැකීම තමයි ඉදප්පච්චයතාවෙ මූලිකම අදහස. ධර්ම චක්ෂුෂය පහළ උනා කියල කියන්නෙ මේ ලෝකයේ පැවැත්ම පිළිබඳ මේ තත්වය අවබෝධවීමයි. නමුත් මේකට විසඳුමත් එක්කමයි ඒ ධර්ම චක්ෂුෂය පහළවෙන්නෙ. 'යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරෝධධම්මං' මේ සමුදය පක්ෂය අනුව කල්පනා කරල බලන කොට, තෘෂ්ණා, මාන, දෘෂ්ටි වශයෙන් අල්ලාගන්නාම තමයි මේ දියසුළිය හැදෙන්නෙ. මේ දියසුළිය හැදුනට පස්සෙ තමයි අර විදියට තෘෂ්ණා උපාදානාදි වශයෙන් ලෝකයෙ තිබෙන තැනක් - අවට තිබෙන තැනක් - දේ ඇද ගැනීම් ආදී ක්‍රියාවලියක් හට ගැනෙන්නෙ. නමුත් මේකෙ නිරෝධයකුත් තියෙනව. මේක නවත්වන්නත් පුළුවන් දෙයක්. මක්නිසාද? මේක හේතු ප්‍රත්‍යයන්ගෙන් ඇති උන දෙයක් නිසා. දෙකක් මුල්වෙලා ඇතිඋන ක්‍රියාවලියක් නිසා - එතැන වසවත්තන සවභාවයක් නැති නිසා.

ඔන්න ඕක තමයි හැම එකටම අපි මුලදී සඳහන් කළේ 'අනිච්චං සංඛතං පටිච්ච සමුප්පන්නං' කියල. ඒ පද වලින් අපට තේරෙනව මේ ජාති ජරාමරණ ආදී අංග දොළහම අවිජ්ජා දක්වාම - මේ හැම එකක්ම පටිච්ච සමුප්පන්න ධර්ම. ඒ කියන්නෙ, මේව හේතු ප්‍රත්‍යයන්ගෙන් ඇතිවුන දේවල්. නිත්‍ය දේවල් නොවෙයි - 'අනිච්චං' මේව නිකං සකස්කරගත්තු දේවල් - 'සංඛතං' මේ 'සංඛතං' කියන එක නොයෙකුත් ආකාරයෙන් විග්‍රහ කරනව. කෙටිම අදහස, සකස් කරගත්තු. වාත්තු කරගත්තු, දේවල්, චේතනා වශයෙන් හිතාගත්තු දේවල්. පටිච්ච සමුප්පන්නං' - හේතු ප්‍රත්‍යයන්ගෙන් ඇති උනා. 'ඛයධම්මං' ඒක නිසාම ඒව ක්ෂය වෙන්නත් පුළුවන්. 'වයධම්මං' - ගෙවියන්නත් පුළුවන්. මරණයෙ මරණපාටත් මැකිල යන්න පුළුවන්. 'විරාග ධම්මං' - මේව මැකිල යන්න පුළුවන්. ජරාවෙ ජරා පාට මැකිල යන්නත් පුළුවන්. ඔය විදියෙ තත්වයක් තියෙනව. අන්න ඒක තමයි අපි කිව්වෙ ප්‍රඥප්ති ආදියට මේවයෙ සම්බන්ධතාවක් තියෙනව කියල. මේවයි මැකීයන සවභාවයක් තියෙනව. අන්න ඒක තේරුම් ගන්නව 'සමුදය - නිරොධ' කියන ධර්මතාව දුටුව පුද්ගලයා. දැන් එතකොට මෙතෙක් අපි ප්‍රකාශ කළේ සාමාන්‍ය ලෝකයා ගැන කල්පනා කරන කොට, මේ සංසාරය වට්ටයක් වගේය, දිය සුළියක් වගේය කියල.

ඊළඟට රහතන් වහන්සේලා ගැන මේ දියසුළිය පිළිබඳ අදහස කොහොමද යෙදිල තියෙන්නෙ? රහතන් වහන්සේලා ගැන කෙටියෙන්මත් ප්‍රකාශ කරල තියෙනව, 'වට්ටං තෙසං නත්ථි පඤ්ඤාපනාය'[22] කියල රහතන් වහන්සේලා පිළිබඳව - රහතන් වහන්සේලාට අනදික්කරල පෙන්නුම් කරන්න - දිය සුළියක් නැත.' මේක තමයි ගැඹුරුම තැන. ඒ කියන්නෙ,

දියසුළියටත් වඩා ගැඹුරු තත්ත්වයක් එතන තියෙන්නෙ. දියසුළිය නම් අපට පෙන්නුම් කරන්න පුළුවන් එතන යම්කිසි ක්‍රියා කාරීත්වයක් තියෙන නිසා. නමුත් රහතන් වහන්සේලා පිළිබඳව අපට තේරුම් ගන්න බැරි තත්ත්වයක් තියෙන්නෙ. 'තථාගත' - ඒක නිසා තමයි ඔය නොයෙකුත් ප්‍රශ්න පැනනැඟිල තියෙන්නෙ. ඒ අය පිළිබඳව. ඒ උත්තමයන් පිළිබඳව දිය සුළියක් නැහැ පෙන්නුම් කරන්න. දිය සුළියක් තියෙනව නම් අපට 'අරය' 'මෙයා' කියල පෙන්නන්න පුළුවන්. එහෙම තත්ත්වයක් නැහැ. 'වට්ටං තෙසං නත්ථි පඤ්ඤාපනාය.' ඊටත් වඩා හොඳ ලස්සන ගාථාවක් උදාන පාළියෙ සඳහන් වෙනව.

'අච්ඡෙජ්ජි වට්ටං බ්‍යගා නිරාසං - විසුක්ඛා සරිතා න සන්දති
ඡින්නං වට්ටං න වත්තති - එසෙවන්තො දුක්ඛස්ස' [23]

රහතන් වහන්සේ කෙනෙක් කරපු දේ මොකක්ද? 'අච්ඡෙජ්ජි වට්ටං' - දිය සුළිය කපා දැම්ම. 'දිය සුළිය සිඳ දැමීය.' 'බ්‍යගා නිරාසං' - 'ආශා රහිත තත්ත්වයට පැමිණියේය.' 'විසුක්ඛා සරිතා න සන්දති' - 'වියළී ගිය දියවැල නොගලයි' 'ඡින්නං වට්ටං න වත්තති' 'සිඳින ලද දිය සුළිය නැවතුරටත් කරකැවෙන්නෙ නැත. 'එසෙවන්තො දුක්ඛස්ස'- මෙයමයි දුකේ කෙළවර. එතකොට මෙතන කියන්නෙ රහතන් වහන්සේලා පිළිබඳව අන්න අර දියසුළිය සිඳ දැමීම තමයි අර්හත්වය. නිරෝධයයි. සමුදය පක්ෂයෙන් බලන කොට අර දියවැල උත්සාහ කරනව ඉදිරියට යන්න. ඒ උත්සාහය අතහැරියම ඉබේම අනිකුත් දේවල් ඔක්කොම සිදුවෙනව ඒ එක්කම.

මේ අදහස වඩාත් පැහැදිලිව දක්වෙන, ප්‍රශ්නෝත්තර වශයෙන් යොදන ගාථා දෙකක් සංයුත් සඟියෙ සඳහන් වෙනව, ඉතාමත්ම හොඳ ගැඹුරු අර්ථයක් පෙන්නුම් කරන ආකාරයෙන්. එක්තරා දේවතාවෙක් බුදුපියාණන් වහන්සේගෙන් ප්‍රශ්නයක් විමසනවා:

කුතො සරා නිවත්තන්ති - කත්ථ වට්ටං න වට්ටති
කත්ථ නාමඤ්ච රූපඤ්ච - අසෙසං උපරුජ්ඣති

'කුතො සරා නිවත්තන්ති' - කොහැනින් දියවැල් නවතින්ද? 'කත්ථ වට්ටං න වට්ටති' - 'කොතැනක දිය සුළිය නොකරකැවෙයි ද?' කත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣති'- 'කොතැනක නාමයත් රූපයත් සම්පූර්ණයෙන්ම නිරුද්ධ වේද?

බුදුපියාණන්වහන්සෙ මේකට පිළිතුරු දෙන ගාථාව මේ විදියටයි යන්නෙ:

'යත්ථ ආපො ච පඨවී - තෙජො වායො න ගාධති
අතො සරා නිවත්තන්ති - එත්ථ වට්ටං න වට්ටති
එත්ථ නාමඤ්ච රූපඤ්ච - අසෙසං උපරුජ්ඣති' [24]

'යත්ථ අපොච පඨවි - තෙජො වායො න ගාධති' බුදුපියාණන් වහන්සේගේ පිළිතුරේ මුල් පද දෙකයි ඒ. යම් තැනක පඨවි, ආපො,

තෙජෝ, වායෝ යන සතර මහාභූතයෝ 'න ගාධති' - ප්‍රතිෂ්ඨාවක් නොලබත්ද? අතො සරා නිවත්තන්ති' - අන්න එතැනින් තමයි අර දියවැල් හැරෙන්නෙ. 'එත්ථ වට්ටං න වට්ටති' - අන්න එතැන තමයි දිය සුළිය නොකරකැවෙන්නෙ. 'එත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣති' - අන්න එතනයි නාමයත් රූපයත් නිරවශේෂයෙන් නිරුද්ධ වෙන්නෙ. එතකොට මෙතනින් අපට පෙනෙනව, මේ 'යත්ථ' - 'එත්ථ' කියල කියන්නෙ අර නිර්වාණය බව. ඒක කොයි යම් ආකාරයෙන් හැඳින්වුවත් - 'සබ්බ සංඛාරසමථ' කිව්වත්, අසංඛත ධාතුව කිව්වත් - ඒ කොයි වචනයෙන් කිව්වත් - අර නිරෝධ තත්ත්වයයි. නිරෝධ තත්ත්වයයි මේ කියන්නෙ. ඒ නිරෝධ තත්ත්වයේ ලක්ෂණය කුමක්ද? 'යත්ථ' ආපො ච පඨවී තෙජෝ වායෝ න ගාධති. ඒ රහත් විඤ්ඤාණයෙහි, රහත් සිතෙහි, පඨවි, අපො, තෙජෝ, වායෝ කියන සතර මහා භූතයින් හොල්මන් කරන්නෙ නැහැ. ඒවා ප්‍රතිෂ්ඨාවක් ලබන්නෙ නැහැ. යම් අවස්ථාවක සතර මහා භූතයින් පිළිබඳ සම්පූර්ණ විරාගය ඇතිවුනා නම්, 'අතො' - අන්න එතැනින් අර දියවැල් ගලන්නෙ නැහැ. 'එත්ථ වට්ටං න වට්ටති' දියසුළිය කරකැවෙන්නෙ නැහැ. 'එත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣති' නාමයත් රූපයත් සම්පූර්ණයෙන්ම එතන නිරුද්ධ වෙනව. ඔන්න ඔය විදියට මෙතනිඳුන් තේරුම් ගන්න පුළුවනි. අර නාමරූප කියන එකේ 'රූප' ගැන කල්පනා කරල බලනකොට, මේ රූපධර්මයන් විග්‍රහ කරන අවස්ථාවෙදි 'චත්තාරිච මහාභූතානි චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපං' කියල දක්වුවෙ මක්නිසාද? මේ රූපයට යටින් තියන - මීට හේතුව වුනු අර සතර මහාභූතයින් පිළිබඳව සැළකිල්ල යොමු කිරීම තමයි බුද්ධ ධර්මයෙ තියෙන විශේෂත්වය. එහෙත් - බුදුපියාණන් වහන්සෙ පහළවෙන තෙක් - ලෝකයා හිතුව මේ රූපය ජය ගන්න නම් අපි අරූපය බදාගන්න ඕන කියල. නමුත් අරූපයෙ තිබෙනව රූපය ඉතාමත්ම සියුම් අන්දමින්. දැන් ඔන්න අපි හිතමු කෙනෙක් රෑයේ යම්කිසි දෙයක් දැකල 'යකෙක්' කියල බයවෙල දුවනව. ඒ පුද්ගලයා දුවන්නෙ යකාගෙන් බේරෙන්න. නමුත් යකත් අරගෙනයි දුවන්නෙ. හිතේ යකා ඉන්නව. අන්න ඒ වගේ, මේ ලෝකයා එහෙත්, බුදුපියාණන් වහන්සේ පහළවෙනතාක්, මේ රූප ධර්මයෙන් මිදීම සඳහා අරූපය අල්ල ගත්ත. ඒක නිසා අර අරූප ලෝකයේ කෙළවරට ගියත් සංස්කාර බැම්මෙන් බැඳිලයි යන්නෙ. ඒ සංස්කාර බලය සංසිඳුනු හැටියෙ ආයිත් රූපයටම කරකැවිල එනව. ඔන්න ඔය 'ද්වයනිශ්‍රිතතාව' එතනත් තියෙනව. මේ ද්වයනිශ්‍රිතතාව, ද්වයතාව, ඉදප්පච්චයතාව ආදි වචන කෙරෙහි සැළකිල්ලක් මේ දේශනයෙන් යම් පමණකට හෝ යොමුවුනා නම් අදට මේ දේශනය ප්‍රමාණවත් කියල හිතනව. අදට මෙතනින් නතර කරනව.

අධෝ ලිපි

1. රට්ඨපාල සූ.ම.නි. II බු.ජ. 11 - 428 පිට
2. අච්ඡරා සූ. දෙවතා සං, සං.නි. I 58 බු.ජ. 13
3. බු.ජ. I බු.ජ. 24 - 390 පිට
4. රතන සූ., සු.නි. බු.ජ. 25 - 68 පිට
5. දීඝනඛ සූ - ම.නි. II බු.ජ. 11 - 286 පිට
6. බ්‍රාහ්මණවග්ග, ධ.ප.ඛු.නි. I බු.ජ. 24 - 118 පිටුව
7. සං.,නි. I බු.ජ. 13 - 102 පිට
8. 11 පිටුව බලන්න.
9. කප්පමාණව පුච්ඡා, සු.නි. බු.ජ. 25 - 336 පිටුව
10. ම.නි. I බු.ජ. 10 - 396 පිටුව
11. ම.නි. III බු.ජ. 12 - 194 පිට
12. ඛු.නි. I බු.ජ. 24 - 130, 132, 134 පිටු
13. සං,නි. II බු.ජ. 14 - 140 පිට
14. දී.නි. II බු.ජ. 8 - 94 පිට
15. සු.නි.බු.ජ. 25 - 228ල 232 පිටු
16. ප.සෝ. සේ.මු. 7 - 409 පිට
17. දී.නි.බු.ජ. 9 - 46 පිට
19. ඛු.නි. I බු.ජ. 24 - 38 පිටුව
20. ඛු.නි. I බු.ජ. 24 - 192 පිටුව
21. භද්‍රාවුධ මාණව පුච්ඡා, පාරායණ වග්ග සු.නි.බු.ජ. 25-340
22. සත්තට්ඨාන සූ.ඛන්ධ සං.සං.නි. III බු.ජ. 15-110 පිටුව
23. ඛු.නි. I බු.ජ. 24-278 පිටුව
24. සං.නි. I බු.ජ. 13-30 පිටුව

# 3 වන දේශනය

# 3 වන දේශනය

"නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"

'එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං''

"'මෙය ශාන්තය මෙය ප්‍රණීතය එනම් සියලු සංස්කාරයන්ගේ සංසිඳීම, සියලු උපධීන් අත්හැරදැමීම, තණ්හාව ක්ෂය කිරීම, නොඇල්ම නම් වූ විරාගය, නැවැත්ම නම් වූ නිරෝධය, නිවීම නම් වූ නිබ්බානය''

අතිපූජනීය මහෝපාධ්‍යාය මාහිමිපාණන් වහන්සේ ප්‍රමුඛ ගරුතර යෝගාවචර මහාසංඝරත්නයෙන් අවසරයි. 'නිබ්බාන' යන මාතෘකාව යටතේ පැවැත්වෙන දේශනා මාලාවේ තුන්වන දේශනයයි අදට යෙදිල තියෙන්නෙ. කලින් දවසෙ දේශනයෙදි අපි දියසුළි උපමාවකින් සංසාරයත්, නිබ්බානයත් - සංසරණයත් නිස්සරණයත් - පිළිබඳ අදහස මතුවෙන ආකාරයකට එක්තරා විස්තරයක් කළා. ඒ වගේම, පටිච්ච සමුප්පාදයේ 'සමුදය - නිරොධ' කියන ඒ දෙපැත්තම තේරුම් ගැනීමට අදාළ වන සාධක සූත්‍ර එහෙමත් අපි ඉදිරිපත් කළා. මේ දියසුළිය ගැන කල්පනා කරල බලනව නම් - තව සමාන්තර ගැලපීමක් වශයෙන් මේ පටිච්ච සමුප්පාදයෙ අංගත් සමග - මේ දියසුළියේ අර අනිත්‍ය දුඃඛ අනාත්ම කියන ත්‍රිලක්ෂණයට අනුව ගලා බහින මහා ජලකඳට එරෙහිව යාහැකිය කියා හිතන ඒ අවිද්‍යාව තමයි දියසුළියෙ ආරම්භය. මේ අවිද්‍යාව නිසා උසිගැන්වෙන, අවිද්‍යාව මගින් උසිගැන්වෙන, යම්කිසි අරඇදීම් රාශියක් තියෙනව නම් අර දියවැල ඉදිරියට ගෙනයන, ඒව අපිට හිතාගන්න පුළුවන් 'සංස්කාර' හැටියට. ඊළඟට ඒ විදියට දියවැල ඉදිරියට ගිහිල්ල, අර මහ ජල කඳෙහි හැපිල එය දියසුළියක් බවට පත්වෙන අවස්ථාවේදි අපට හිතාගන්න පුළුවනි, දියවැල පීරාගෙන ඉදිරියට ඇදීම තමයි 'විඤ්ඤාණය' ඒක අර මහාජලකඳත් එක්ක හැපිල ඊළඟට නාමරූප හැටියට එක්තරා ස්වභාවයක් පෙන්නුම් කරනව. ඊළඟට ඒ නාමරූපයෙහිම වැඩුණු අවස්ථාව හැටියට සලකන්න පුළුවනි 'සළායතන' කියල පටිච්ච සමුප්පාදයෙ දක්වන අංගය. අපට ඒක මේ දියසුළිය ආශ්‍රයෙන් හිතාගන්න පුළුවනි. අර දියසුළිය කාලයක් තිබීමෙන්, පාතාලයක් හැරීමෙන් ඒ පාතාලයේ තිබෙන ක්‍රියාකාරීත්වය සළායතනය හැටියට ගන්න පුළුවනි. ඇත්ත වශයෙන්ම පාතාලය හැටියට සලකන්න පුළුවනි ශාරීරික වේදනා. බුදුපියාණන් වහන්සේගේ එක්තරා දේශනාවක් තියෙනව, සංයුත් සඟියෙ වේදනා සංයුත්තයෙ, 'සාරීරිකානං ඛො එතං භික්ඛවෙ දුක්ඛානං වේදනානං අධිවචනං යදිදං පාතාලොති'[1] කියල. 'මහණෙනි, පාතාලය කියල කියන්නෙ

ශාරීරික දුඃඛ වේදනාවලටම කියන වෙන නමක්ය' කියල. ඉතින් එහෙම බැලුවහම, මේ භවයෙ සත්ත්වයාට තෘෂ්ණා පිපාසයක් ඇති වෙන්නෙ අර වේදනාව නිසයි. ඒ සූත්‍රයෙම සඳහන් වෙනව, 'අශ්‍රැතවත් පෘථග්ජනයා දුක් වේදනා වලින් පීඩිත වූ අවස්ථාවෙහි සැප වේදනා සොයනවය මක්නිසාද සැප වේදනා හැර දුක්වේදනාවලින් මිදීමක් අශ්‍රැතවත් පෘථග්ජනයාට පේන්නෙ නැත කියල. එහෙම ගත්තොත්, අර පාතාලය තිමක් නැති වේදනා රාශියයි. ඒවා නිවා ගැනීමට තිබෙන පිපාසය වගෙයි පාතාලයෙන් නැගෙන ආකර්ෂණ වේගය. ඒ ආකර්ෂණ බලයම තමයි ඊළඟට එන උපාදානය. තෘෂ්ණාවෙම තිබෙන ඇදගන්නා ස්වභාවය, උපාදානයයි. ඊළඟට උපාදිනන වශයෙන් අවට ඇති කොළ අතු රොඩු ආදී හැම දෙයක්ම ඒකට ඇදගෙන භවයක් පෙන්නුම් කරනව. ඒ කියන්නෙ, අත දික්කරල පෙන්නන්න පුළුවන් විදියෙ නැතත්. උපාදින්න වශයෙන් ඒ දියසුළියෙ තිබෙන දේවල් ආශ්‍රයෙන් පෙන්නුම් කරන්න පුළුවනි. ඔන්න ඔය විදියට අපට හිතාගන්න පුළුවන් බොහෝදුරට. මේ දියසුළියෙ උපමාව ආශ්‍රයෙනුත්, පටිච්ච සමුප්පාද ධර්මය ගැන යම්කිසි අවබෝධයක් ලබාගන්න පුළුවනි.

මේ පටිච්ච සමුප්පාද ධර්මතාව දැකීම ඇත්ත වශයෙන්ම ධර්ම චක්ෂුෂයක් හැටියට දක්වනව - ධර්ම චක්ෂුෂයක් පහළවීම හැටියට. ඒ කියන්නෙ සෝවාන් පුද්ගලයා පිළිබඳව සඳහන් වෙනව: 'විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි'[2] නික්ලේශිවූ, පිරිසිදු වූ නිර්මල වූ ධර්ම චක්ෂුෂය පහළ උනා කියල. ඒ ධර්ම චක්ෂුෂය හඳුන්වන පාඨයක් නිතරම වගේ සූත්‍රවල සඳහන් වෙනව. 'යං කිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරොධ ධම්මං'[3] කියල. එහි තේරුම, හටගන්නා ස්වභාවය ඇති යම්කිසිවක්වේද, ඒ සියල්ලම නිරුද්ධවන ස්වභාවයද ඇත්තේය, ඒක සමහර අවස්ථාවල කෙටියෙනුත් සඳහන් වෙනව: 'සමුදයො සමුදයො - නිරොධො නිරොධා' කියන පද යුගලයෙන් ඒ දකින ආකාරය හරියටම කිව්ව වගේමයි කියැවෙන්නෙ. 'හටගැනීමක්, හටගැනීමක් තියෙනව. නිරුද්ධවීමක්, නිරුද්ධවීමක් තියෙනව.' මේ දෙක අතර සම්බන්ධයයි, 'යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධ ධම්මං' හටගන්නා ස්වභාවය ඇති යම්කිසිවක් වේද ඒ හැම දෙයකම නිරුද්ධවන ස්වභාවයද ඇත්තේය. මේ කියමනෙන් අපට පෙනෙනව සංසාර ගැටලුව තුළම නිබ්බානය දකීමේ ශක්තිය තමයි මේ ධර්මචක්ෂුෂය කියල කියන්නෙ. සංසාරයත් නිර්වාණයත් කියන දෙක බොහොම ඈතට දමාගෙන දෙපිලක් කරගෙන හිතන ආකාරයට අනුව බලනකොට නොයෙකුත් ගැටලු මතුවෙනව. නමුත් මෙතන අපට පේනව දුක්ඛයට සමුදය සොයාගෙන නිරෝධයට මාර්ගය පාදාගත්තාම චතුරාර්ය සත්‍යයම අවබෝධයෙන් නිවන් ප්‍රත්‍යක්ෂ කරගන්න පුළුවන් වගේ, මේ සංසාර දියසුළිය කරකැවෙන ආකාරය වටහාගෙන එය නැවැත්වීමට ක්‍රමයක් තියෙනව නම් ඒක අනුගමනය කිරීමෙන් මේ දියසුළිය නතරකරන්න පුළුවනි කියන එක.

කලින් අපි සඳහන් කළ ගාථාධර්මවල ආකාරයට රහතන් වහන්සේ පිළිබඳව දියසුළියක් නැත කියල ප්‍රකාශ උනා කලින් දේශනයේ. දියසුළිය සන්සිඳුනට පස්සෙ තත්ත්වය කල්පනා කරල බලනකොට, කෙනෙක් ඇහුවොත්

අර දිය සුළිය කොහේද ගියේ කියල, අපට මොකක්ද දෙන්න වෙන පිළිතුර? හරියට අර ගින්න කොහේටද ගියේ කියල අහපු ප්‍රශ්නෙට පිළිතුරු දෙන්න අමාරු වගේ තත්ත්වයක් එතන තියෙන්නෙ. මක් නිසාද? අපි දියසුළිය කියල කිව්වෙ අර දියවැලට. මහ ජලකඳ පීරාගෙන ඉදිරියට ඇදිල ගිය දියවැලේ තිබෙන්නෙත් අවට තිබෙනව වගේ ජලයමයි. එතකොට මේ දෙක එකතුවෙනව කියල කියන්නත් බැහැ. මේක වෙන කොහේවත් හැංගුනාය කියල කියන්නත් බැහැ. අමුතු විදියෙ තත්ත්වයක් මෙතන තියෙන්නෙ. ඇත්ත වශයෙන් කියන්න වෙන්නෙ කුමක්ද? යම් යම් හේතුප්‍රත්‍යය නිසා යම්කිසි ක්‍රියාකාරීත්වයක් තිබුනා. ලෝක ව්‍යවහාරයට හගල 'අහවල් තැන' කියල, 'අතන' හරි 'මෙතන' හරි කියල කියන්න පුළුවන් ක්‍රමයක් තිබුනා. ඒ ව්‍යවහාර මාත්‍රය නැතිඋනා. අර ගින්න පිළිබඳ තත්ත්වයමයි මෙතන තියෙන්නෙ. 'ගින්න' කියල වචනයක් දා ගත්තෙ, සංකල්පයක් හදා ගත්තෙ, හේතුප්‍රත්‍යයන් නිසා, උපාදානයන් නිසා, ඇතිවුන එක්තරා තත්ත්වයක් දක්වීමට. ඔන්න ඔය විදියට ඔයිනුත් අපට පෙනෙනව, සංකල්ප තුළයි මේ අවිද්‍යාව සැහවිල තියෙන්නෙ. ලෝකයා ඒක නොදනයි සමහර විට සංකල්ප ගොඩගහගෙන ඒවා නිවනේදි දකීමට බලාපොරොත්තු වෙන්නෙ. සංකල්ප ලැයිස්තු නිවනෙදි පේනව කියල සමහර විට කෙනෙක් හිතනව. එහෙම එකක් නොවෙයි මෙතන තත්ත්වය. මේ සංකල්පවලම තිබෙනව අවිද්‍යාව ගැබ්වෙල. ඒවා බිඳීමේ ශක්තියයි, ඒවා විනිවිද දකීමේ ශක්තියයි පළමුවෙන්ම පහළවෙන්නෙ සෝවාන් මාර්ගඥානයෙදි. ඒක තමයි 'උදයත්ථගාමිනී පඤ්ඤා අරියා නිබ්බේධිකා'[4] කියල සඳහන් වෙන්නෙ. 'උදයත්ථගාමිනී' කියන්නෙ උදයව්‍යය දකීමේ ශක්තිය. සමුදය නිරොධ කියන එකමයි. හටගැනීම් නැතිවීම් දකින ශක්තිය. ඒක දක්වල තියෙන්නෙ එක්තරා විධියක විනිවිද දකීමේ ක්‍රමයක් හැටියටයි. 'යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මං' කියල කියන කොට හටගන්නා ස්වභාවය නිසාම එහි නිරෝධයක් තිබෙන බව දන්නව. ඒක නිසා තමයි අර සැරියුත් ස්වාමීන්වහන්සෙ, අස්සජි ස්වාමීන් වහන්සෙ 'යෙ ධම්මා හෙතුප්පභවා තෙසං හෙතුං තථාගතො ආහ'[5] කියල කියන කොටම සෝවාන් වෙල ඉවරයි. ඒ කියන්නෙ, යමක් හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගන්නව නම්, ඒක හේතුප්‍රත්‍යය ඉවත් කළහම නිරුද්ධ වෙන්න පුළුවන් කියන එක ප්‍රඥාවන්ත කෙනෙකුට එක පාරටම වටහ ගන්න පුළුවන් අමුතුවෙන් නොකීවත්. ඔය විදියෙ තත්ත්වයක් අපට පේනව. සංසාර ගැටළුව තුළින්ම නිර්වාණය මතුකර ගැනීමේ ශක්තිය තමයි අර ධම්මචක්ඛුය.

ඊළඟට ඒ වගේම අපට පැහැදිලි වෙනව, අපි අර කලින් මහා නිදාන සූත්‍රයෙන් උපුටා දක්වූ පාඨයෙ කියැවුනා, අධිවචන මාර්ග නිරුක්ති මාර්ග ආදී භාෂා ව්‍යවහාරයෙ සියලු අංගෝපාංග තිබෙන්නෙ නාම රූපයක් විඤ්ඤාණයක් කියන මේ සංසාර වට්ටය ඇති තාක් පමණි, ඊට එහා නොවෙයි කියන එක. 'එත්තාවතා' කියල වචනයක් එහෙම කිව්වෙ, 'මෙතෙකින්ම මේ සංසාර වට්ටය කරකැවෙනවය, 'එත්තාවතා ජායෙථ වා ජීයෙථවා මීයෙථ වා චවෙථ වා උපපජ්ජෙථවා' ආදී වශයෙන්', ජාති ජරාමරණ චුති උපපත්ති ආදී සියලුම

සංකල්පයක් අර්ථවත්ව යොදන්න පුළුවන් වන්නෙ අර දියසුළි තත්ත්වය තිබෙනකොට. ඒ කියන්නෙ විඤ්ඤාණ නාමරූප දෙක, එකට යනකොට පමණයි කියන එකයි. යම්කිසි ක්‍රමයකින් ඒ කියන සම්බන්ධය බින්දොත්, අර සංසාර වට්ටය - අර දියසුළිය - නතර කළොත්, ඊට එහාට කියන්න දෙයක් නැහැ. 'යෙන නං වජ්ජු තං නත්‍ථි නසතී'[6] මය විදියට රහතන් වහන්සේල පිළිබඳව සඳහන් වෙනව. යම් ආකාරයකින් කියනව නම්, එහෙම කියන්න හැකි තත්ත්වයක් ඉක්මුව නැත කියල.

එතකොට මෙන්න මේ විදියට අපට හිතාගන්න පුළුවන් මේ කාරණයටම - මේ දියසුළි උපමාවටම - බොහෝ දුරට කිට්ටු කරන්න පුළුවන් සූත්‍ර කොටස් අපට තවත් තැන් වලින් හමුවෙනව. දීඝ නිකායෙ මහාපදාන සූත්‍රයෙ සඳහන් වෙනව, විපස්සී බෝසතාණන් වහන්සෙ මේ දියසුළිය හඳුනා ගත්තු හැටි. ඒක හරියට, අර ඇස් ඇති කෙනෙක් ගඟක් ළඟ ගහක් යට ඉඳගෙන ඉන්න කොට එතනට වැටෙන කොළයක් දියවැලකට අහුවෙලා ගහගෙන ගිහිල්ල දිය සුළියක් වටේ කරකැවිල නැතිවෙල යනව දැකල යම් කිසි නිගමනයක් ගන්න වගෙයි. අර පටිච්චසමුප්පාද ධර්මය පිළිබඳව යෝනිසෝමනසිකාරයෙන් වටහාගත්තු බවයි සඳහන් වෙන්න. සමහරෙක් හිතන්න පුළුවන් පුබ්බේනිවාසානුස්සතිය ඇතිකරගෙන අවබෝධ කරගන්න දෙයක් කියල. නමුත් මෙතන සඳහන් වෙනව විපස්සී බෝසතාණන් වහන්සෙ පිළිබඳව, 'යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො'[7] කියල. ඒ කියන්නෙ, යෝනිසෝමනසිකාරයෙන්, ප්‍රඥාවෙන් අවබෝධ කරගත්ත කියල. 'යොනි' කියන්නෙ ප්‍රභවස්ථානය, ඇතිවෙන ස්ථානය, හට ගන්න ස්ථානය. ඒ පැත්තට යොමු වෙමින් මෙනෙහි කිරීමයි 'යොනිසොමනසිකාර' කියල කියන්නෙ. එතකොට මෙතන සඳහන් වෙන හැටියට, විපස්සී බෝසතාණන් වහන්සෙ පටිච්ච සමුප්පාදය හෙළි කරගන්න පටන්ගත්තෙ අග කොනේ ඉඳල:

'කිම්හි නුඛො සති ජරා මරණං හොති? කිම්පච්චයා ජරාමරණං?

'කුමක් ඇති කල්හි ජරාමරණය වේද? කුමක ප්‍රත්‍යයෙන්ද ජරාමරණය? කියල මය විදියට උන්වහන්සෙ තමන්ම ප්‍රශ්නයක් නැඟුව. ඊළඟට ඊට පිළිතුර ඒ එක්කම උන්වහන්සෙට පහළ උනා.

'ජාතියා ඛො සති ජරාමරණං හොති ජාති පච්චයා ජරාමරණං'

'ජාතිය - උපත - ඇතිකල්හි ජරාමරණය වෙයි, ජාතිප්‍රත්‍යයෙනි ජරාමරණය' කියල මේ විදියට දිගටම කලින්නුත් අපි සඳහන් කළ ආකාරයට යුගල යුගල වශයෙන්, ජෝඩු ජෝඩු වශයෙන්, ඇඳුතු වශයෙන්, පටිච්ච සමුප්පාදය දෙක දෙක ඉදිරියට ගෙන ගියා. ඒ කියන්නෙ, ඊළඟට මන්න කියැවෙනව: කිම්හි නුඛො සති ජාති හොති කිම්පච්චයා ජාති? භවෙ ඛො සති ජාති හොති භව පච්චයා ජාති' - 'කුමක් ඇති කල්හිද ජාතිය ඇති වන්නෙ, කුමක ප්‍රත්‍යයෙන්ද ජාතිය? 'භවය ඇතිකල්හිය ජාතිය (උපත) ඇතිවන්නෙ, භවය ප්‍රත්‍යය කොටගෙනය ජාතිය' කියල මය විදියට විමසමින් ගිහිල්ල. නාම රූපයක් පසුකරගෙන ගිහිල්ල විඤ්ඤාණයට හේතුව සොයන

කොට ආපසු හැරෙන්න සිද්ධ උනා. විඤ්ඤාණයට හේතුව සෙව්ව හැටියේ පෙනුන නාමරූපයමයි විඤ්ඤාණයට හේතුව. එතෙන්දි පෙනුන මේ දෙකේ අන්‍යොන්‍ය ප්‍රත්‍යය සම්බන්ධතාව. ඊළඟට විපස්සී බෝසතාණන් වහන්සෙ තමන්ටම කියාගන්න: 'පච්චුදාවත්තති ඛො ඉදං විඤ්ඤාණං නාමරූපම්හා නාපරං ගච්ඡති. එත්තාවතා ජායෙථ වා ජීයෙථ වා චවෙථ වා උපපජ්ජෙථ වා යදිදං නාමරූප පච්චයා විඤ්ඤාණං විඤ්ඤාණ පච්චයා නාමරූපං නාමරූප පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සො, ඵස්ස පච්චයා වෙදනා, වෙදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භවො, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරා මරණං, සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා සම්භවන්ති එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොතීති සමුදයො සමුදයොති ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි' - කියල මේ විදියට එතන දක්වනව. ඒ ධර්ම චක්ෂුෂය පිළිබඳ මුල් අවස්ථාව. එතන කෙළින්ම සඳහන් වෙනව, ඒ යෝනිසෝමනසිකාරයෙන්ම විපස්සී බෝසතාණන් වහන්සෙ මතුකරගත්ත මේ ජාතිජරාමරණ ආදී සියලුම ප්‍රඥප්ති තියෙන්නෙ විඤ්ඤාණ - නාමරූප දෙක අතරෙයි කියල. මෙතන විශේෂ වචනයක් සඳහන් වෙනව: 'පච්චුදාවත්තති' පච්චුදාවත්තති ඛො ඉදං විඤ්ඤාණං නාමරූපම්හා නාපරං ගච්ඡති - මේ විඤ්ඤාණය නාමරූපය කෙරෙන් ආපසු හැරිලා එනව 'පච්චුදාවත්තති' - සාමාන්‍ය ව්‍යවහාරයෙ එන වචනයක් තියෙනව 'පොලා පැනල එනව' කියල. ඒකෙ හැපිල එනව කියන තේරුමයි. 'නාපරං ගච්ඡති' ඉන් ඔබ්බට යන්නෙ නැහැ. වෙනින් එකකට යන්නෙ නැහැ කියල මෙන්න මේ විදියට, එත්තාවතා' - මෙතෙකින්ම කෙනෙක් උපදිනව, දිරනව, මැරෙනව, නැවත උපදිනව ආදී වශයෙන් පෙන්නුම් කරල, ඊළඟට කියනව: විඤ්ඤාණපච්චයා නාම රූපං, නාමරූප පච්චයා විඤ්ඤාණං - විඤ්ඤාණය ප්‍රත්‍යය කරගෙන නාමරූපය පවතිනව, නාමරූපය ප්‍රත්‍යය කරගෙන විඤ්ඤාණය පවතිනව. නමුත් ඊළඟට විශේෂ දෙයක් මෙතැන කියැවෙනව. 'නාමරූප පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සො, ඵස්ස පච්චයා වෙදනා ....... දැන් අර සොයාගෙන ආපු මාර්ගය නැවතත් ආපසු ආවර්ජනා කරනව. අර දෙක අතරෙ අර විධියට අන්‍යොන්‍ය සම්බන්ධතාව තිබුණේ වී නමුත්, ඒ නාමරූපයටම හේත්තු වෙච්ච තව ගොඩක් තියෙනව. නාමරූප ළඟට සළායතන ඵස්ස වේදනා තණ්හා ආදිය. ඒව අර නාමරූපය පැත්තෙයි තියෙන්නෙ. විඤ්ඤාණය තනිවම එහා පැත්තෙ. මේ විදියටයි අපට හිතාගන්න තියෙන්නෙ. මේ, සමුදය පැත්ත හෙළි කරගත්තු ආකාරයයි.

ඒ වගේම විපස්සී බෝසතාණන් වහන්සෙ නිරෝධ පැත්තත් අර විධියටම යෝනිසෝ මනසිකාරයෙන් හෙළි කරගන්න. 'කිම්හි නු ඛො අසති, ජරාමරණං න හොති, කිස්ස නිරොධා ජරාමරණනිරොධො,' - 'කුමක් නැති කල්හිද ජරාමරණය නැති වන්නෙ, කුමක නිරෝධවීමෙන්ද ජරාමරණ නිරෝධය වන්නෙ? ඊළඟට ඒකට පිළිතුරු වශයෙන් වැටහුණේ, ජාතියා ඛො අසති ජරාමරණං න හොති, ජාති නිරොධා ජරාමරණනිරොධො' - ජාතිය නැතිකල්හිය ජරා මරණය නැතිවෙන්නෙ, ජාතියෙහි නිරෝධයෙන්ය ජරාමරණය නිරුද්ධ වෙන්නෙ. ඔය විදියට කලින් කළා වගේම ඉදිරියට සොයාගෙන

ගියා. එහෙම ගිහිල්ල නාමරූප විඤ්ඤාණ දෙකේදි හේරුම් ගත්ත: 'නාමරූප නිරෝධො විඤ්ඤාණ නිරෝධා, විඤ්ඤාණ නිරෝධා නාමරූප නිරෝධො, අතන අර සන්ධිස්ථානය බින්ද හැටියෙ මොකද වෙන්නෙ, විඤ්ඤාණ නිරොධයෙන් නාමරූප නිරෝධය කරල එහෙම නැත්නම්, නාමරූප නිරෝධයෙන් විඤ්ඤාණ නිරෝධය කළාම, ඊළඟට නාමරූපය ළඟ තියෙන අනිකුත් අංග සියල්ලම - සළායතනය, ඵස්ස, වේදනා ආදී ජාති ජරා මරණ දුක්වා නිරුද්ධ වෙනවයි කියන එකයි එතැනින් හේරෙන්නෙ. ඒ හෙළිකරගත්තු ධර්ම චක්ෂුෂය මුල් කරගෙන විපස්සි බෝසතාණන් වහන්සේ ඊළඟට - ඒ සූත්‍රයේ සඳහන් වෙනව - 'පඤ්චසුපාදානක්ඛන්ධෙසු උදයබ්බයානුපස්සී විහාසි' ඒ කියන්නෙ පඤ්ච උපාදානස්කන්ධය පිළිබඳව හටගැනීම් නැතිවීම් දකිමින් වාසය කළාය. වැඩිකලක් යන්නට කලින්ම, හෙළිකරගත්ත විපස්සනා මාර්ගය අනුව පුහුණුවීමේදීම විපස්සී බෝසතාණන් වහන්සේගේ සිත සම්පූර්ණයෙන්ම ආශ්‍රවයන්ගෙන් මිදුනාය. සම්බෝධිය ලබා ගත්තයි කියන එකයි.

එතකොට මෙතන කියැවෙනවා: "අධිගතො ඛො මායං විපස්සනා මග්ගො බොධාය." මෙතන තියෙන්නෙ ඉතාමත්ම වටිනා ධර්මයක්, බෝධිය සඳහා විපස්සනා මාර්ගයක්. විදර්ශනා මාර්ගයක්. ඒ විදර්ශනා මාර්ගයෙ ප්‍රධානම කාරණය තමයි, මේ කියාපු නාමරූප - විඤ්ඤාණ දෙක අතර සම්බන්ධතාව. අටුවාවෙ එහෙම පෙන්නුම් කරනව, විපස්සි බෝසතාණන් වහන්සේ මේ 'අවිජ්ජා' 'සංඛාර' ගැන සඳහන් කරන්නෙ නැත්තෙ මොකද කියන ප්‍රශ්නය නගල, ඒව අතීතෙ තියන නිසාය ඒව පෙනුනෙ නැත්තෙ කියල. නමුත් ඒක නොවෙයි කාරණය. මේ නාමරූප - විඤ්ඤාණ යන දෙක අතර සම්බන්ධතාව නොදැනීමමයි අවිද්‍යාව. ඊළඟට මේ දෙක දිගට පැවතී යාමට උපකාර වන්නෙ සංස්කාර. මේ විඤ්ඤාණ - නාමරූප දෙකේ අන්‍යෝන්‍ය සම්බන්ධතාව නිරන්තරව පවතින්නෙ සංස්කාර නිසයි. ඒකත ඒ සූත්‍රයෙ සඳහන් නොවුන නිසා, අටුවාචාරීන් වහන්සේලා ඒක තෝරන්නෙ අර දෙක අතීතයට දාල - එහෙම තේරුව නමුත් අපට පැහැදිලි වෙනව, විපස්සී බෝසතාණන් වහන්සෙගෙ ධර්ම චක්ෂුෂය ඇතිවෙන්න බැහැනේ ඒ මුල් අංග දෙක නැතිනම්. එතකොට ඒ අංග දෙක විශේෂයෙන් සඳහන් නොකළෙ ඒව පසුබිමෙ තියෙන නිසයි. එක්තරා විවරණ ක්‍රමයක් අනුව අවිද්‍යාවෙන් පටන්ගෙන විවරණය කරන්න පුළුවන්. නමුත් මෙතනට ඇවිල්ල මේක නැවතුනෙ මොකද, මේ දෙකේ සම්බන්ධතාවට හේතුව වෙන්නෙ අර දියවැල ගැන කිව්ව වගේ එකක්. දියසුළියට වඩා ඇසිනුයි අපට දකින්න ලැබෙන්නෙ දියවැල යන ආකාරය. දියවැල අර විදියට අනිත්‍ය දුඃඛ අනාත්ම තත්වය අමතක කරල, නිත්‍ය සුඛ ආත්ම ස්වභාවයක් සොයාගෙන ඉදිරියට යන එක අවිද්‍යාව. ඊළඟට දියකඳ පීරාගෙන යන ඒ පටු දියවැල් විඤ්ඤාණයම තමයි විඤ්ඤාණ කියල කියන්නෙ. ඒ විදියටම දැන් මෙතනත්, අර පුද්ගලයා පිළිබඳව සළකල බලනකොට, විඤ්ඤාණ - නාමරූප දෙකේ සම්බන්ධතාවට පසුබිමින් සිටින්නෙ, මේක කෙළවර වෙන්නෙ දුකෙනුයි කියන අවබෝධය නැති කම. එහෙම නැත්නම් වෙනත් විධියකින් කියනව නම්, අනිත්‍ය දුඃඛ අනාත්ම කියන ඒ ත්‍රිලක්ෂණය නොතකා නිත්‍ය සුඛ ආතම තත්වයක් සොයාගෙන ඉදිරියට යාමයි. ඒක නිසාම ඇතිවන අර

ඇදීම්, ප්‍රයත්න, රාශියමයි, අර සංස්කාර. සංස්කාර මතයි. ඒ විඤ්ඤාණය රඳා පවතින්නෙ. ඊළඟට ඒ විඤ්ඤාණයටම සම්බන්ධයි නාමරූපය. නාමරූපය පැත්තෙන් අර ඉතිරි අංග ටික තියෙනව. ඔය විදියට දැන් අපට මානසික වශයෙන් චිත්‍රරූපයක් - මේ පටිච්ච සමුප්පාදය පිළිබඳව එක්තරා විවරණයක් - හිතේ ඇති කරගන්න පුළුවනි.

දැන් එතකොට මේ සූත්‍රයෙනුත් අපට මහා නිදාන සූත්‍රයෙ කියාපු කරුණු සනාථ වෙනව. තවත් ඒ වගේම වටිනා සූත්‍රයක් තිබෙනව - සැරියුත් සවාමීන් වහන්සෙ දේශනා කරන සූත්‍රයක් - සංයුත් සඟියේ නිදාන සංයුත්තයෙ. එතන ඒ සැරියුත් සවාමීන්වහන්සෙ දිය පුළියටත් වඩා හිතාගන්න පුළුවන් පහසු උපමාවක් දක්වන්නෙ. බටකෝටු මිටි දෙකකට සමාන කරනව මේ විඤ්ඤාණයත් නාමරූපයත්. විඤ්ඤාණයත් නාමරූපයත් හරියට අර බට කෝටු මිටි දෙකක්, උඩින් එකකට එකක් හේත්තු වෙන ආකාරයට හිටවල, එයින් එකක් ඇද්දාම -

'එකං ආකඩ්ඪෙය්‍ය එකා පපතෙය්‍ය
අපරං චෙ ආකඩ්ඪෙය්‍ය අපරා පපතෙය්‍ය'[8]

ඒ කියන්නෙ, එකක් ඇද්දහම අනික වැටෙනව. එහා එක ඇද්දාම මෙහා එක වැටෙනව.

ඔය විදියට හිටවපු බටකෝටු මිටි දෙකක් හැටියට පෙන්නුම් කරනව මේ විඤ්ඤාණයත් නාමරූපයත් අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්ධතාව- අඤ්ඤමඤ්ඤ පච්චය සම්බන්ධතාව. එහෙම කියල ඉවර වෙලා, ඊළඟට කියාගෙන යනව, විපස්සී බෝසතාණන් වහන්සේගෙ අවබෝධය වගේම, 'නාමරූප පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සො, ඵස්ස පච්චයා වෙදනා ආදී වශයෙන් අනිකුත් අංග. ඊළඟට එහි නිරෝධය දක්වීමේදී පෙන්නුම් කරන්නෙ - අපි හිතමු, දැන් වම්පැත්තෙ තියෙනව කියල විඤ්ඤාණ බට කෝටු මිටිය. දකුණු පැත්තෙ නාමරූප බටකෝටු මිටිය හිටවල තියෙනව කියල. මේ නාමරූප බටකෝටු මිටියටම හේත්තු කරල තියෙනව තව අංග රාශියක්. එහෙම හිතින් මවා ගත්තාම තේරුම් ගන්න වඩාත් පහසුයි. සළායතන, ඵස්ස, වෙදනා - ඔය විදියට බටකෝටු මිටි රාශියක් තියෙනව. ඒ ඔක්කොම නාමරූප බටකෝටු මිටියට හේත්තු වෙලයි තියෙන්නෙ. දැන් විඤ්ඤාණ බටකෝටු මිටිය ඇද්ද හැටියෙ අර ඔක්කොම එක සැරේටම ඇදගෙන වැටෙනව. ආයිත් මේකෙ අතරක් නැහැ. සන්දිට්ඨික අකාලික වශයෙන් එහි පස්සික වශයෙන්, එහෙම පිටින්ම දුඃඛක්ෂය වෙනව, සංසාර දුක්ඛය සම්පූර්ණයෙන්ම එතැනම ඉවර වෙනව. එතකොට, මේ සූත්‍රය අනුවත් හිතාගන්න පුළුවනි, සාමාන්‍ය අවබෝධයට වඩා, සාමාන්‍යයෙන් කෙනෙකුගෙ විශ්වාසයට වඩා, විශේෂ තත්ත්වයක් මෙතන තියෙනව. මේක නිසා තමයි අපි කලින් කිව්වෙ, ජාති ජරා මරණ ආදී සංකල්පවල ගෙවියන සවභාවයක් තියෙනව කියල. මේ නිසා තමයි අර අනිච්චං සංඛතං පටිච්චසමුප්පන්නං ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධ ධම්මං කියල ජරාමරණය ගැන පවා කිව්වෙ. මේක ගැන කල්පනා කරල බලන කොට මොකද මේව

අනිත්‍යයයි කියන්නෙ, ක්ෂයවෙල යන්නෙ මොකද කියල හිතාගන්න ටිකක් අමාරු වෙන්න පුළුවනි. නමුත් මෙයින් පෙනෙන්නෙ මේ සියලුම සංකල්ප අර නාමරූපෙට හේතුවෙල තියෙන නිසා මේ දියසුළිය, මේ සංසාර වට්ටය - එහෙම නැත්නම් මේ බටකෝටු මිටි දෙකෙන් එකක් ඇද්ද හැටියෙ අනිත් එකට හේතු වෙල තියෙන මේ සියල්ලම, මේ දුක් ගොඩ - එහෙම පිටින්ම අකාලිකවම නැතිවෙල යනව.

එතකොට ඔය විදියටයි දන් අපි විවරණය කර ගෙන ආපු මාර්ගයෙන් පෙනෙන්නෙ. 'යො පටිච්චසමුප්පාදං පස්සති සො ධම්මං පස්සති, යො ධම්මං පස්සති සො පටිච්චසමුප්පාදං පස්සති.' මේක බුද්ධ වචනයක් හැටියට සැරියුත් ස්වාමීන්වහන්සේ ගෙනහැර දක්වන පාඨයක්, මජ්ඣිම නිකායෙ මහාහත්ථිපදොපම සූත්‍රයෙ.[9] ඒකේ තේරුම: 'යමෙක් පටිච්ච සමුප්පාදය දකී'ද හේ ධර්මය දකී, යමෙක් ධර්මය දකීද හේ පටිච්චසමුප්පාදය දකී.' මෙයින් අපට පෙනෙනව මේ පටිච්ච සමුප්පාද ධර්මයමයි ඇත්තවශයෙන්ම 'ධර්මය කියල කියන්නෙ. මේ ධර්මය ගැන හැම බෞද්ධයෙක්ම පිළිගන්න, කවුරුත් දන්න, ධර්මයෙ ගුණ කියැවෙන පාඨයක් තියෙනව. මේ ස්වාක්ඛාතවූ ධර්මය සන්දිට්ඨිකයි - අපේ ඇස්වලින් මෙලොවම දැකගන්න පුළුවන්, තමා විසින්ම දැක ගන්න පුළුවන් - 'සන්දිට්ඨික අකාලික' - අකාලිකයි. එහි පස්සිකයි ඇවිත් බලන්න කියල කියන්න පුළුවන්. ඔපනයික, පච්චත්තං වේදිතබ්බ විඤ්ඤූහි ආදී වශයෙන් තම තමන්ගේම සන්තානයෙ දැකිය හැකි විදියෙ ස්වභාවයක් මේ ධර්මයෙ තිබෙනව කියල අපි කවුරුත් පිළිගන්නව. නමුත් සම්මත පටිච්චසමුප්පාද විවරණ ක්‍රමයේ මේ කියාපු සන්දිට්ඨික අකාලික ලක්ෂණ තිබෙනවද කියල අපිට මධ්‍යස්ථව කල්පනා කරල බලන්න සිද්ධ වෙනව. මක්නිසාද, මේ අංග දොලහ දනට පිළිගන්න විවරණ මාර්ගය අනුව, විසුද්ධිමග්ග කර්තෘන් වහන්සෙ තෝරන්නෙ මෙහෙමයි. මේ අංග දොලහෙන් දෙකක් අතීතයට දානව. මුල් දෙක අල්ලල අතීතයට දානව. අග දෙක අනාගතයට දානව. මැද අට වර්තමානය හැටියට තේරුම් කරනව. එතකොට කාල තුනක් මෙතන තියෙනව. අකාලික නොවෙයි. ඒක නිසා තමයි අර විපස්සී බෝසතාණන් වහන්සේට අවිජ්ජා - සංඛාර දෙක පෙනුනෙ නැහැ කියල තේරුම් කළේ. ඒව අතීතයෙ නිසා ඒක සමහර විට පුබ්බෙ නිවාසානුස්සති ඥානයෙන් මතුකරගන්න එකක් හැටියටයි අවබෝධය තියෙන්නෙ. නමුත් පටිච්චසමුප්පාද ධර්මය පිළිබඳව සූත්‍රවල සඳහන් වෙන්නෙ, වෙන එකක් තබා සෝවාන් පුද්ගලයාට පවා පටිච්චසමුප්පාදය පැහැදිලියි කියන එකයි - 'අරියො චස්ස ඤායො පඤ්ඤාය සුදිට්ඨො හොති සුප්පටිවිද්ධො'[10] සෝවාන් පුද්ගලයා පිළිබඳව සඳහන් වෙන්නෙ - මේ 'අරියො ඤායො' කියන්නෙ ප්‍රතීත්‍ය සමුත්පාද ධර්ම න්‍යායයයි - මේ ආර්ය න්‍යායය, පටිච්ච සමුප්පාද ධර්මය, ඒ සෝවාන් පුද්ගලයා විසින් 'පඤ්ඤාය සුදිට්ඨො' ප්‍රඥාවෙන් හොඳින් දක්ක, 'සුප්පටිවිද්ධො' හොඳින් විනිවිද දක්ක. එතකොට 'සු' යන්නකුත් දාලා තියෙන්නෙ මේක නිකම්ම එකක් නොවෙයි. පුබ්බෙ නිවාසානුස්සති ඥානය නැති සෝවාන් පුද්ගලයා පවා මේ ඥානය ලබාගන්නෙ කොහොමද කියන එකයි කෙනෙකුට ප්‍රශ්නය වෙන්නෙ. කොයිහැටි හෝ වේවා, සම්මත විවරණ ක්‍රමයට අනුව අර විධියට මුල් දෙක අතීතයට

දමනවා. ඒ කියන්නෙ අවිජ්ජා - සංඛාර දෙක අතීතයට දානවා. 'ජාති - ජරාමරණ' දෙක අනාගතයට. ඒ අතර තිබෙන ඉතිරි අට වර්තමානයට. ඔය හැටියට කාලතුනකට බෙදනවා. එපමණක් නොවෙයි, මේව පුද්ගලයකුගෙ සංසාර ගමනෙ අවස්ථා තුනක් හැටියට විවරණය කරන්න යාමේදී තව අමුතුවෙනුත් කෑලි මේකට පුරුද්දන්න සිද්ධ වෙනවා. අන්න ඒක නිසා පසේ ගොඩවල් හතරකුත් දක්වනවා.[11] අවිජ්ජා, සංඛාර, තණ්හා, උපාදාන, හව අතීත හේතුය කියල. ඊළඟට ඒ අතීත හේතු නිසා විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස වේදනා කියන වර්තමාන ඵල ඇතිවෙනවය. නැවතත්, අවිජ්ජා, සංඛාර, තණ්හා, උපාදාන, හව කියන වර්තමාන හේතු පස නිසා විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා යන අනාගත ඵල පස ඇතිවෙනවය කියල ඔය විදියට විවරණය කරන ක්‍රමයක් තියෙනවා. මේ පසේ ගොඩවල් හදාගෙන විවරණය කිරීමෙන් අර අංග අතර තිබෙන ඉදප්පච්චයතා සම්බන්ධය පලුදුවෙනවා. අපි කලින් පෙන්නුම් කළා යුගල වශයෙන් මේ අංග දෙකක් අතර තියෙන ඉදප්පච්චයතාව. ඒකමයි පටිච්ච සමුප්පාද ධර්ම න්‍යාය හැටියට ගතයුත්තෙ. ඒකමයි මූලධර්මය. එකක් නිසා අනික ඇතිවෙනවා. එකක් නිරුද්ධ වීමෙන් අනික නිරුද්ධ වෙනවා. ඔය විධියට විග්‍රහ කරන ක්‍රමයක් තියෙනවා. අන්න ඒක පලුදු වෙනවා, අමුතුවෙන් කෑලි මේකට එකතු කරන්න යාමෙන්. එපමණක් නොවෙයි, මේ සම්මත විවරණ ක්‍රමයේ හව කියන වචනය පවා තෝරනව 'උපපත්ති හව' 'කම්මහව' කියල. 'උපාදාන පච්චයා හවො' කියන තැන උපපත්ති හව' හැටියට විග්‍රහ කරනවා. ඊළඟට, හව පච්චයා ජාති කියන එක තෝරන්න ගියාම එතැන තෝරන්නෙ කම්මහව හැටියට. මේ එකම පදය දෙයාකාරයකින් තෝරනවා. ඒ වගේම, 'ජාති' කියන පදය - සාමාන්‍යයෙන් 'ජාති' කියන වචනයෙ තේරුම 'උපත' කියන එකයි. නමුත් ඒකට 'මතු උපත' 'නැවත උපත' කියන අර්ථයයි, පටිච්ච සමුප්පාද ධර්මය තේරීමේදී දීල තියෙන්නෙ.

ඔය විධියෙ දුර්වලතා රාශියක්. ඒක බොහෝවිට උගතුන් මේ කාලෙ පෙන්වා දෙනව, සාමාන්‍යයෙන් මේව ගැන කියන්න පුළුවන් අය. එතකොට, මෙන්න මේ අඩුපාඩු තිබිචක් නැතැ අපි අර කලින් විස්තර කළ ආකාරයට මේ මුළුමහත් සංසාර වට්ටයෙ රහස විඤ්ඤාණ - නාමරූප දෙක අතර තියෙනව කියල ගත්තහම. පටිච්ච සමුප්පාද ධර්මය, ඇත්ත වශයෙන්ම, සතිකර දුක් ගොඩක - කේවල දුඃඛ ස්කන්ධයක - සමුදය හා නිරෝධය පෙන්නුම් කරනව මිසක්, සංසාරගත පුද්ගලයාගෙ සංසාර ගමනෙ අවස්ථා තුනක් පෙන්වන එකක් නොවෙයි. මේ පටිච්ච සමුප්පාද ධර්මයේ විශේෂත්වය තමයි, සන්දිට්ඨික අකාලික වශයෙන් - අර යෝනිසෝමනසිකාරයෙන්ම විපස්සි බෝසතාණන් වහන්සෙ මතු කරගත්ත වගේ - මේ ධර්මතාව වර්තමානයෙහි දැකිය හැකි ස්වභාවය. බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මයෙ තිබෙන විශිෂ්ටම ලක්ෂණය තමයි, මේ සන්දිට්ඨික අකාලික බව. ඒ බව හෙළිවෙනව සුත්ත නිපාතයේ පාරායණ වග්ගයේ හේමක මාණව පුච්ඡාවෙන්. ඒ හේමක නමැති බ්‍රාහ්මණ මාණවකය බුදුරජාණන් වහන්සේට ප්‍රශංසා මුඛයෙන් ප්‍රකාශ කරනව මෙන්න මෙහෙම:

"යෙ මෙ පුබ්බෙ වියාකංසු - හුරං ගොතම සාසනා
ඉච්චාසි ඉති භවිස්සති - සබ්බං තං ඉතිහීතිහං
සබ්බං තං තක්කවඩ්ඪනං - නාහං තත්ථ අභිරමිං
ත්වඤ්ච මෙ ධම්මං අක්ඛාහි - තණ්හානිඝාතනං මුනි
යං විදිත්වා සතො චරං - තරෙ ලොකෙ විසත්තිකං"[12]

ඒ කියන්නෙ, 'යෙ මෙ පුබ්බෙ වියාකංසු - හුරං ගොතම සාසනා' - ගෞතම ශාසනයෙන් පිටත යම් ශාස්තෘවරු මට ධර්ම කියල දුන්න නම්, ඒ හැම දෙනෙක්ම මෙන්න මේ විදියටයි විග්‍රහ කළේ. 'ඉච්චාසි ඉති භවිස්සති' - 'මෙසේ විය මෙසේ වන්නේය.' ඒ කියන්නෙ, අතීතයත් අනාගතයත් අල්ලලයි තේරුම් කරන්නෙ. 'සබ්බ තං ඉතිහීතිහං' - 'ඉතිහීතිහ' කියන පාරිභාෂික වචනයකුත් ඒක නිසාම හැදිල තිබුන. 'ඉතිහ-ඉතිහ.' ඒ කියන්නෙ, 'එසේ මෙසේ'. එසේ මෙසේ ධර්ම ඒව ඔක්කොම. 'සබ්බ තං ඉතිහීතිහං' 'සබ්බං තං තක්කවඩ්ඪනං' - ඒ ධර්මවල ස්වභාවය, තර්ක වඩනව, තර්ක උපදවනව. මේක කොහොමද? - අර සබ්බාසව සූත්‍රයෙ[13] එහෙම තියෙන ආකාරයට පූර්වාන්ත අපරාන්තවලට දුවමින් - 'අපි එහෙම හිටියද නැද්ද' කියල, ඔය වගේ තර්ක ඇතිවෙන විදියෙ ධර්ම අනිත් ශාස්තෘවරු දේශනා කළේ. 'නාහං තත්ථ අභිරමිං' - ඒ ධර්මයන් පිළිබඳව මම සතුටට පත්වුනෙ නැත.' නමුත් 'ත්වඤ්ච මෙ ධම්මං අක්ඛාහි තණ්හානිඝාතනං මුනි' - නමුත්, මුනිවරයාණෙනි, ඔබවහන්සේ තණ්හාව විනාශ කරන්නාවූ මේ ධර්මය මට දේශනා කළා. 'යං විදිත්වා සතො චරං' - යම් ඒ ධර්මය තේරුම් අරගෙන සතිමත්ව හැසිරෙන්නේ, 'තරෙ ලොකෙ විසත්තිකං' - 'මේ ලෝකයෙ ඇලෙන සුළු, අලවන සුළු, තණ්හාවෙන් එතර වන්නේය', කියල මේ විදියට ප්‍රශංසා මුඛයෙන් ඒ හේමක මාණවකය ප්‍රකාශ කළේ මේ ධර්මයේ තියෙන මේ විශිෂ්ට ලක්ෂණය නිසයි. ධර්මය කියන්නෙ පටිච්ච සමුප්පාද ධර්මය බව අපි කලිනුත් සඳහන් කළා. ඒ අනුවත් අපට හිතාගන්න පුළුවනි, මේ පටිච්ච සමුප්පාද ධර්මය අර විදියට අතීතයට දිවීමක් හෝ අනාගතයට පැනීමක් නැතිව මේ වර්තමානය තුළින්ම, පුද්ගලයාගේ සන්තානය තුළ නිරන්තරව පවතින විඤ්ඤාණ - නාමරූප සම්බන්ධතාව තුළින්ම මේ පටිච්චසමුප්පාද ධර්මයේ රහස මතුකරගන්න පුළුවන් බව. දැන් අපි දන්නවා, කෙසෙල් කඳක හරයක් නැති බව සොයා ගන්න ඒක මුල ඉඳල අගට පට්ට ගහන්න ඕන නැහැ. හොඳට කැපෙන කඩුවක් අරගෙන, මැදින් කැපුවාම, ඒ හරස් කැපුම තුළින් අපට දකින්න පුළුවන් කෙසෙල් කඳක හරයක් නැති බව. ඒ වගේම මේ සංස්කාර කෙසෙල් කඳත් - 'පඤ්ඤාමයං තිඛිණමසිං ගහෙත්වා'[14] අර ප්‍රඥාමය වූ තීක්ෂණ වූ කඩුව අරගෙන, මැදින් කැපුවොත්, ඒකෙ අභ්‍යන්තර ව්‍යුහයෙන් - අභ්‍යන්තර සැකැස්මෙන් - අපට අල්ලගන්න පුළුවනි, 'මේ සංස්කාර ස්කන්ධයේ කිසිම හරයක් නැහැ. අතීතයේ යම් භවයක් තිබුන නම් ඒකෙත් මේ ධර්මතාවමයි. අනාගතයේ යම් භවයක් තියෙනව නම් ඒකෙත් මේ ධර්මතාවමයි, මේ කියන ධර්මතාව මගේ මේ සන්තානය තුළින් සන්දිට්ඨික අකාලික වශයෙන් මම දකිනව කියල අන්න ඒ විදියටයි ආර්යශ්‍රාවකයා පටිච්ච සමුප්පාද ධර්මය පිළිබඳව අර 'සමුදයො' 'සමුදයො' 'නිරොධො නිරොධො' කියන වචන ප්‍රකාශ කරන්නෙ. යං කිඤ්චි සමුදයධම්මං

සබ්බ තං නිරෝධ ධම්මං කියන ඒ ප්‍රත්‍යක්‍ෂය ලබාගන්නෙ.

එතකොට මේ අනුවත් අපට පෙනෙනව මේ සම්මත විවරණ ක්‍රමයෙ යම් යම් අඩුපාඩු තිබෙන බව. ඒ වගේම, තවත් උපමාවක් අපි ගත්තොත්, බුදුරජාණන්වහන්සෙ ඇත්තවශයෙන්ම වෛද්‍යවරයෙක් හැටියට හඳුන්වන බව අපි කලිනුත් සඳහන් කළා. මේක සමහර විට මේ කාලෙ උපමාවක් හැටියට ගන්නත් පුළුවනි. නමුත් දැන් යම්කිසි රෝගියකුගෙ රෝග නිදානය, රෝග තත්ත්වය, වටහා ගැනීමට මේ කාලයේ වෛද්‍ය විශේෂඥයකුට අවශ්‍ය වන්නෙ එක ලේ බිංදුවක්, එක රුධිර පටකයක්, පමණයි. ඒ ලේ බිංදුව, ඒ රුධිර පටකය, අණු දක්නයක් යටට දමල බලනකොට, ශරීරයේ තිබෙන සියලුම විෂබීජ තත්ත්වය, ලෙඩ රෝග තත්ත්වය, එතන පැහැදිලි වෙනව. රෝගියට ඇවිල්ල බලන්නෙයි කියල - 'එහි පස්සික' - පෙන්නන්න වුනත් පුළුවන්. ඊළඟට යම් යම් වමන විරේචන ආදියෙන් රෝගය සුවකළාට පස්සේ, ඔන්න දැන් ඇවිල්ල ලේ පරීක්‍ෂාකරල බලන්න විෂබීජ නැහැ කියල රෝගියාට කියන්න පුළුවන්. අන්න ඒ විදියෙ සන්දිට්ඨික අකාලික ධර්මයකුයි බුදුරජාණන්වහන්සේ දේශනා කළේ. ඒ ලක්‍ෂණය මේ පටිච්ච සමුප්පාද ධර්මයෙ තිබෙන බවයි විශේෂයෙන්ම සැළකිය යුත්තෙ.

ඊළඟට මේ පටිච්ච සමුප්පාද ධර්මය තුළින්ම එන තවත් ප්‍රශ්නයක් තමයි, 'අවිජ්ජා' 'සංඛාර' දෙක අතීතයට දැමීමට හේතුව. මහා නිදාන ආදී ඇතැම් සූත්‍රවල සඳහන් වෙනව මවු කුසක විඤ්ඤාණයක් බැසගැනීම ගැන සාකච්ඡාවක්. එතකොට, එබඳු සාකච්ඡාවක් තියෙන නිසා කෙනෙක් හිතන්න පුළුවන් අපේ මේ පටිච්චසමුප්පාද ධර්මයත් මවුකුසකට එහා ඉඳලයි එන්නේ කියල - නමුත් මේ සාකච්ඡාව දිහා සැළකිල්ලෙන් බැලුවොත් මේ සාකච්ඡාවෙ පරමාර්ථය මොකක්ද කියල විග්‍රහ කරල බැලුවොත් - ඒ විදියෙ නිගමනයකට ඉඩක් නැහැ. මහා නිදාන සූත්‍රයේ[15] බුදුපියාණන් වහන්සෙ ප්‍රශ්නෝත්තර වශයෙන් ආනන්ද ස්වාමීන් වහන්සේට කරුණු පැහැදිලි කිරීමේදි ඒ ස්වාමීන්වහන්සේට ඒත්තු ගන්වන්න උත්සාහ කරන්නෙ මේ විඤ්ඤාණයත් නාමරූපයත් අතර ඇති නිරන්තර සම්බන්ධතාව වෙන එකක් තබා මවුකුසදී පවා පවතින බවයි. මේකෙ ප්‍රශ්නෝත්තර වශයෙන් කොටස් හතරක් තියෙනව. පළමුවෙනි ප්‍රශ්නය:

"විඤ්ඤාණංච හි ආනන්ද මාතුකුච්ඡිං න ඔක්කමිස්සථ අපි නු ඛො නාමරූපං මාතුකුච්ඡිස්මිං සමුච්ඡිස්සථ"

"නොහෙතං භන්තෙ" කියල ආනන්ද හාමුදුරුවෝ ඒකට පිළිතුරුත් දෙනව. ඒ කියන්නේ, බුදුරජාණන් වහන්සෙ විමසන පළමුවෙනි ප්‍රශ්නය කුමක්ද? 'විඤ්ඤාණං ච හි ආනන්ද මාතුකුච්ඡිං න ඔක්කමිස්සථ' - 'ආනන්දය, යම් හෙයකින් විඤ්ඤාණය මවුකුසට බැස ගත්තේ නැත්නම්, 'අපි නු ඛො නාමරූපං මාතු කුච්ඡිස්මිං සමුච්ඡිස්සථ' - නාමරූපය මවුකුසෙහි - 'සමුච්ඡිස්සථ' කියන ඒ වචනය පිළිබඳ නොයෙකුත් අර්ථභේද දක්වනවා, සමහර වචනවල අර්ථ පිළිබඳව නොයෙකුත් මතභේද තියෙනව - නමුත් මෙතන වඩා සහේතුකයි කියල ගන්න පුළුවන්, 'සමුච්ඡිස්සථ' කියන්නේ, අර

උවසිටය ආදී වචනවල තියෙනව ශේෂවීම් අර්ථය. මෙතන, 'මවුකුසේ ශේෂවන්නේද? ඉතිරි වන්නේද?' කියන එකයි. ඒ කියන්නේ, විඤ්ඤාණය මවුකුසට බැස ගන්නෙ නැත්නම්, නාමරූපය මවුකුසෙහි ඉතිරි වන්නේද? ශේෂ වන්නේද? විඤ්ඤාණයේ ආධාරය ඇතිවයි නාමරූපය තියෙන්නෙ. නාමරූපය යම්කිසි තැනක තියෙනව නම් විඤ්ඤාණයටයි වැඩි බලය තියෙන්නේ. විඤ්ඤාණය වැටුනෙ නැත්නම් එතන නාමරූපය රැඳෙන්නෙ නැහැ. ඒකයි මේ යම්කිසි මවුකුසක් පිළිබඳව, කෙනෙකුගෙ මරණ අවස්ථාවෙදි සිහිවිල්ලක් ආවත්, එතනට විඤ්ඤාණය හරියට බැසගත්තේ නැත්නම්, නාමරූපය එතන රඳන්නෙ නැහැ. විඤ්ඤාණයට සාපේක්ෂකවයි නාමරූපය වන්නේ. නාමරූපය කියන්නෙ නිකං ගස් ගල්වල තියෙන දෙයක් නොවෙයි. විඤ්ඤාණයත් එක්කමයි ඒක තියෙන්නෙ. විඤ්ඤාණයෙ ආධාරය නැත්නම් නාමරූපය එතන රැඳෙන්නෙ නැහැ කියන එකයි කියන්නෙ.

එතකොට ඒකට 'නොහෙතං භන්තෙ' - නැතමය, ස්වාමිනි, කියල ආනන්ද ස්වාමීන්වහන්සෙ පිළිතුරු දුන්න. පළමුවෙනි ප්‍රශ්නය ඒකයි. ඊළඟට,

"විඤ්ඤාණං ච හි ආනන්ද මාතුකුච්ඡිං ඔක්කමිත්වා වොක්කමිස්සථ, අපි නු ඛො නාමරූපං ඉත්ථත්තාය අභිනිබ්බත්තිස්සථ" කියල බුදුපියාණන් වහන්සේ විමසනව. ඊට දෙන පිළිතුරත් "නැතමය ස්වාමිනි" කියන එකයි. මොකක්ද ප්‍රශ්නය? ආනන්දය, යම්කිසි විදියකින් විඤ්ඤාණය මවුකුසට බැසගෙන එයින් නික්ම ගියොත්, එයින් ගිලිහී ගියොත් - මවුකුසට බැස්ස, නමුත් එයින් පිටවුනා - එහෙම උනොත්, නාමරූපය ඉත්ථත්වයක් සඳහා උපදින්නේ වෙයිද? උපදිනවද? ඉත්ථත්වය කියන එක අපි කලිනුත් සඳහන් කළා, ඒකෙ විශේෂ අර්ථයක් තිබෙන බව. ඒ ඒ භවයට පුද්ගලයකු ඇතිවෙන කොට 'එතැන' 'මෙතැනක්' වන ආකාරය. ඒ කියන්නේ, කොටින්ම, ජාතියක්, උපපත්තියක් ලබන බවයි, එතන අඟවන්නෙ. එතකොට, විඤ්ඤාණය මවුකුසට බැසගෙන එයින් පිටවෙල ගියොත්, අර නාමරූපය 'ඉත්ථත්වයක්' වශයෙන් මෝරල, 'ඉත්ථත්වයක්' වශයෙන් බිහිවෙන්නෙ නැහැ කියන එකයි. ඒක ඉත්ථත්වයක් බවට පත්වෙන්නෙ නැහැ. ඉත්ථත්වයක් වෙන්න නම් අර දෙකම තියෙන්න ඕන - 'විඤ්ඤාණ' 'නාමරූප' දෙක. ඒකටත් 'නොහෙතං භන්තෙ' කියාපු එකේ හේතුව අපට හිතාගන්න පුළුවන්. "එසේ නැත ස්වාමිනි."

ඊළඟට බුදුපියාණන් වහන්සෙ අසන ප්‍රශ්නය: "විඤ්ඤාණං ච හි ආනන්ද දහරස්සෙව සතො වොච්ඡිජ්ජිස්සථ කුමාරකස්සවා කුමාරිකාය වා අපි නුඛො නාමරූපං වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සථ." ඒ කියන්නෙ. "ආනන්දය යම්කිසි දරුවකුගේ හෝ දැරියකගේ ලාබාල කාලයේදීම විඤ්ඤාණය සිඳී ගියහොත්, අර නාමරූපය වැඩීමට විපුල බවට, මහත් බවට පැමිණෙන්නේද? ඒකටත් ආනන්ද ස්වාමීන් වහන්සෙ දෙන පිළිතුර "නැතමය, ස්වාමිනි" කියන එකයි. අන්න ඊළඟට අර ප්‍රශ්නවලට පිළිතුරු ලබාගත්තට පස්සෙ බුදුපියාණන් වහන්සේ, දැන් ඒකට සාධක සම්පූර්ණ නිසා, නිගමනය දෙනවා:

"කස්මාතිහානන්ද එසෙව හෙතු එසං නිදානං එස සමුදයො එස පච්චයො. නාමරූපස්ස යදිදං විඤ්ඤාණං" "අන්න ඒක නිසා ආනන්ද, මේකමයි හේතුව, මේකමයි නිදානය, මේකමයි සමුදය, මේකමයි ප්‍රත්‍යය නාමරූපයට, එනම් විඤ්ඤාණය." ඒ කියන්නෙ, මෙතන විශේෂයෙන් පෙන්නුම් කරන්නෙ විඤ්ඤාණයේ වැදගත්කම. විඤ්ඤාණ නාමරූප දෙකෙන් වැඩිබර තිබෙන්නෙ විඤ්ඤාණයටයි, නාමරූප මාත්‍රයක් ඇති උනාට මොකද - දැන් අපේ මේ සාකච්ඡාවෙ එක එක ප්‍රශ්නයෙන් හෙළි උනේ - විඤ්ඤාණය නිසයි යම්කිසි මනුස්සක නාමරූපයක් ඇතිවෙන්නෙ, නමුත් විඤ්ඤාණය හරියට බැහැ ගන්නෙ නැත්නම් නාමරූපය එතන රැඳෙන්නෙ නැහැ. ඊළඟට, විඤ්ඤාණය බැහැගෙන ඉන් නික්මිල ගියොත් නාමරූපය 'ඉත්ථත්වයකට පත්වෙන්නෙ නැහැ. වෙන එකක් තබා දරුවෙක් හෝ දැරියක් හැටියට ඉපදුනාට පස්සෙ හෝ ළදරු කාලයේදීම අර විඤ්ඤාණය යම්කිසි ආකාරයකින් සිඳිල ගියොත් නාමරූපය වැඩීමට පත්වෙන්නෙ නැහැ. විපුල බවට පත්වෙන්නෙ නැහැ. ඉතින් එතනින් පැහැදිලි වෙනව විඤ්ඤාණයේ අත්‍යවශ්‍ය බව නාමරූපයේ පැවතීමට.

ඊළඟට බුදුපියාණන් වහන්සේ හතරවැනිව දක්වනව: "විඤ්ඤාණං ච හි ආනන්ද නාමරූපෙ පතිට්ඨං න ලභිස්සථ, අපි නු ඛො ආයතිං ජාතිජරාමරණ දුක්ඛ සමුදය සම්භවො පඤ්ඤායෙථ" ආනන්දය, යම්කිසි විදියකින් - කොයි ආකාරයෙන් ද කියල මෙතන කියවෙන්නෙ නැහැ - යම්කිසි විදියකින් විඤ්ඤාණය නාමරූපයේ ප්‍රතිෂ්ඨාවක් නොලබන්නේ නම්, නැවත ජාතිජරාමරණාදි සංසාර දුඃඛයක් ඇතිවෙනවද? "නැතමය ස්වාමීනි" අන්න එතකොට හතරවෙනිව දක්වන කාරණය ඉතාම වැදගත් වෙනව. එතනින් පෙන්නුම් කරන්නෙ, මේකයි සාංසාරික තත්ත්වය. ඒක නිසා යම්කිසි විදියකින් විඤ්ඤාණය නාමරූපයෙ ප්‍රතිෂ්ඨාවක් ලබාගන්නෙ නැත්නම්, නොපිහිටන ආකාරයක් යම් විදියකින් යොදාගන්න පුළුවන් උනොත්, නැවත සංසාර දුඃඛයක් වන්නෙ නැහැ කියන එකයි. ඒකත් ඉතින් ආනන්ද ස්වාමීන් වහන්සෙ පිළිගන්නව.

ඔන්න එතකොට මේ සාකච්ඡාවෙනුත් අපට පෙනෙනව මනුස්සයක් පිළිබඳ සාකච්ඡාව නිසාම අපට නිගමනය කරන්න බැරි බව අවිජ්ජා - සංඛාර දෙක අතීත කාරණයි කියල. මෙයිනුත් අපට පෙනෙනව විඤ්ඤාණ - නාමරූප දෙකේ ඇති අන්‍යෝන්‍ය සම්බන්ධතාව. දැන් එතකොට ඊළඟට ඇති ප්‍රශ්නය, විඤ්ඤාණය නාමරූපයෙ ප්‍රතිෂ්ඨාවක් නොලබන්නෙ කොහොමද? නොලබන ආකාරය කොහොමද? ඒක සිදුවන්නෙ කොහොමද කියන එකයි.

සංසාරගත පුද්ගලයාගේ විඤ්ඤාණය හැම තිස්සෙම 'පතිට්ඨිත විඤ්ඤාණයක්' මේ විඤ්ඤාණය නාමරූපයේ ප්‍රතිෂ්ඨාවක් ලබන ස්වභාවයක් තියෙනව. මේ දෙක එකටමයි යන්නෙ. ඒක නිසා තමයි අර දීඝනිකායෙ සම්පසාදනීය සූත්‍රයෙ[16] දක්වෙන්නෙ 'දස්සන සමාපත්ති' පිළිබඳ විස්තරයේදී, යම්කිසි දර්ශන සමාපත්තියක් ලබාගන්න කෙනෙක් දකිනවය: "පුරිසස්ස ච විඤ්ඤාණසොතං පජානාති උභයතො අබ්බොච්ඡින්නං ඉධ ලොකෙ පතිට්ඨිතඤ්ච පරලොකෙ පතිට්ඨිතඤ්ච." යම්කිසි පුරුෂයෙකුගේ විඥාන ශ්‍රොතය විඤ්ඤාණ

නමැති දියපහර - දකිනව දෙපසින්ම නොසිඳුන පැවැත්මක් හැටියට. ඒක මෙලොවත් පිහිටල පරලොවත් පිහිටල. අර ප්‍රතිෂ්ඨිත භාවයයි එතනින් පෙන්නුම් කරන්නෙ. සංසාරගත සත්ත්වයාගේ විඤ්ඤාණය මෙලොවත් පරලොවත් පිහිටල. තවත් ඒ වගේම දස්සන සමාපත්තියක් පෙන්නුම් කරනව: 'පුරිසස්ස ච විඤ්ඤාණසොතං පජානාති උභයතො අබ්බොච්ඡින්නං ඉධලොකෙ අප්පතිට්ඨිතඤ්ච පරලොකෙ අප්පතිට්ඨිතඤ්ච' - පුරුෂයෙකුගේ විඥාන ශ්‍රොතය දෙපසින්ම නොසිඳුනු හැටියට, මෙලොවත් නොපිහිටි පරලොවත් නොපිහිටි හැටියට දැනගන්නව. ඒක රහත් විඤ්ඤාණයයි. එතකොට රහතන්වහන්සේගේ විඤ්ඤාණය අප්පතිට්ඨිත විඤ්ඤාණයක්. සංසාරගත පුද්ගලයගෙ විඤ්ඤාණය පතිට්ඨිත විඤ්ඤාණයක්.

ඒක නිසාම තමයි අර සංයුත්සඟියෙ සගාථක වග්ගයෙ[17] ගොධික ස්වාමීන්වහන්සෙ පිළිබඳ ප්‍රවෘත්තියෙදී, ගොධික ස්වාමීන් වහන්සෙ දිවිනසාගත්ත කියල සඳහන් වෙනව. ගෙලකපා ගෙන දිවි නසා ගත්ත නමුත් ඒ මරණ වේදනාව මෙහෙයි කරල ඇත්ත වශයෙන්ම රහත් වෙලයි අපවත්වුනෙ - පිරිනිවන් පෑවෙ. නමුත් මාරය හිතුව මේ සාමාන්‍ය කෙනෙක් කියල. හිතල, විඤ්ඤාණය සොයමින් හැඳුරුන බව බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරල තියෙනව. "අප්පතිට්ඨිතෙන ච භික්ඛවෙ විඤ්ඤාණෙන ගොධිකො කුලපුත්තො පරිනිබ්බුතො" - ගොධික ස්වාමීන්වහන්සෙ අප්පතිට්ඨිත විඤ්ඤාණයකින් පිරිනිවන් පෑව බවත් ප්‍රකාශ කළා. සාමාන්‍ය සංසාරගත පුද්ගලයගෙ විඤ්ඤාණය නිතරම පිහිටලයි තියෙන්නෙ. අර කියාපු සම්බන්ධතාව නිතරම තියෙනව. මෙන්න මේක නිසත් අපට හිතාගන්න පුළුවනි සංසාරගත පුද්ගලයගෙ විඤ්ඤාණයෙ නිතරම ගැටයක් වැටිල තිබෙන බව. මේ විදියට මෙලොවත් පරලොවත් සම්බන්ධ කරල වගේ එක්තරා විදියක සම්බන්ධතාවකින්මයි තියෙන්නෙ. මෙතන එතකොට වැටිච්ච ගැටයක් ලිහනව මිසක් අමුතුවෙන් ගැට ගහන්න දෙයක් නැහැ. නමුත්, විශේෂයෙන්ම, දැන් ඔය පටිසන්ධි විඤ්ඤාණය ගැන කියනව නම්, මෙකල බොහෝවිට අපට ඒ වචනෙ පාවිච්චි නොකර බැරි තරමට බහුල ව්‍යවහාරයෙ තියෙනව. ඒ කියන්නෙ චුති විඤ්ඤාණයකට පස්සෙ පටිසන්ධි විඤ්ඤාණය ඇති වෙනව කියල. වෙන එකක් තබා ජාතක කථාවක්වත් විස්තර කරන්න බැහැ 'පටිසන්ධි' කියන වචනය නැතිව. නමුත් ඇතැමුන් ප්‍රශ්න කරනව මේ තරම් මේ වැදගත් හැටියට සලකන 'පටිසන්ධි' කියන වචනය සූත්‍ර දේශනාවල නැත්තෙ මක්නිසාද කියල. බුදුරජාණන් වහන්සේ කොතෙකුත් අවස්ථාවල මව්කුසට බැස ගැනීම පිළිබඳ කාරණය සඳහන් කරනව, නමුත් ඒකට 'ඔක්කන්ති' ගබ්භස්ස අවක්කන්ති' 'උපපත්ති' ආදී වචන යොදනව මිසක් 'පටිසන්ධි' කියල වචනයක් යොදන්නෙ නැහැ.

මේ 'පටිසන්ධි' කියන වචනයෙ තේරුම මොකක්ද? මේක භව දෙකක් ගැට ගහනව වගේ, චුතියෙන් පස්සෙ පටිසන්ධියක්. දැන් අපි කිව්ව අර නළකළාප උපමාවෙදී. විඤ්ඤාණ බටකෝටු මිටිය ඇද්දහම නාමරූප බටකෝටු මිටිය වැටෙනව කියල. නාමරූප බටකෝටු මිටිය ඇද්දාම විඤ්ඤාණ බටකෝටු මිටිය වැටෙනව කියල. ඔය විදියෙ අඤ්ඤමඤ්ඤ පච්චය සම්බන්ධතාවක්

තිබෙන බව. නමුත් මේ අඤ්ඤමඤ්ඤ පච්චය සම්බන්ධතාව පිළිගන්න අතරම, මේ ගැටගැහීමක් කරන්නෙ මොකද කියන ප්‍රශ්නයකුත් එනව. මක්නිසාද? අර උපමාව මෙතෙන්ට ගත්තොත්, චුති චිත්තය වැටෙන කොට පටිසන්ධි චිත්තය කෙළින් වෙනව. හරියට බට මිටි දෙකෙන් එකක් ඇද්දහම අනික කෙළින් වෙනව වගේ. මේක අඤ්ඤමඤ්ඤ පච්චය ධර්මතාවට විරුද්ධයි. මෙතන අකාලික බවක් නැහැ. අන්න ඒක නිසා මෙතන මේ පටිසන්ධි කියන වචනයත් කල්පනාකර බැලිය යුතු තැනක්. සංසාරගත සත්ත්වයාගේ සන්තානය නිතරම ගැට ගැහිලයි තියෙන්නෙ. 'අනොකාජ්ටා බහිජ්ටා වශයෙන්, විඤ්ඤාණ නාමරූප දෙක අතර ඒ සම්බන්ධතාව. මරණ අවස්ථාවේදී සිදුවෙන්නෙ කුමක්ද කියන එක ගැඹුරු ප්‍රශ්නයක් හැටියට දක්වනව. නමුත් කල්පනාකාරීව සූත්‍ර දේශනා අනුව බලනවනම් අපට පටිච්ච සමුප්පාද ධර්මයම මේක තුළින් දකින්න පුළුවනි.

මේ පතිට්ඨිත විඤ්ඤාණයත් අප්පතිට්ඨිත විඤ්ඤාණයත් පිළිබඳව කල්පනා කරල බලනකොට - දැන් අපි කලින්ම කිව්ව, එතනත් මෙතනත් අතර සම්බන්ධතාව ගැන. 'ඉත්ථත්වය' කියන වචනය අපට හම්බ උනා. 'ඉත්ථත්ත' 'ඉත්ථභාව' කියන එක. 'මෙසේ බව' කියල අපි ඒකට වචනයක් යොදා ගත්ත. ඊළඟට ඉත්ථභාවයත් සමඟම අඤ්ඤථාභාවයක් තියෙනව කියල. ඒ කියන්නෙ, යම්කිසි තැනක ඉත්ථභාවයක් ඇති උනානම්, ධර්මතා වශයෙන්ම, මෙන්න මේක අහවල් දෙයක් කියල කිව්ව නම්, එතන ඉඳලයි පටන්ගන්නෙ අර විපරිණාමය - වෙනස් වෙන්නට පටන් ගන්නෙ. ඉත්ථභාව - අඤ්ඤථාභාව දෙක එකකොට ඇඳුනු පද. ඉත්ථභාවය යම්තැනකද, අඤ්ඤථාභාවයත් එතැනමයි. එතකොට මේ විදියට ඉත්ථභාවයක් නිසාම, ඉත්ථභාවයක් ඇති තැනක් වෙන කොට, ඒ එක්කම අඤ්ඤථාභාවයක් ඇතිවන නිසා, එතැනක් ඇති තැනක හැමකිස්සෙම මෙතැනකුත් තියෙනව. මෙතැනක් ඇති තැනක හැමකිස්සෙම එතැනකුත් තියෙනව. ඔන්න ඔය විදියයි සංසාරගත පුද්ගලයාගේ විඤ්ඤාණයේ ක්‍රියා කාරීත්වය. දැන් එදිනෙදා ජීවිතය ගැන කල්පනා කරල බලන කොට, දැන් සවිඤ්ඤාණක කය කියල කියන්නෙ, විඤ්ඤාණය සහිත කයයි. මේ කය ඇත්ත වශයෙන්ම අපේ දෙයක් හැටියටයි අපි සාමාන්‍යයෙන් සලකන්නෙ. එපමණක් නොවෙයි, අපට අරමුණු කරගන්න පුළුවන් බාහිර තියෙන ඇහැට නොපෙනෙන දේවල්. හිතින් හිතල ගන්න දේවල් අරමුණු කරගන්න පුළුවනි. ඒක නිසා තමයි, "ඉමස්මිං ච සවිඤ්ඤාණකෙ කායෙ බහිද්ධා ච සබ්බනිමිත්තෙසු, අහංකාර මමංකාර මානානුසයා න හොන්ති[18] ආදී වශයෙන් සඳහන් වෙන්නෙ. එයින් හැඟෙන්නෙ යම්කිසි කෙනෙකුට අහංකාර මමංකාර මානානුසයක් ඇතිකරගන්න පුළුවන් මේ සවිඤ්ඤාණක කය පිළිබඳවත් බැහැර සියලු නිමිති පිළිබඳවත්. මෙන්න මේ කාරණය පිළිබඳව අපි ටිකක් කල්පනා කරල බැලුවොත්, මේ විඤ්ඤාණයත් නාමරූපයත් අතර සම්බන්ධතාව ගැන යම්කිසි අමුතු දෙයක් අපට මතුකරගන්න පුළුවනි. දැන් මේ තමන් ළඟ නැති, ඉතාමත්ම ඈත සිටින යම්කිසි පුද්ගලයකු පිළිබඳ විශේෂ ඇල්මක් ඇතිව, කෙනෙක්, බර කල්පනාවක යෙදිල ඉන්න කොට - ඒ කල්පනාව ටිකක් 'බර' එකක් වෙන්න ඕන - එතකොට සමහරවිට තමන්ගෙ ශරීරයට වේදනාවක් දැනුනත්, මැස්සෙක් මදුරුවෙක් වැහුවත්,

එහෙම නැත්නම් කවුරු හරි ඇවිල්ල ඇඟෙන් අල්ලල හොල්ලුවත්, දැනෙන්නෙ නැති තරම් ඒ කල්පනාවෙ නිමග්න වෙලා ඉන්නෙ. ඒ මක්නිසාද? සාමාන්‍යයෙන් විඤ්ඤාණයට අයිති තැන මේ කයයි. නමුත් තාවකාලිකව ගිහිල්ල අර නාමරූප අරමුණේ - අර බැහැර අරමුණේ - එකතුවෙලයි තියෙන්නෙ. නමුත් අවදිකරල ගන්න පුළුවන්. මෙන්න මේ විදියට හිතේ ගතිය පිළිබඳව, ගමන් කිරීම පිළිබඳව - පැහැදිලි අවබෝධයක් නැති නිසයි මේ 'පටිසන්ධි' ගැට ගැසීමක් අවශ්‍ය වෙල තියෙන්නෙ. සාමාන්‍යයෙන් මේ කයේ ගමන වගේ දෙයක් නොවෙයි මේ හිතේ ගමන. කයේ ගමන නම් එකතැනක් අතහැර නව තැනකට යාම. නමුත් හිතේ ගමන ඒ විදියෙ දෙයක් නොවෙයි. අර දියසුළියක වගේ එක්තරා ආවර්තයක් - පරාවර්තනයක්. ඒ කියන්නෙ, හරියට අර රබර් පටියක වගේ, ඒක මිත අතකට අදින්න පුළුවන්. දික් ආකාරයට හරි, වෙනත් ආකාරයකට හරි. ඒ විදියෙ එක්තරා පරාවර්තියක් තියෙන්නෙ. නාමරූප - විඤ්ඤාණ දෙක අතර එක්තරා ආවර්තියක්. අන්න ඒ ආවර්තිය නිසා තමයි, ඒ විදියෙ අර කවාකාර ස්වභාවය නිසා - එහෙම නැත්නම් ආරුක්කු ස්වභාවය වෙන්නත් පුළුවන් අවස්ථානුකූලව - අර විඤ්ඤාණ නාමරූප දෙක එක්කො ඈතට යන්න පුළුවන් එහෙම නැත්නම් මෑතට එන්න පුළුවන්.

එතකොට මේ කියාපු අවස්ථාවේදි අර පුද්ගලයට කලින් තිබුන 'ඈත' දැන් 'මෑතක්', 'මෑත' 'ඈත' වෙලා. කලින් 'එතන' කියල පටන් ගත්තෙ කල්පනා කරන්න. ඊළඟට 'එතන' 'මෙතන' උනා, 'මෙතන' "එතන" උනා. ඔන්න ඔතනින් පෙනෙනව සංකල්පවල තියෙන එක්තරා සියුම් වටිනා කමක්, මේ පටිච්චසමුප්පාදය ආදී ධර්ම තේරුම් ගැනීමේදී. මේ සංකල්පවල තියෙනව එක්තරා විධියක සාපේක්ෂ බවක්. මේ කාලයේ යොදන දාර්ශනික ව්‍යවහාරයක් ගන්නව නම් - 'සාපේක්ෂ' එකක් අනික අපේක්ෂාකරන ස්වභාවයක් තියෙනව. අර 'ඉපැවතාව' 'අස්සුදුවතාව' කියල කිව්වෙත් ඒකයි. ඉපැවතාවයත් එක්කම අස්සුදුවතාවයත් එනව. ඇලුත්තක්. එකක් ඇදල ගන්න කොට අනික් එකත් එනව. අර ජාති - ජරාමරණ ගැන එහෙමත් කිව්වෙ ඒ කාරණයමයි. ඒ විධියටම මේ විඤ්ඤාණ නාමරූප දෙකේ නිතරම කවාකාර ගමනක් තියෙන්නෙ. එතකොට ශරීරයේ ගමන වගේ දෙයක් නොවෙයි මෙතන තියෙන්නෙ. හිත යනව, හිත ගියාට මොකද ඒක රැඳෙන්නෙ විඤ්ඤාණයෙ. විඤ්ඤාණයට තමයි වැඩිබර තියෙන්නෙ. බර කල්පනාවක වැටුන කියල කියන්නෙ විඤ්ඤාණයත් අතනට ගිය නිසයි. විඤ්ඤාණයටයි වැඩි බර තියෙන්නෙ. කලින් දැක්වූ, බුදුපියාණන් වහන්සෙගෙ ධර්ම සාකච්ඡාවෙනුත් ඒක හෙළිවෙනව, මවුකුසක උනත් විඤ්ඤාණය බැසගත්තෙ නැත්නම් නාමරූපය එතන රැඳෙන්නෙ නැහැ. විඤ්ඤාණය එකතු වෙලා ඉඩ දුන්නෙ නැත්නම් වැඩෙන්නෙ නැහැ. ඔය විදියෙ තත්වයක් තියෙන්නෙ. සමහර කථානතර අහන්න ලැබෙනව, ජීවයේ සත්‍යාසත්‍යතාව කෙසේ වෙතත් ඇතැම් සිද්ධි පිළිබඳව අසන්ට ලැබෙනව, මරණාසන්න අවස්ථාවේදි - අර 'පණ අදිනව' කියල කියන්නෙ - ඒ විධියෙ අවස්ථාවලදි ඒ මරණාසන්න පුද්ගලයට පිටත ඉඳල තමන්ගෙ ශරීරය දකින්න පුළුවන් තත්වයක් ඇතිවුන බව කියවෙනව. මේ ධර්මතාව අනුව බලන කොට ඒක නිතාගන්න පුළුවනි. ඒ

කියන්නෙ, ඒ විඤ්ඤාණය රැඳෙන්න පුළුවන් ශක්තියක් ඇති, සතරමහා භූතයින්ගෙන් නව ශරීරයක් හදන්න පුළුවන් ශක්තියක් ඇති, නැතක් නොවෙන්න පුළුවනි. නමුත් තාවකාලිකව බැහැර ගිහිල්ල, අතනට ගිහිල්ල, ආපසු ශරීරයට එන්දෝ නොඑන්දෝ කියල හිත හිතා ඉන්නව වගේ අවස්ථාවල තමයි තමාගේ ශරීරයම තමාට පේන්නෙ. ඒ විදියෙ අවස්ථාවලුත් තියෙනව. එතකොට සිත පිළිබඳ ධර්මතාවක් මෙතන තියෙන්නෙ. මේ විදියට ගන්නාම අමුතුවෙන් මෙතන ගැටගසන්න දෙයක් නෑ. මක්නිසාද, මේ දියසුළියමයි දිගට යන්නෙ.

මේ සංසාර දියසුළියෙ එතන මෙතන වෙනව, මෙතන එතන වෙනව. ඈත මෑත වෙනව, මෑත ඈත වෙනව. ඔය විදියෙ ස්වභාවයක් තියෙන නිසා තමයි සංසාරගත පුද්ගලයාගේ විඤ්ඤාණය නිතරම 'පතිට්ඨිතව' තිබෙනව කියන්නෙ. මේකෙ එක්තරා විදියක දෙබිඩි ස්වරූපයක් තියෙනව. යම් අවස්ථාවක විඤ්ඤාණය සම්පූර්ණයෙන්ම මේ ශරීරය අතහැර ගියා නම් අන්න අර කලින් ගත්ත නාමරූප අරමුණෙමයි රැඳෙන්නෙ. ඒ කියන්නෙ, යම්කිසි මවුකුසක උත්පත්තියක් ලබනව කියන කොට බුදුපියාණන් වහන්සේට අමුතු වචනයක් ඕන උනෙ නැත්තෙ ඒකයි. විඤ්ඤාණයෙ අරමුණ නාමරූපයයි. එතකොට, විඤ්ඤාණය නිසාමයි ඒකට නාමරූප කියන නමක් දෙන්න පුළුවන් වන්නෙ. හරියට විඤ්ඤාණයෙ වැටෙන ඡායාව වගෙයි. නාමරූපය ඡායාව වගෙයි. දැන් ඡායාරූපයක් ගැනීමේදීත් ඒ විදියෙ ධර්මතාවක් තියෙන්නෙ. ඡායාරූපයට හැඩවැඩ දමල මූන දුන්නත් නැතත්, ඒකට පිටුපෑවත්, ඒ රූපය කෙසේ වෙතත් ඡායාවවත් වැටෙනව. ඒ වගේම, සංසාරගත පුද්ගලයගෙ, වෙන එකක් තබා චේතනා ප්‍රකල්පන වශයෙන් සිහිවිලි කල්පනා ආදිය නැති උනත්, අනුසය මාත්‍රයවත් තියෙනව නම්, ඒ අනුසයම ප්‍රමාණවත් වෙනව යම්කිසි භවයක උත්පත්තියක් ලැබීමට. අන්න ඒක නිසා තමයි බුදුපියාණන් වහන්සෙ දේශනා කරල තියෙන්නෙ චේතනා සූත්‍රය කියල වැදගත් සූත්‍රය සංයුක්ත සඟියෙ, නිදාන සංයුත්තයෙ:[19]

"යඤ්ච භික්ඛවෙ චෙතෙති යඤ්ච පකප්පෙති යඤ්ච අනුසෙති, ආරම්මණං එතං හොති විඤ්ඤාණස්ස ඨිතියා. ආරම්මණෙ සති පතිට්ඨා විඤ්ඤාණස්ස හොති. තස්මිං පතිට්ඨිතෙ විඤ්ඤාණෙ විරූළ්හෙ නාමරූපස්ස අවක්කන්ති හොති. නාමරූප පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සො ආදී වශයෙන් ඒ සූත්‍රයේ කොටස් තුනක් දක්වෙනව.

පළමුවෙනි ඡේදයෙ තියෙන්නෙ: 'යඤ්ච භික්ඛවෙ චෙතෙති, යඤ්ච පකප්පෙති. යඤ්ච අනුසෙති' - මහණෙනි, යමෙක් යම් චේතනාවල් පවත්වනවද, චේතනාවල් ඇතිකරගන්නවද, යම් ප්‍රකල්පන - කල්පනා කියන එක අපට හිතාගන්න පුළුවන් - යම් කල්පනා ඇතිවෙනවද, 'යඤ්ච අනුසෙති' ඒ වගේම අනුසය වශයෙනුත්, ඒ කියන්නෙ අප්‍රහීන වශයෙන් රූප වේදනා ආදී ඒ උපාදානස්කන්ධ පිළිබඳ ඇල්ම එහෙම පවතිනවද අනුසය වශයෙන්, එතකොට, චේතනා, ප්‍රකල්පන, අනුශය කියන ධර්ම ඇතිනාත්, 'ආරම්මණං එතං හොති විඤ්ඤාණස්ස ඨිතියා' - ඒ තුනෙන් කවරක් හෝ විඤ්ඤාණයේ සිට ගැනීමට - පැවැත්මට - අරමුණක් වෙනව. 'ආරම්මණෙ සති පතිට්ඨා විඤ්ඤාණස්ස

හොති - අරමුණක් ඇති කල්හි විඤ්ඤාණයේ පිහිටීමක් වෙයි. 'තස්මිං පතිට්ඨිතෙ විඤ්ඤාණෙ විරූළ්හෙ' - එසේ ඒ පිහිටි විඤ්ඤාණය වැඩුනු කල්හි, 'නාමරූපස්ස අවක්කන්ති හොති' - නාමරූපයාගේ බැසගැන්ම වෙයි. 'නාමරූපපච්චයා සළායතනං .......' ඊළඟට නාමරූපය ඇති උනාම අනිත් ඒව ඒ එක්කම යනව. පළමුවෙනි කොටසෙ ඒ විදියට සඳහන් වෙනව.

දෙවෙනි කොටසෙ සඳහන් වෙනව: 'නො චෙ භික්ඛවෙ චෙතෙති, නො ච පකප්පෙති, අථ චෙ අනුසෙති, ආරම්මණං එතං හොති විඤ්ඤාණස්ස ඨිතියා. ආරම්මණෙ සති පතිට්ඨා විඤ්ඤාණස්ස හොති, තස්මිං පතිට්ඨිතෙ විඤ්ඤාණෙ විරූළ්හෙ නාමරූපස්ස අවක්කන්ති හොති' ආදි වශයෙන්. මේ දෙවෙනි ඡේදයෙ විශේෂත්වය මොකක්ද? 'නො චෙ චෙතෙති' - යම්කිසි පුද්ගලයෙක් චේතනා පවත්වන්නෙ නැහැ. මරණ අවස්ථාව ගැන කියනකොට, චේතනා පවත්වන්නෙ නැහැ. අමුතු කල්පනාවල් නැහැ. නමුත් අනුශය තියෙනව. 'ආරම්මණං එතං හොති විඤ්ඤාණස්ස ඨිතියා' යටත් පිරිසෙයින් අනුශය තිබුනත්, ඒත් ඇති. අන්න අපි කියපු ඡායාරූපයට පිටිපැවත් එකත හිටිය නිසා ඡායාරූපයට වැටුන වගේ, අනුශය තිබුනත් ඇති. එතකොට ඒක අරමුණක් වෙනව. ඒක නිසාම විඤ්ඤාණය පිහිටනව. ඊළඟට කියැවෙනව: යතො ච ඛො භික්ඛවෙ 'නො චෙව චෙතෙති, නො ච පකප්පෙති, නො ච අනුසෙති, ආරම්මණං එතං න හොති විඤ්ඤාණස්ස ඨිතියා, ආරම්මණෙ අසති පතිට්ඨා විඤ්ඤාණස්ස න හොති තදප්පතිට්ඨිතෙ විඤ්ඤාණෙ අවිරූළ්හෙ නාමරූපස්ස අවක්කන්ති න හොති නාමරූපනිරෝධා සළායතන නිරෝධො.......... එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරෝධො හොති'

මේ තුන්වෙනි එක විශේෂයි. මුලින් කියාපු අවස්ථා දෙකෙන් පළමු එකේ චේතනා, ප්‍රකල්පන, අනුශය තිබුන. දෙවෙනි අවස්ථාවෙ චේතනා ප්‍රකල්පන දෙක නැහැ. ඒ පුද්ගලයට, නමුත් අනුශය තිබුන. තුන්වෙනි අවස්ථාවෙදි චේතනාවකුත් නැහැ, ප්‍රකල්පනයකුත් නැහැ, අනුශයකුත් නැහැ. අන්න එබඳු අවස්ථාවක, 'ආරම්මණං එතං න හොති විඤ්ඤාණස්ස ඨිතියා' - එතකොට අරමුණක් නැහැ විඤ්ඤාණයට සිට ගැනීමට. 'ආරම්මණෙ අසති පතිට්ඨා විඤ්ඤාණස්ස න හොති' - අරමුණක් නැති කල්හි විඤ්ඤාණයේ පිහිටීමක් නොවේ. 'තදප්පතිට්ඨිතෙ විඤ්ඤාණෙ අවිරූළ්හෙ' - විඤ්ඤාණය නොපිහිටි කල්හි, නොවැඩුනු කල්හි, නාමරූපයාගේ බැසගැනීමක් නොවන්නේය. එහෙම නාමරූපයාගේ බැසගැනීමක් නැත්නම් අර 'නාමරූප නිරෝධා සළායතන නිරෝධො' ආදි වශයෙන් සියල්ලම නිරුද්ධ වෙල ගිහිල්ල සියලු සංසාර දුඃඛයම එතනම කෙළවර වෙනව.

## අධෝලිපි

1. පාතාල සූ. සං. නි. 392 පිට (බු. ජ. 16)
2. ධම්මචක්කප්පවත්තන සූ. සං. නි. V (2) 270 පිට (බු. ජ. 17 - 2)
3. - එම -
4. විභඞ්ග සූ. මහා වග්ග, සං. නි. V (1) 352 පිට (බු. ජ. 17)
5. මහා. 84 පිට (බු. ජ. 3)
6. උපසීව සූ. සු. නි. 330 පිට (බු. ජ. 25)
7. මහාපදාන සූ. දී. නි. II 46 පිට (බු. ජ. 8)
8. නළකලාප සූ. නිදාන වග්ග සං. නි. II 180 පිට (බු. ජ. 14)
9. ම. නි. 1-462 පිට (බු. ජ. 10)
10. සං. නි. II 106 පිට (බු. ජ. 14)
11. වි. ම. පඤ්ඤාභූමි නිද්දේස (හේ. මු.) 436 පිට
12. සු. නි. 334 පිට (බු. ජ. 25)
13. ම. නි. I 18 පිට (බු. ජ. 10)
14. කාළුදායිත්ථෙරගාථා, ථෙර, 250 පිට (බු. ජ. 28)
15. දී. නි. II 92 පිට (බු. ජ. 8)
16. දී. නි. III 176 පිට (බු. ජ. 9)
17. ගොධික සූ. සං. නි. I - 222 පිට (බු. ජ. 13)
18. මහාපුණ්ණම සූ. ම. නි. III 120 පිට (බු. ජ. 12)
19. දුතිය චේතනා සූ., සං. නි. II 102 පිට (බු. ජ. 14)

# වෙනත් කෘති

1. Concept and Reality in Early Buddhist Thought -(1971)*
2. Samyutta Nikaya - AnAnthology, Part II - Wheel No, 183/185 -(1972)*
3. Ideal Solitude - Wheel No, 188 - (1973)*
4. The Magic of the Mind - (1974)*
5. උත්තරීතර හුදෙකලාව -'දම්සක්' අංක 172/173 - (1990)*
   -එම- (නව මුද්‍රණය), ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය (2001)
6. Towards Calm and Insight - (1991)
7. විදසුන් උපදෙස් - (1996)
8. නිවනේ නිවීම - (1997-2004)
   -ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය, මහා භාරකාර දෙපාර්තමේන්තුව
   (සම්පූර්ණ පොත වෙළුම් 11 කින් නිකුත් වී ඇත.)
9. From Topsy - turvydom to Wisdom -Volume 1 - (1998)
   (Essays written for 'Beyond the Net, - A website on the Internet
   - Website address http:// www.beyond thenet.net)
10. පහන් කණුව ධර්ම දේශනා - 1- වෙළුම - (1999)
11. Seeing Through - (1999)
12. හිතක මහිම - 1 - (1999)
13. නිවනේ නිවීම - ප්‍රථමභාගය - (1-6 වෙළුම්) - පුස්තකාල මුද්‍රණය (2000)
14. හිත තැනීම - (2000)
15. පහන් කණුව ධර්ම දේශනා - 2 වෙළුම - (2000)
16. Towards A Better World -Translation of 'Lo-wada-Sangarava' - (2000)
17. පැවැත්ම හා නැවැත්ම - (2000)
18. ඇති හැටි දැක්ම - (2001)
19. පහන් කණුව ධර්ම දේශනා - 3 වෙළුම - (2001)
20. දිවි කතරේ සැඳෑ අඳුර - (2001)
21. කය අනුව ගිය සිහිය - (2001)
22. මා-පිය උවැටන - (2002)
23. ප්‍රතිපත්ති පූජාව - (2003)
24. Nibbana - The Mind Stilled - Volume I - (2003)
25. පහන් කණුව ධර්ම දේශනා - 4 වෙළුම - (2003)
26. අබිනික්මන - (2003)
27. හිතකමහිම - 2 - (2003)
28. පහන් කණුව ධර්ම දේශනා - 5 වෙළුම (2005)
29. පහන් කණුව ධර්ම දේශනා - 6 වෙළුම (2006)
30. Nibbana - The Mind Stilled - Volume II - (2005)
31. Nibbana - The Mind Stilled - Volume III - (2005)
32. Nibbana - The Mind Stilled - Volume IV - (2006)

* Buddhist Publication Society, P.O. Box, 61, Kandy
බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය, තැ.පෙ. 61, මහනුවර

# ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පළකරන ලද ග්‍රන්ථ

| | ග්‍රන්ථ නාමය | | පිටපත් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01. | නිවනේ නිවීම | පළමු වෙළුම | 11000 |
| 02. | නිවනේ නිවීම | දෙවන වෙළුම | 8000 |
| 03. | නිවනේ නිවීම | තෙවන වෙළුම | 5000 |
| 04. | නිවනේ නිවීම | සිවුවන වෙළුම | 6000 |
| 05. | නිවනේ නිවීම | පස්වන වෙළුම | 5000 |
| 06. | නිවනේ නිවීම | සයවන වෙළුම | 3500 |
| 07. | නිවනේ නිවීම(පුස්තකාල මුද්‍රණය) | ප්‍රථම භාගය(1-6 වෙළුම්) | 500 |
| 08. | නිවනේ නිවීම | සත්වන වෙළුම | 3000 |
| 09. | නිවනේ නිවීම | අටවන වෙළුම | 3000 |
| 10. | නිවනේ නිවීම | නවවන වෙළුම | 3000 |
| 11. | නිවනේ නිවීම | දසවන වෙළුම | 3000 |
| 12. | නිවනේ නිවීම | එකොළොස්වන වෙළුම | 3000 |
| 13. | පහන් කණුව ධර්ම දේශනා | පළමු වෙළුම | 9000 |
| 14. | පහන් කණුව ධර්ම දේශනා | දෙවන වෙළුම | 8000 |
| 15. | පහන් කණුව ධර්ම දේශනා | තෙවන වෙළුම | 6000 |
| 16. | පහන් කණුව ධර්ම දේශනා | සිවුවන වෙළුම | 7000 |
| 17. | පහන් කණුව ධර්ම දේශනා | පස්වන වෙළුම | 3000 |
| 18. | පහන් කණුව ධර්ම දේශනා | සයවන වෙළුම | 4000 |
| 19. | 'හිතක මහිම' | පළමු වෙළුම | 6000 |
| 20. | 'හිතක මහිම' | දෙවන වෙළුම | 3000 |
| 21. | උත්තරීතර හුදෙකලාව | | 8000 |
| 22. | විදසුන් උපදෙස් | | 5000 |
| 23. | චලන චිත්‍රය | | 3000 |
| 24. | Towards A Better World | | 3000 |
| 25. | Seeing Through | | 3000 |
| 26. | Nibbana - The Mind Stilled | Volume I | 3000 |
| 27. | Nibbana - The Mind Stilled | Volume II | 3000 |
| 28. | Nibbana - The Mind Stilled | Volume III | 3000 |
| 29. | Nibbana - The Mind Stilled | Volume IV | 1000 |

නැවත මුද්‍රණය කරවීම පිළිබඳ විමසීම් :-
ජී. ටී. බණ්ඩාර, ස්ථාපක, ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය
රෝයල් ඉන්ස්ටිටියුට්, 191, හැව්ලොක් පාර, කොළඹ 5.
දු.ක. - 0112-508173, 2592747 - 48